ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



03
දෝෂාභියෝග විනිශ්චයනට අභියෝග කිරීම එදා සහ අද



07
බිළිඳෙක්, ප්‍රඥාවන්තයින් සහ තරුවක්



08
ශාස්ත්‍රවන්තයන් සොයාගෙන ගිය තාරකාව කුමක් ද?

භාග්‍යවත් ජුසේවාස් මුනි මංගල්‍යය
ජනවාරි 16 දා



# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07

ක්‍රි.ව. 2013 ක් වූ ජනවාරි 06 ඉරිදා 147 වෙළුම 31 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/51/NEWS/2013 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## සුබ නව වසරක් වේවා!



සිසිලස සුළඟක සුවහස මුසු වී සැම හදවත් විකසිත වේවා
නව වසරට සුබ පැතුම් පතන්නට සුපසන් සිතිවිලි බිහි වේවා
ආදර කරුණා පෙමින් පිරීතිරී නව යුගයක ආසිරි වේවා
මෙත් සිත් වඩමින් භේද දුරලමින් සාමය සැම තැන රජ වේවා

**සිතිවිල්ල - පමුණුගම බෙනී ජයමාන්න**

## භාග්‍යවන්තයන් නම් සාමය උදාකරන්නෝ ය

### 44 වැනි ලෝක සාම දින පණිවුඩයෙන් සසුන් පියා ප්‍රකාශ කරයි

**අපේ පවුල් අතර, අසල්වැසියන් අතර, නෑදෑ හිතවතුන් සහ රට වැසියන් අතර මෙන්ම විශ්වීය මිනිස් පවුල තුළ ප්‍රේමය, විශ්වාසය සහ සාමය අත් නොදකින්නේ නම් අප සෑම සියලු දෙනාට ඒ සඳහා කටයුතු කිරීමේ වගකීමක් පැවරී ඇත්තේ යැයි අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ප්‍රකාශ කරයි.**

2013 ජනවාරි 01 දිනට යෙදුනු ජගත් සාම දිනය නිමිත්තෙන් පණිවුඩයක් නිකුත් කරමින් සසුන් පියා මේ බැව් පළ කළේය. මෙවර එහි තේමාව "භාග්‍යවන්තයන් නම් සාමය උදාකරන්නෝ ය" යන්නයි. වර්ෂ 1968 දී අති උත්තම සය වැනි පාවුළු ශුද්ධෝත්තම පියතුමා ජනවාරි 01 දින ලෝක සාම දිනය අළලා පණිවුඩයක් ආරම්භ කළ අතර ඒ අනුව මෙවර 44 වැනි ලෝක සාම දින සසුන් පිය පණිවුඩය නිකුත් කරන ලදි.

සාමය ගොඩ නැගීමට ඇප කැපවීම අපගේ යුගයේ යුතුකම බැවින් කිතුනුවන් සැබෑ භාග්‍යවන්තයන් වීමට සාමය උදාකරන්නන් විය යුතු බැව් සසුන් පියා අවධාරණය කරයි. (සසුන් පිය සාම පණිවුඩය ලබන ප්‍රදීපයෙන් බලාපොරොත්තු වන්න)

# ගංවතුර මැද්දේ මනුස්සකම උතුරා දෝරේ ගලයි

## "පරිත්‍යාගශීලි නත්තල" කිතුනුවෝ ඉහළින්ම සමරති

ගරු නිරෝෂන් ශ්‍රීකාන්ත පියතුමන් විසිනි

**හලාවත රදගුරු වසමේ ප්‍රදේශ ගණනාවක් ඉකුත් මහ වැසි හේතුවෙන් ගංවතුර උවදුරින් පීඩාවට පත්විය. මානුවම්ගම, දැදුරුඔය, වට්ටක්කල්ලිය ඇතුළු ප්‍රදේශ ගණනාවක් මුළුමනින්ම ජලයෙන් යටවිය.**

විපතට පත් වූ පිරිස් සඳහා ජාතික කරිටාස් ආයතනය, හලාවත කරිටාස් ආයතනය, රදගුරු හිමිපාණන් මෙන්ම මීගමුව හා තදාසන්න පෙදෙස්වල පරිත්‍යාගශීලින් ද "සිරස" මාධ්‍ය ආයතනය ද ක්‍ෂණික සහනාධාර ලබා දීමට යුහුසුළු විය.

හලාවත රදගුරු වසමේ ගංවතුරින් පීඩාවට පත් නොවූ දංකොටුව ඇතුලු ප්‍රදේශ ගණනාවක බැතිමත්හු පීඩාවට පත් ජනතාවට සහන රැගෙන ගියහ.

මේ කටයුතු හේතුවෙන් විපත්පත් ජනතාවට තමන් තනි නොවූ බව හැඟී ගිය අතර ආගම් භේදයකින් තොරව කිතුනු දයා සේවාවේ දැත් දිගුවූ බැව් බොහෝ දෙනෙක් ප්‍රකාශ කළහ. වයෝවෘද්ධ දෙමාපියන්, ගැබිණි මාතාවන් හා ළදරුවන් අත රැඳි මාතාවන් අවතැන් වීමෙන් මහත් අසරණ තත්ත්වයකට පත්ව සිටිය ද, සමහරකගේ ඇඳිවත පමණක් ඉතිරි වුවද සැම දන වෙත දයාව පාන්නට හැකිවීම සුවිශේෂී අවස්ථාවකි.

### දිව්‍ය බිළිඳුණන් රජුන්ට ප්‍රත්‍යක්ෂ වීම



**පෙරදිග දී තරුව දුටු ශාස්ත්‍රවන්තයෝ රජව උපන් උතුමාණන් වැඳීමට ආහ.**
**සිතුවම : මේරියන් කාසිචෙට්ටි**

### "සිරස" පරිත්‍යාගය අති සාර්ථකයි

ගංවතුරෙන් විපතට පත් ජනතාවට රු. කෝටියකට අධික මුදලින් ඉටුකළ "සිරස" සත්කාරක වැඩපිළිවෙල අති ඉහළ ජනතා ප්‍රසාදයට ලක් වී ඇත. නත්තල මුල්කොට ඉටු කරන්නට යෙදුනු සියලු ප්‍රසංග ඒ වෙනුවෙන් පරිත්‍යාගකොට ඉටුකළ සත්කාරය අති සාර්ථකව නිම කිරීමට හැකි වූ බව ප්‍රියන්ත විජේසිංහ මහතා ප්‍රදීපයට පැවසීය.

### කොච්චිකඩේට කෞතුකාගාරයක්

කොළඹ කොච්චිකඩේ සා. අන්තෝනි සිද්ධස්ථානයේ ඉදිවුණු සිරිලක ප්‍රථම හා එකම සා. අන්තෝනි මුනි කෞතුකාගාරය ජනවාරි 13 ඉරිදා සවස 6.30 ට විවෘත කැරේ.

### වත්තල සා. ආනා නුවානය ආරම්භ වේ

2013 ජනවාරි 4 සිකුරාදා ප.ව. 6.00 ට ප්‍රථම නුවානය සමඟ දිව්‍ය පූජාව පැවැත්විණි. මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමාගේ අනුශාසනයෙන්, වත්තල සා. ආනා සමිතිය සංවිධානය කරයි. සෑම සිකුරාදාවකම පැවැත්වෙන මෙම නුවානයට සහභාගි වී සා. ආනා මුනිවරියගේ පිහිට ආශිර්වාදය ලබා ගැනීමට ඔබ සැමට ආරාධනා කරයි.

**(ඩබ්ලිව්. ඇන්ටනි පෙරේරා)**

### කෙටි දේවධර්ම පාඨමාලාව

කොළඹ හා. ජුසේවාස් දේව ධර්ම නිකේතනය "විශ්වාසයේ වසර" වෙනුවෙන් කෙටි දේවධර්ම පාඨමාලා තුනක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඉන් පළමු වැන්න "විශ්වාස ලක්ෂණයේ මූලික තේමා" යන මැයෙන් 2013 ජනවාරි 15 දා සිට අප්‍රේල් මස 30 දක්වා සෑම අඟහරුවාදා දිනකම ප.ව. 4.30 සිට 6.15 දක්වා බොරැල්ල හා. ජුසේවාස් දේව ධර්ම නිකේතන ශාලාවේදී පැවැත්වේ. දේව ධාර්මික දැනුම වර්ධනය කර ගැනීමට උනන්දුව දක්වන ගිහි පැවිදි සැමට විශ්වාසයේ වසරේ මෙම විශේෂ වැඩපිළිවෙලට සහභාගි විය හැකිය.

**නත්තල හා අලුත් අවුරුද්ද වෙනුවෙන් ප්‍රදීප කාර්ය මණ්ඩලය වෙත යොමු කළ සියලු සුබ පැතුම් පත් වලට ප්‍රදීප කාර්ය මණ්ඩලයේ ස්තූතිය සැමට පුද කරමු.**
- සංස්කාරක පියතුමා -

## ගවහලක උපන් ක්‍රිස්තුන් වහන්සේ ලෝක සාමයේ දූතයා වීම භාග්‍යයක්

### මහමෝදර කෝවිල ගොඩැල්ල විහාරයේ පරිවේණාධිපති පූජ්‍ය දනවල ප්‍රියංකර නාහිමිපාණෝ

මංගල ජයවර්ධන විසිනි

"අප ජීවත්වන කෙටි කාලය තුළ විවිධත්වය සොයනවාට වඩා සාමකාමී බව පෙන්වීම ඉතා වැදගත්. අප කුමන ආගමකට අයත් වුවත් පූජක පැවිදි සංඝය වශයෙන් අප පවුරක් ලෙස ශක්තිමත් විය යුතුයි. පවුර බිඳ දැමිය නොහැකි තරමට එහි අභ්‍යන්තරය සුරක්ෂිත වෙනවා. එය සුහදතාවයේ හා ආදර්ශයේ මහා පණිවුඩයක්. මේ ආගමන කාලයේ ක්‍රිස්තුන් වහන්සේගේ උපත සමරන්න සූදානම් වීම සියලු ආගමික සැදැහැවතුන්ට සාමයේ මඟට ස්වර්ණමය පියවරක" යැයි ගාල්ල රදගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ පැවසූහ.



ගාලු දිසාවේ අන්තර් ආගමික උතුමන් ගේ සුහදතාවය වර්ධනය කිරීම හා නත්තල් ප්‍රීතිය බෙදා ගැනීම සඳහා ගාලු පදවි රදගුරු හිමිපාණන් වහන්සේගේ ආරාධනයෙන් පැවැත්වූ සුහද හමුවේ දී උන්වහන්සේ එසේ අනුශාසනා කළහ.

එහිදී අදහස් දැක්වූ මහමෝදර කෝවිල ගොඩැල්ල විහාරයේ පරිවේණාධිපති පූජ්‍ය දනවල ප්‍රියංකර නාහිමිපාණන් වහන්සේ සුහද හමුවට එක් වෙමින්, "නත්තල කියන්නේ බෞද්ධ සැදැහැවතුන් අතරෙත් ප්‍රීතිමත් වචනයක්.

15 පිටුවට

**සියලු ජාතින්ට ගැලවීමේ සහභාගිකම ලැබේ** (එපීස 3:2-6)

## පදවියෙන් පදවියට

# 2013 භාග්‍යවත් ජුසේවාස් මුනි මංගල්‍ය වැඩසටහන්

අප දේශයේ අග්‍රගන්‍ය අපෝස්තුළුවරයාණන් හා අද්විතිය ධර්මධරයාණන් වන භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන්ගේ මංගල්‍යය ජනවාරි 16 වන දිනට යෙදී තිබෙන අතර ඒ වෙනුවෙන් සෑම පදවියකම හා සෑම මීසමකම ජනවාරි 16 වන දින හෝ ඊට පසු යෙදෙන ඉරුදින මංගල්‍යය සැමරීමට පදවි හා මීසම් මට්ටමින් උපදෙස් දී ඇත. ඒ සඳහා ජාතික ජුසේවාස් ලේකම් කාර්යාංශයෙන් විශේෂ සඟරාවක් ජාතික මට්ටමින් ත්‍රෛභාෂිකව නිකුත් කර ඇති අතර, මංගල්‍යය දිනට නියමිත හැඳින්වීම්, යාච්ඤා, දේවවචනය හා විශ්වාසකයින්ගේ යැදුම් ද මෙයට එක්කොට ඇත. සෑම මීසමකට මෙම සඟරාව බෙදා හැර ඇති අතර, ඒ පිළිබඳව පදවිවල ජුසේවාස් කමිටු අධ්‍යක්ෂ පියතුමන්ලාගෙන් තොරතුරු ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමු. ජාතික මට්ටමින් හා රදගුරු පදවි මට්ටමින් මංගල්‍යයන් මෙසේය.

කොළඹ අගරදගුරු පදවිය - පල්ලන්සේන වික්ෂෝප මාතා දේවස්ථානය ජනවාරි 20 වන දින උදේ 8.30 ට (පදවි ප්‍රධානතම මංගල්‍යය), මාකොළ භාග්‍යවත් ජුසේවාස් මුනි දේවස්ථානය ජනවාරි 20 වන දින උදේ 8.30 ට, මොරටු මෝදර භාග්‍යවත් ජුසේවාස් මුනි දේවස්ථානය ජනවාරි 20 වන දින උදේ 8.00 ට, වග මීසමේ, කන්දෙවත්ත භාග්‍යවත් ජුසේවාස් මුනි දේවස්ථානය ජනවාරි 20 වන දින උදේ 8.00 ට, දූව මීසමේ පිටිපන - වීදිය කන්‍යා ශුද්ධ දේවමාතා දේවස්ථානය ජනවාරි 16 වන දින සවස 5.30, කළමුල්ල බිළිඳු ජේසු දෙව්මැඳුර ජනවාරි 20 වන දින උදේ 8.00 ට, ජුසේවාස් දේවධර්ම නිකේතනය ජනවාරි 20 වන දින උදේ 7.30 ට, මෝදර ශාන්ති නිවසේදී.
සැ.යු. - අගරදගුරු වසමේ සෑම මීසමකම, ජනවාරි 20 වන දින මංගල්‍යය සිදුකෙරේ.

මහනුවර රදගුරු පදවිය - ජනවාරි 20 වන දින අම්පිටිය ජාතික ජුසේවාස් සිද්ධස්ථානයේ දී උදේ 7.30 ට ගරු එල්මෝ ඩයස් පියතුමාගේ ප්‍රධානත්වයෙන්

ගාල්ල රදගුරු පදවිය - ජනවාරි 16 වන දින උදේ 9.00 ගාල්ල ආසන දෙව්මැඳුරේ දී ගාලු රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්

හලාවත රදගුරු පදවිය - ජනවාරි 13 වන දින උදේ 7.30 ට වට්ටක්කල්ලිය ජුසේවාස් මුනි සිද්ධස්ථානයේ දී සලාපුර රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්

කුරුණෑගල රදගුරු පදවිය - ජනවාරි 14 වන දින මහගල්ගමුව ජුසේවාස් සිද්ධස්ථානයේ දී කුරුණෑගල රදගුරු හිමිපාණන් හා විශ්‍රාමික රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් උදේ 8.30 ට

රත්නපුර රදගුරු පදවිය - ජනවාරි 20 වන දින බලංගොඩ වෙලේකුඹුර ජුසේවාස් දෙව්මැඳුරේ දී උදේ 8.00 ට

මන්නාරම රදගුරු පදවිය - ජනවාරි 16 වන දින උදේ 5.45 ට ශු. සෙබස්තියන් ආසන දෙව්මැඳුරේ දී, මන්නාරම රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙනි.

ත්‍රිකුණාමලය රදගුරු පදවිය - තන්නමුනේ වලනාපුරම් හි ජුසේවාස් මුනි සිද්ධස්ථානයේ දී ජනවාරි 20 වන දින උදේ 7.30 ට, ත්‍රිකුණාමලය රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්

මඩකලපුව රදගුරු පදවිය - කාන්ඩවන්වේලි ශු. මරියා දේවස්ථානයේ දී ජනවාරි 16 වන දින උදේ 6.00 ට

යාපනය රදගුරු පදවිය - යාපනය කොටුව, ජුසේවාස් මුනි සිද්ධස්ථානයේදී ජනවාරි 16 වන දින උදේ 8.00 ට

බදුල්ල රදගුරු පදවිය - නමුණුකුල බල්ලෙකෙටුව භාග්‍යවත් ජුසේවාස් දෙව්මැඳුරේ ජනවාරි 20 වන දින උදේ 8.00 ට

අනුරාධපුර රදගුරු පදවිය - පේමඩුව දේවස්ථානයේ දී ජනවාරි 20 වන දින

මෙයට අමතරව දිවයිනේ සියලුම දෙව්මැඳුරු, දේවස්ථාන, පැවිදි ආරාම වල ජුසේවාස් මුනි මංගල්‍ය සිදුකිරීමට හා යැදුම් මෙහෙයන් පැවැත්වීමට ඉල්ලා සිටින අතර, අප ආදරණීය අපෝස්තුළුවරයාණන් කඩිනමින් සාන්තුවර මහිමයට පත්කරන ලෙස යාච්ඤා කරන ලෙස සියලුම සැදැහැවතුන්ට ආයාචනා කෙරේ. තවද අප අපෝස්තුළුවරයාණන්ගේ ධර්ම විරියය හා කැපවූ දිවි මග වෙනුවෙන් දෙවිඳුන් වෙත තුති පුදා විශ්වාසයේ වර්ෂය ලෙස ප්‍රකාශ කර ඇති මේ වසරේදී 'අප අපෝස්තුළුවරයාණන් අප වෙත දානය කළ විශ්වාසයේ දේව තිළිණය අපේම සහෝදර සහෝදරියන් හා බෙදා ගන්නට විරිය වඩමු.....'

අජේල දසනායක
ජාතික ජුසේවාස් ලේකම් කාර්යාංශය

## පන්නිපිටිය මීසමේ නත්තල් සත්කාර රැසක්!

නත්තලෙන් මතුවන බෙදා ගැනීම සංකේතවත් කරමින් පන්නිපිටිය මීසමේ මෙවරත් සමාජ සත්කාරක මෙහෙවර සිදු විය. ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුර මුල් කොට ගෙන කොට්ඨාශ නායක නායිකාවන්ගේ සහය ඇතිව අවශ්‍යතා උවමනා පවුල් 85 කට වියළි ආහාර ද්‍රව්‍ය අඩංගු පාර්සල් නත්තල් සතිය තුළ බෙදා දෙනු ලැබිය. ආගමන කාලයේ ඉරුදින වලදී මීසම් වාසින් ඔප්පු කරන ලද ආහාර ද්‍රව්‍ය මෙලෙස පවුල් වලට බෙදා දෙනු ලැබුවේ මීසම් සේවක ගරු බිලේස් කුරේ පියතුමා සමග ක්‍රියාකාරී කමිටුව විසිනි.

මේ හැර ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරු ප්‍රදේශයෙ කිතුනු හා බොදුනු පවුල් වලට දීර්ඝ කාලයක් සත්කාරක සේවාවන් ඉටුකරන විසෙන්ති පාවුලා සංගමය විසින්ද තෝරා ගත් පවුල් 15 කට මුදල් ප්‍රදානයන් සිදු කරන ලදී. බොදුනු පවුල් කීපයකටත් එම ප්‍රදානයන් ලබාදීම විශේෂත්වයකි.

ක්‍රිස්ටෝපර් රණසිංහ



පොල්ගහවෙල ලූර්දු දේවමාතා දේවස්ථානයේ වැඩිහිටියෝ ප්‍රථම වතාවට පොල්ග හවෙල දුටුගැමුණු හන්දියේ ගව්ලෙනක් නිර්මාණය කළහ. බොදුනු ජනතාවගෙන් මීට සහයෝගය ලැබුණු අතර පොල්ගහවෙල මීසම් සේවක ගරු මනුර ෂිරෝන් ප්‍රේමරත්න පියතුමන්ගේ පූර්ණ සහය ලැබිණ.

ජායා - නිරාන් ද මැල්

## විශේෂ දැනුම් දීමයි

පසුගිය නත්තල් දිනයේ දී මීගමුව වැල්ලවීදියේ සාන්ත සෙබස්තියන් දෙව්මැඳුරේ සිට විකාශනය වූ රූපවාහිනී වැඩසටහනක් පිළිබඳව කතෝලික පියතුමන් සහ කතෝලික සැදැහැවතුන් විසින් මා වෙත දැනුම් දෙන ලදි. එහිදී විවිධ කලාකරුවන් විසින් දේවස්ථානය ඇතුළත හා පූජාසනය අසළ ගැයුම් හා රැඟුම් ඉදිරිපත් කරන ලදැයි යන්න මගේ දැඩි අවධානයට යොමු වී ඇත. සංගීත කණ්ඩායම පූජාසනය වටා ඇති ප්‍රදේශය තුළ ද මේ කටයුතුවල යෙදුනු බව ද වාර්තා වුණි.

මේ පිළිබඳව මට පූර්ව දැනුම් දීමක් සිදු නොකළ බව ද, මගෙන් මේ සඳහා කිසිදු අවසරයක් ලබා නොගත් බව ද සියලු සැදැහැවතුන් වෙත දැනුම් දීමට මම කැමැත්තෙමි. මෙයට අමතරව බොහෝ දෙනෙක් මේ සිදුවීම නිසා කනස්සල්ලට පත්ව ඇති බැවින් ඔවුන් හැමදෙනා වෙත මගේ කණගාටුව ප්‍රකාශ කිරීමට ද කැමැත්තෙමි. ඊට අමතරව වැල්ලවීදිය දෙව්මැඳුර නැවත වරක් ආසිරි ගැන්වීමට සහ අති ශුද්ධවූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට මේ ක්‍රියාවන්ගෙන් නිගා කිරීම උදෙසා වන්දි ගෙවීමට ද මම තීරණය කළෙමි.

එමෙන්ම මේ අවස්ථාවේ දී කොළඹ අගරදගුරු වසමේ සියලු කතෝලික සැදැහැවතුනට සහ පූජකතුමන් වෙත දැනුම් දෙනුයේ මින් මතු දේවස්ථානය තුළ මෙවැනි දෑ කවර තත්ත්වයක් හමුවේ වුවද පැවැත්වීමට අවසර නොලැබෙන බවයි. මීසමක ගීතිකා කණ්ඩායමට සිරිත් පරිදි ජනවන්දනාමය කටයුතු කරන අයුරින්ම නත්තල් කැරොල් ගායනා ද සිදුකළ හැකිය. එහෙත් කිසියම් විශේෂ කැරොල් විවිධ ප්‍රසංගයක් දේවස්ථානයක පවත්වන්නේ නම් ආගමික ගීතිකා ගායනා කළ යුතු වන්නේ ගීතිකා කණ්ඩායම හෝ ආරාධිත ගීතිකා කණ්ඩායම් වන අතර ගරු පියවරුන් විසින් ඒ සඳහා මා වෙතින් පූර්ව අවසරය ලබා ගත යුතු බව දන්වා සිටිමි. එහෙත් සංගීත කණ්ඩායම් සඳහා කවර හේතුවක් මත හෝ මේ අවසරය ලබා නොදේ. මේ නියෝගය 2009 වසරේ දී මා විසින් නිකුත් කරන ලද "ජනවන්දනා කටයුතු වලට මාර්ගෝපදේශනයක්" යන නිවේදනයට අනුකූල වන බව ද පෙන්නා දෙමි.

දෙව්මැඳුර දෙවියන් වහන්සේගේ නිවහන වන අතර අති ශුද්ධවූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ උන්වහන්සේ රාජකීයත්වයෙන් වැඩ වසන ස්ථානය ද මේ වන හෙයින් ශුද්ධවන්තභාවය රැකෙන ලෙස දෙව්මැඳුරු හැමවිටම පවත්වාගෙන යා යුතු වන්නේය. මේ මග පෙන්වීම සෑම සියලු දෙනා විශ්වාසයෙන් යුතුව මින් මතු පිළිපදිනු ඇතැයි මම විශ්වාස කරමි.

ඔබ සැමට ජේසු පිහිටයි!





මට්ටක්කුලිය සා. මරියා දේවස්ථානයේ ජපමාල අප ස්වාමිදූගේ යෞවන කාන්තා ප්‍රජාවිධියම ප්‍රථමවරට ඉදිරිපත් කළ ප්‍රදර්ශනය ඉතා සාර්ථකවිය. මේ එහි අවස්ථාවකි.

කැනිෂියස් ක්‍රිස්ටි

## දරුවකුගේ ධාර්මික ජීවිත පදනම ආදර්ශවත් පවුලයි

"දරුවකුගේ මුල් ම දහම් පාසල නිවෙසයි, මුල්ම දහම් ගුරුවරු දෙමාපියෝයි. විද්‍යාත්මක මතය අනුව කුස තුළ වසන දරුවාගේ මානසිකත්වය සහ ඇවතුම් පැවතුම් හැඩගැසෙන්නේ මවගේ ආකල්පවලට සහ ඇවතුම් පැවතුම් හැඩගැසෙන්නේ මවගේ ආකල්පවලට අනුරූපමය. දරුවකු හැදී වැඩී යහපත් පුරවැසියකු බවට පත් වෙන්නේ දැහැමි පවුලක් තුළිනි. පවුල යහපත් නම් ගමත්, නගරයත්, දේශයත් මුළු ලෝකයත් යහපත් වන්නේය, ධාර්මික වන්නේම යැයි රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි හිමිපාණෝ කැගල්ල සා. මරියා දේවස්ථානයේ මධ්‍යම රාත්‍රි නත්තල් දේව මෙහෙයේදී පැවසූහ.

සිංහල, ද්‍රවිඩ, ඉංග්‍රීසි, ලතින් යන චතුර් භාෂා ගීතිකාවලින් පවත්වනු ලැබූ නත්තල් දිව්‍ය පූජා යාගය සඳහා අති විශාල පිරිසක් සහභාගි වූහ.

පයස් ප්‍රනාන්දු




බලපිටිය ආක්ලෝ පෙර පාසලේ දූ දරුවන් මෙවර නත්තලට ජීවමාන ගව්ලෙනක් රඟ දැක්විය. මේ එහි අවස්ථාවකි.

## පේරලන්දේ කැරොල් ගී ප්‍රසංගයක්!

පේරලන්ද මීසම් සේවක ගරු ලියනගේ පැට්රික් පෙරේරා නි.ම.නි පියතුමන් ප්‍රමුඛ මීසම් ධර්ම සේවා සභාවේ සංවිධානයෙන් කැරොල් ගායනා ප්‍රසංගයක් පේරලන්ද ශු. ජුසේ මුනි දෙව්මැඳුරේ දී පැවැත්විණි.

මීසමේ ගිහි දූත සේවා සමිති ගායනා කණ්ඩායම හා දහම් ගුරුවරුන්ද කොට්ඨාශ නියෝජනය කරමින් කැරොල් ගී ප්‍රසංග යට දායක වූහ.

සී. ආර්. ඩික්සන් ඇන්ටනි



හැඳල තිඹිරිගස්යාය සැනසුම ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය දෙවන වරටත් නත්තල් බෙදාහදා ගැනීම අර්ථවත් කරමින් නත්තල් ආහාරවේල ගමේ දුගී දුප්පත් දරු පවුල් සමග බෙදාහදාගෙන භුක්ති විඳීමට පියවර ගත්තේය. මේ අනුව සැකසුණු අංග සම්පූර්ණ ආහාර මල්ල නායකකන්ද සහයක ගරු ශිරාන් දසා පියතුමා ආසිරි ගැන්වූ අයුරු.

ජූලියන් ගුණවර්ධන



තොඩුවාව විවාහ හමු සංසදයේ රජත ජයන්තිය උත්කර්ෂවත් ලෙස සැමරූ අතර ඒ අවස්ථාව සනිටුහන් කරමින් සහභාගි වූ පිරිස ප්‍රදීප ජායාරූපයට පෙනී සිටි අයුරු. හලාවත පදවි අනුශාසක අතිගරු පීටර් චාල්ස් හලාවත පදවි පවුල් සේවා අධ්‍යක්ෂ ගරු අශෝක් ප්‍රියන්ත පෙරේරා තොඩුවාව මීසම් සේවක ගරු යූජින්ද සිල්වා සහයක ගරු දුෂාන්ත පෙරේරා පියතුමන් හලාවත පදවි විවාහ හමු මෙහෙයුම් සංසදයේ ජාතික සම්බන්ධීකරණ යුවළ මෙහෙයුම් යුවළ මීසමේ විවාහ හමු මූලික යුවළ ඇතුළු විවාහ හමු පවුලේ සාමාජිකයෝ ඊට එක්වූහ.

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2013 ජනවාරි 06 ඉරිදා

# අන්ධයන්ට මඟ පෙන්වන අන්ධයෝ

වසරක් ගෙවී තවත් වසරක් උදා වූ තැන පාළු ගෙයි වලං බිඳින හඬක කඨෝර නාදයක් නැවත මාධ්‍ය හරහාම දිස්වෙන බවක් හැඟේ. උපන් වේලාවට නිගරු කරමින් දවසේ පැය විසි හතරෙන් අඩක්ම අසුබ වේලාවන් බවට පත් කරමින් විවිධ ජීවිත අභියෝග වලට මුහුණදී හෙම්බත්ව සිටින අසරණ ජන කොටස් වල නිදහසට නිග්‍රහ කරමින් සුබ - අසුබ, ලග්න - පලාපල, ජ්‍යොතිෂ හා නක්ෂත්‍රය වැනි නම් වලින් කෙරෙන අරුත් සුන් අඬහැරය නැවත වැයෙන හඬෙහි නිමාවක් නම් නැති තරම්ය. ගෙවුණු වසරේ අවසාන දවස් කිහිපය තුළ ලෝක විනාශයක් ගැන, නැති සුනාමියක් ගැන, භූ චලනයක් පිළිබඳව, දවස අඳුරු වන බවක් පිළිබඳව ගෙන හැර පෑ බේගල් සම්භාරය තුළ නිගරුවට ලක් කළ මිනිස් ඥාන ශක්තිය හා විඥානය ගොඩනැංවීමට පොදුවේ දහම් අනුසාර කරන ජනතාවක් ගෙන හැර පෑ පෙළහර නම් ප්‍රශංසා කටයුතුමයි.

විවිධ මාධ්‍ය හරහා ලග්න පලාපල, සුබ - අසුබ මුහුර්ත පිළිබඳව, නියමිත වේලාව අනුව කථා කරන පුද්ගලයින් එමට ඇතත් ඒ පුද්ගලයින්ම විවිධ විද්‍යුත් මාධ්‍ය වල පෙන්නුම් කරන එකට එකක් වෙනස්ව ඇති වේලාවන් තුළම එම අදහස් ප්‍රකාශ කිරීමත් විහිළුවක් වැනියි. ගෙයින් එළි බසින්නට, ඇඳුම් අඳින්නට යන දිශාව නම් කරන්නට විවිධ මත පල කරන විවිධ පුද්ගලයින් නිසා හෑල්ලුවට ලක් වන්නේත් තාරකා ශාස්ත්‍රය වැනි උසස් විද්‍යාවක්මයි. භීතිය පමණක්ම සමහර ජන කොටස් තුළ ඇති කරන්නට මෙවන් පුද්ගලයින් යම් නිහින උත්සාහයක් දරන්නේ නම් එහි ආදීනව පිළිබඳව පුළුල් ලෙස දැනුම් වත් කිරීමට යම් ක්‍රියා මාර්ග යකුත් සැකසිය යුතුයි.

කිතුනු, බොදුනු, හින්දු. ඉස්ලාම් දහම් පිළිවෙතින් අනුසාර කරන සැදැහැවතුන් මේ මායාවනට හසුනොවන බව විශ්වාසය. නමුත් මේ ආධ්‍යාත්මික විශ්වාසීය පසුබිම හෑල්ලුවට ලක් කරන්නන් විශේෂයෙන්ම මෙවන් මිථ්‍යාමතවලට ලෙහෙසියෙන්ම ගොදුරු විය හැකියි. සමහර අවස්ථාවන්හි ඇස් පනාපිට දැකිය හැක්කේත් එයයි. ආධ්‍යාත්මිකව සවිමත් තැනැත්තාට සොහොනක වුවත් පැලක් අටවාගෙන ප්‍රීතියෙන්. ශාන්තියෙන් ජීවත් විය හැකියි. නමුත් අභාග්‍යයකට අද ගෙයක් සෑදීමට පෙරත් විවිධ අභූත කථා වලින් පුද්ගලයින් හෙම්බත් කරන ආකාරයක්ද පෙනී යනු ලබයි. ගැහැනු දරුවකු වැඩිහිටි තත්ත්වයට පත් වන විට අනිසි ලෙස එක්කෝ භීතියක් ඇති කරවන 'අනාවැකියක්' පළ කරයි. නැතිනම් ජීවිත කාලය තුළම විඳවන්නට යම් මානසික අසහනයක් ඇති කරයි.

ජ්‍යොතිෂය යම් විද්‍යාත්මක පදනමක් තුළ පිහිටුවා ගනිමින් අධ්‍යනය කරන අය නොමැත්තේ නොවේ. නමුත් නක්ෂත්‍රය, ජ්‍යොතිෂය, ලග්න පලාපල ගැන අද කථා කරන්නෝ පාළු ගෙයි වලං බිඳින තත්ත්වයට පත්වී සිටිති. රාජ යෝග පිළිබඳව හා දේශපාලන පෙරළීන් පිළිබඳව කථා කරන්නට ජ්‍යොතිෂයේ පිහිට පැතීම දියුණු කිසිම රටක සිදු වන්නක් නොවේ.

අද ශ්‍රී ලංකාව දියුණුව කරා ගමන් කරන සංවර්ධිත රටක් ලෙස නම් දරා ඇත. සාක්ෂරතාවය තුළ ආසියාවේ ප්‍රබල ස්ථානයක සිටින අප දේශය තුළ මිථ්‍යා මත මත ගමන් කරවන ජනතාවක් බිහිවීම එවන් මිනුම් දඬු හෑල්ලු කිරීමකි. බෞද්ධ දර්ශනය තුළ ආධ්‍යාත්මික ප්‍රගතියක් ලබා ඇති ශ්‍රී ලාංකිකයන් කොහේවත් නැති ග්‍රහයෙක් පිළිබඳව අනිසි බියක් ඇති කරගෙන ජීවිතය පසුගාමී කරගන්නා තත්ත්වයක් විද්‍යාමාන නොකළ යුතුයි. මන්ද ඒ දර්ශනයේ ඇතුලාන්තය ඒ සියලු දෑ නිෂ්ප්‍රභ කරන බැවිනි.

දෙවිඳුන් තුළ සැබෑ ලෙසින්ම විශ්වාසය පතිත කරවන කිතුනුවා හට මේ මිථ්‍යාදෘෂ්ටීන් කෙරෙහි කිසිම අයුරකින් විශ්වාසයක් පතිත කළ නොහැකියි. හින්දු සහ ඉස්ලාම් දහම තුළත් මෙවන් ඇස් බැන්දුම් ඉන්ද්‍ර ජාල වලට තැනක් නොමැත්තේමයි. ආගම දහම තුළ සැබෑ ඇදහිලිවන්තයෙක් නොවන තැනැත්තා අනියත බියකින් ජීවත් වන බවත් රහසක් නොවේ. එලෙස අන්ධ භාවයෙන් ජීවත් වන්නන් හට මෙවැනි අන්ධ කථා සැබවින්ම සත්‍යයක් සේ පිළිගැනීමට සිදුවේ.

ගෙයි අත්තිවාරම් කැපීමට, නිවෙස් සැලසුම් කිරීමට, ගෙයින් එළිබැසීමට ජීවිතයේ විවාහ හා අනෙකුත් වැදගත් සිදුවීම් වලදී මෙවන් අන්ධ මත කෙරෙහි විශ්වාස තබන අයගේ ඒ ජීවිත පැවැත්ම හා පිළිවෙත් දියවී ගොස් ඇත්තේ ඇස් පනා පිටමයි. සමහර මනාලියන් සුබ මොහොතින් ගෙයින් එළියට බැසිය යුතු යැයි කියමින් ඇඳ පැළඳ පාන්දර දෙකට තුනට මිදුලට වී ගත කරන අන්දම පසුගිය කාලයේ ආරංචි නොවුනා නොවේ. මේ සියලු විගඩම් මේ සුබ මුහුර්ත නිසාද?

අන්ධයනට මඟ පෙන්වන්නට අන්ධයනට බැරි බවට සුබ වදනම දෙස් දෙයි. මඟ හොඳට තිබේ නම් ඇයි මේ බැඳි වල ගමන් බිමන්!

## විශ්වාසයේ වසර දහම් චින්තා 11


# දෝෂාභියෝගය සහ විනිශ්චයනට අභියෝග කිරීම එදා සහ අද

දෝෂාභියෝගය යන්න මෙරට සමස්ත ජනතාවගේම කතා බහට සංවාදයට ලක් වූ වදනකි. අගවිනිසුරු ශිරාණි බංඩාරනායක මහත්මියට විරුද්ධව චෝදනා එල්ල කෙරුණු මෙම දෝෂාභියෝගය ආණ්ඩු පක්ෂයේ මංත්‍රීවරුන් 117 කගේ අත්සන් සහිතව ඉදිරිපත් වී ඇති නිසා මෙය රජයේ අවශ්‍යතාවය මත ඉදිරිපත් වුවක් ලෙස උපකල්පනය කිරීම ද වැරදි නොවේ.

ජනාධිපතිවරණයකින් පසු ජයග්‍රාහී අපේක්ෂකයා දිවුරුම් දෙන්නේද අගවිනිසුරු වරයා ඉදිරියේ බැවින් අගවිනිසුරු නිලයේ සුවිශේෂීභාවය මොනවට පැහැදිලි වෙයි. ගතවූ කාල පරාසය දෙස අවධානය යොමු කිරීමේදී අග විනිසුරු නෙවිල් සමරකෝන්, අගවිනිසුරු සරත් සිල්වා යන මහත්වරුන්ට ද දෝෂාභියෝග ඉදිරිපත් වී ඇති බව පෙනෙන අතර ඒවාද රජයේ අවශ්‍යතා මත ඉදිරිපත් වී ඇති බවද පැහැදිලිය. මේ අනුව බලන විට මෙතෙක් ඉදිරිපත් වී ඇති දෝෂාභියෝග 3 දෙස අවධානය යොමු කිරීමේදී රජය නුරුස්නා, රජයට අහිතකර තීන්දු තීරණ ගැනීම හා රජයට අහිතකර ක්‍රියා කලාපයන් අනුගමනය කිරීම නිසා මෙවන් තත්ත්වයක් උද්ගතවී ඇති සෙයක් විද්‍යමාන වෙයි.

අග විනිසුරු ශිරාණි මහත්මියට එරෙහිව ඉදිරිපත් කර ඇති දෝෂාභියෝගයට එරෙහිව මහා සංඝරත්නය, ශ්‍රී ලංකා රදගුරු මඬුල්ල, සිවිල් සංවිධාන, විරුද්ධ දේශපාලන පක්ෂ ප්‍රකාශ නිකුත් කර ඇති අතර පිකටින්. උද්ඝෝෂණ, උපවාස කර ඇති බව ජනමාධ්‍ය තුළින් දිස්විය. එසේම ජාත්‍යන්තරයද විරෝධය පළ කර ඇති අතර පොදු රාජ්‍ය මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවිධානය මානව හිමිකම් සංවිධානද විරෝධය පළකර ඇත. මේ හේතු කොට ගෙන ව්‍යවස්ථාදායකය විධායකය අධිකරණය විවිධ කතා බහට ලක්වුන මාතෘකා තුනක් බවට පත්වී ඇත.

අපි දැන් විනිශ්චයනට අභියෝග කිරීම පිළිබඳව අවධානය යොමු කරමු. මධ්‍යස්ථ මත ධාරින්ගේ මතයට අනුව මෙන්ම තතු දත් ආරංචි වලට අනුව රජයේ පාර්ශවයෙන් මෙම දෝෂාභියෝගය ගෙනෙන ලද්දේ දිවි නැගුම



පනත පාර්ලිමේන්තුවේ අනුමතියට බාධක වන අයුරින් අධිකරණමය විනිශ්චය තීන්දු දීම නිසා බව කියැවෙයි. එය එසේ යයි උපකල්පනය කළ හැකි වන්නේ ආණ්ඩු පක්ෂයේ ඇතැම් මැති ඇමතිවරුන් විවිධ අවස්ථාවල කරන ප්‍රකාශයන් නිසාය. අධිකරණ සේවා කොමිෂමේ ලේකම් මංජුල තිලකරත්න මහතාට පහර දීම, සරත් පොන්සේකා නඩුවේ වරාවැව විනිශ්චය කාරතුමාට බලපෑම් කිරීම, මන්නාරම උසාවියේ විනිශ්චයකාර තුමාට එරෙහි උද්ඝෝෂණ කිරීම, රජයේ ඇමැතිවරයකුද ඊට සහභාගි වීම, දුරකතන හා නිර්නාමික පණිවිඩ තුළින් බලපෑම් කිරීම මෑත යුගයේ අධිකරණමය විනිශ්චයනට අභියෝග කළ අවස්ථා අතරින් කැපී පෙනෙයි. වර්තමානයේ පමණක් නොව එක්සත් ජාතික පක්ෂයේ ජේ. ආර්. ජයවර්ධන මහතාගේ රජය සමයේ විනිශ්චයකාර තුමන්ලාගේ නිවසට ගල් ප්‍රහාර එල්ල කිරීම, හූ කීම් තිබූ බවද අමතක කළ නොහැක්කේය.

දැන් අපි ක්‍රිස්තු වර්ෂ එක සමයේ මුල්වසර තිස් තුනක කාල පරාසය තුළ රාජකීය නියෝග යන් අභියෝගයට ලක් වූ අවස්ථා දෙස අවධානය යොමු කරමු. සුදුවර මතෙව් 2:7-9 අනුව හෙරොද් රජ විසින් ශාස්ත්‍රවන්තයන්ට ජේසු බිළිඳා දැක බලා තමාටත් දැක බලා ගැනීම සඳහා පැමිණ දන්වන ලෙස කියුවේය. "ඔබ ගොස් ඒ ළදරුවා ගැන හරිහැටි විමසන්න. ඔබ විමසා සොයා ගත් පසු මාත් ගොස් උන්වහන්සේට නමස්කාර කරනු පිණිස මටත් දන්වන්න" යන සඳහනින් පැහැදිලි වෙයි. එහෙත් ඔවුන් දේව සැලැස්මට අනුව දුටු සිහිනයකින් රජ වෙත නොගොස් අන් මගකින් ගිය බවද සඳහන්ය. හෙරොද් රජගේ නියෝගය අභියෝග යට ලක් කරමින් ජේසු බිළිඳුන්ගේ ජීවිතාරක්ෂාව තකා ක්‍රියා කර ඇති බව මෙයින් ගම්‍යවෙයි. එසේම මතෙව් 2:16-17 අනුව හෙරොද් රජගේ බිළිඳු ඝාතන නියෝගය හරහා සැලසුම් කළ ජේසු බිළිඳා ඝාතනය පුස්සක් බවට දේව සැලැස්ම විසින් පත් කිරීම තුළින් ගම්‍ය වන්නේ ද හෙරොත් රජගේ ඊනියා අමානුෂික නියෝගයට අභියෝග කිරීමකි.

සුදුවර ලූක් 23:3-5 අනුව "මොහු අත කිසිදු වරදක් මට නොපෙනේ" ය. ජේසුස් වහන්සේ පිලාත් රජ ඉදිරියට ගෙන ආ අවස්ථාවෙ පිලාත් රජ විසින් ප්‍රකාශ කළද එම රාජකීය ප්‍රකාශය පිළිනොගෙන ක්‍රියා කිරිම තුළින් පැහැදිලි වන්නේ පිලාත් රජගේ ප්‍රකාශය නොතකා ඊට අභියෝග කිරීමකි. එසේම සුදුවර ලූක් 23:23-35 අනුව ජේසුස් වහන්සේ හෙරොද් රජ ඉදිරියට ගෙනාවිට උන්වහන්සේව තලා පෙලා මුදාහරින ලෙස නියෝග කළත් එය ගණන් නොගෙන කුරුසියේ ඇණ ගසා මරණයට පත් කරන ලෙස නායක පූජකයන් කළ තර්ජන කිරීම තුළින් හෙළි වන්නේ රාජ නියෝගය නොතකා ක්‍රියා කිරීමකි. එසේම ජේසුස් වහන්සේ මරණයට තීන්දු කරන ලෙස වක්‍ර අන්දමින් බල කරමින් එහි පාපය අප පිටත් අප දරුවන් පිටත් වැටේවා යයි මුරගා කීම තුළින් රජගේ තීන්දුවට පූර්වගාමීව බලපෑම් කර ඇති සෙයක්ද දිස්වෙයි.

මේ අනුව මෙම කරුණු සලකා බලන විට දෝෂාභියෝගය මෙන්ම අධිකරණය තීන්දු තීරණ තම වාසියට තම අපේක්ෂාවන් මුදුන් පත් කර ගැනීමට දරණ ලද ප්‍රයත්නයක පැතිකඩක් ලෙස දිස්වෙයි. එසේම එදා ක්‍රිස්තු වර්ෂ 1 සමයේ ශුද්ධවූ දේශයේ රාජ්‍ය පාලකයන් තම පැවැත්ම සඳහා නීතිය අවියක් කර ගෙන සදාචාරය ඉක්මවා ක්‍රියා කර ඇති අතර ඔවුන්ගේ රාජ නියෝගයන්ට බලපෑම් කිරීමක ආයාසයන් ඉස්මතු වී ඇති බව පෙනේ. එසේම මෙම සෑම ක්‍රියාවක්ම දේව අභිමතය අභිබවා යෑමට නොහැකි බව සනාථ කිරිමක් ලෙස දිස්වන්නේය.

**තියබෝල්ඩ් සමරතුංග**

## කැම්ලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# ජුසේවාස් පිය ජීවිතාදර්ශයෙන් සැබෑ ධර්මදූතයකු වන්න

අභිවෘද්ධි ආලේපය නමැති සක්‍රමේන්තුව ලබන ඔබ සැම අද සිට ශුද්ධවූ සභාවේ වැඩිහිටියන් බවට පත් වනවා. එසේම සත්‍ය විශ්වාසයකට සාක්ෂි දරන්නටද පොරොන්දු වනවා පමණක් නොව එදා අප ක්‍රිස්තුස් වහන්සේ හැත්තෑ දෙනෙකු සිය ශ්‍රාවකයන් ලෙස පත් කරමින් සකල දේශ ජනයින් තම ගෝලයන් බවට පත් කරන්න යැයි ඔවුන් වෙත පවරන ලද ධර්මදූත කාර්යයේ පංගු කාරයින් බවටද ඔබ සැම පත් වනවා. එම නිසා ඔබගේ කිතුනු විශ්වාසය වර්ධනය කර ගනිමින් කුඩා කල සිට සැබෑ ධර්ම දූතයකු දූතිකාවක වීමට සිතට ගන්න. භාග්‍යවත් ජුසේවාස් පියතුමාගේ ජීවිතාදර්ශය කුඩා කල සිට අනුගමනය කළ හොත් ඔබට සැබෑ ධර්ම දූතයකු වන්නට පුලුවන් යැයි අගරදගුරු පදවි සහායක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණෝ ප්‍රකාශ කළහ.



එතුමා මේ බව ප්‍රකාශ කළේ මාකවිට දිව්‍ය ගැලවුම් කරුවාණන්ගේ දෙව් මැඳුරේ පැවති අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ දේව මෙහෙයේදීය. මාකවිට මීසමට අයත් මාකවිට, මාදැල්ගමුව, වැලිකඩ සහ මදුරුවිට යන දෙව් මැඳුරු වලට අයත් දරුවන් 154 ක් මෙදින මෙම සක්‍රමේන්තුව ලබා ගත්හ.

මීසම් සේවක ගරු තරංග සම්පත් පියතුමාගේ අධීක්ෂණය යටතේ දහම් ගුරු මණ්ඩලය සහ මීසම් සභාව මගින් මෙම උත්සවය සංවිධානය කර තිබූ අතර හපුගොඩ මීසම් සේවක ගරු රසික ඉවාන්ස් පියතුමාද මේ අවස්ථාවට සහභාගි විය.

සටහන - ප්‍රැන්ක් වික්‍රමසිංහ
සේයා - තිලක් ඩයස්



නාත්තන්ඩිය වීදිය බණ්ඩාර මාවතේ ජනතාව කරුවල ගස්වැව ජනතාව වෙනුවෙන් මෙදා නත්තල අරුත්බර ගැන්වීය. ඒ ඔවුන් වසරක් පාසා පැවැත්වූ නත්තල් උත්සවය වෙනුවට කරුවල ගස්වැව ජේසු බිළිඳු දෙව්මැඳුරේ මීසම් සේවක ගරු සමන් කිත්සිරි පියතුමන් වෙත මුදල් ඇඳුම් පැළඳුම් හා පොත් පත් යනාදිය පරිත්‍යාග කළේය.

ශ්‍රියංගණී ෆිලීෂියා



බෝලවලාන දිසා සා. වින්සෙන්තිද පාවුලා සමිතියේ දිසාවේ නත්තල් සුහද හමුව තම්මිට ඔසානාම් ශාලාවේදී පසුගියදා පවත්වන ලදි. එම දිසා නත්තල් එකමුතුවේ වින්සෙන්තියාන පිරිස කැරොල් ගී ගායනයෙන් නත්තල් සතුට බෙදාගත් මොහොතයි මේ.

ඇග්නස් සියඹලාපිටිය

# මරිය හමුදා ධර්ම විවේකය 12-13 දිනවල

අගරදගුරු පදවියේ මරිය හමුදා ප්‍රසීඩියම් නිලධාරින්ගේ වාර්ෂික ධර්ම විවේකය හා දැනුවත් කිරීමේ වැඩසටහනක් මග්ගොන කල්වාරි පුදබිමේදී ජනවාරි 12 13 දිනවල පැවැත්වීමට අගරදගුරු පදවි සිංහල මරිය හමුදා උසස් පාලක සභාව කටයුතු යොදා ඇත.

ජනවාරි 12 සවස 3.00 ට ආරම්භ කෙරෙන ධර්ම විවේකය ජනවාරි 13 ඉරිදා දිව්‍ය පූජාවෙන් පසු අවසන්වේ. මරිය හමුදා අධ්‍යක්ෂ ගරු සුනිල් වේරගොඩ, මැල්කම් කන්දප්පා, ගියොම් නෝනිස්, ශ්‍රියාන් රණසිංහ නි.ම.නි පියතුමන් සමග සෙනාටස් සභාපති නිව්ටන් ප්‍රනාන්දු මහතා සභාව ඇමතීමට නියමිතයි.

බෙන්ජමින් කිරිහෙට්ටි

# දරුවන්ට ආදරය කරන සමාජයක් මේ නත්තලේදී ගොඩනගමු



ලෝකයාට දෙවියන් වහන්සේ දැක්වූ ආදරය තුළ දේව පුත්‍රයා මිනිස් බව ගැනීම සිදු හෙයින් දරුවන්ට ආදරය කරන සමාජයක් මේ නත්තලේදී බලාපොරොත්තු වෙමු යැයි ගුරුබැවිල දිව්‍ය හෘදය සමිති අධ්‍යක්ෂ අවිස්සාවේල්ල මීසම් සේවක ගරු මැක්ෂිමස් රුදිගු පුල්ලේ පියතුමා පසුගියදා අවිස්සාවේල්ල නගර සභා ශාලාවේ පැවැති දිසා නත්තල් උත්සවය අමතා ප්‍රකාශ කළේය.

දිසා දිව්‍ය හෘදය සමිති විසින් කැරොල් ගායනා, නාට්‍ය ඉදිරිපත් කළ අතර ගුරුබැවිල දිසා නායක ගරු ගියොම් නෝනිස් අවිස්සාවේල්ල සහයක ගරු ඔගස්ටස් ප්‍රනාන්දු පුල්ලේ, ගරු ලූෂන් ප්‍රනාන්දු පියතුමන් හා පැවිදි සොයුරියන් සමගින් සමිති සාමාජිකයන් විශාල පිරිසක් සහභාගි වූහ.

ඇන්තනි හෙට්ටිආරච්චි

# දහම අනුව දිවිගෙවීම දහම් ගුරු පිළිවෙත විය යුතුයි

ඔබ කරන්නේ අනර්ග සේවාවක්. ඔබ නොමිලේ දහම උගන්වන්නේ වෙනත් අයගේ දරුවන්ටයි. මෙය විශාල පරිත්‍යාග යක්. ඔබ උගන්වන ආගම විෂයකට සීමා කරන්න එපා. එවිට ඔබත් තවත් ගුරුවරයෙක් පමණක් වේවි. දහම් පාසල් ගුරුවර ගුරුවරියන් අනිවාර්යෙන් දහම අනුව ජීවත් විය යුතුයි අන්න එය ඔබත් අනිකුත් ගුරුවරුනුත් අතර ඇති විශාල වෙනස යැයි ක්‍රිස්තියානි ව්‍යාපාර ධර්මදූත හා දේව කැඳවීම පිළිබඳ අධ්‍යක්ෂ ගරු ප්‍රෙඩී ශාන්ති කුමාර පියතුමා කඩලාන ශාන්ත අන්තෝනි දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදාන උත්සවයේ



විශේෂ ආරාධිත දේශනය කරමින් පැවසීය.

කඩලාන මීසම් සේවක ගරු ලලිත් පෙරේරා හා සහයක ගරු මලින්ත චතුරංග පියතුමන්ගේ උපදෙස් පරිදි දහම් පාසල් විදුහල්පතිනි ගරු මියුරියෙල් පැවිදි මව්තුමිය හා ගුරු මණ්ඩලය ශිෂ්‍ය නායකයින්ගේ හා දෙමාපියන්ගේ සහය ඇතිව මේ උත්සවය සංවිධානය කර තිබුණි.

සුමිත් මාර්ක් ද සිල්වා

# මෝදර ගවලෙන් තරගයක් සහ කැරොල් ගීත මෙවර මහ ඉහළින්

මෝදර ශු. ස්නාවක ජුවාම් දේවස්ථානයේ නොවාන කොට්ඨාශ අට ඇතලත මෝදරවීදිය, විස්ට්වයින් පාර, අලුත් මාවත පාර, රජමල්වත්ත පාර මෝදර පටුමඟ ඇතුලු ප්‍රසිද්ධ ස්ථානවල මෙවර පවුල් එකතු වී මුදල් එකතු නොකොට ගවලෙන් තරගයක් පැවැත්විය. මෙය නිරීක්ෂණය කිරීම සඳහා සහ අර්ථවත් ගවලෙන තේරීම සඳහා මීසම් සේවක පියතුමා සහ දෙව්සත්හලේ සහෝදරවරු පැමිණියහ.

තරුණ සමිතිය සහ ගායනා කණ්ඩායම එක්ව නත්තල් බැති ගී ප්‍රසංගයක් පැවැත්විය. නව මීසම් සේවක ගරු නිලන්ත හේෂන් ප්‍රනාන්දු පියතුමා මීට උපදෙස් දුනි.

රනිල් රාජපක්ෂ

# දියලගොඩ ශු. සෙබස්තියන් මුනි දෙව්මැඳුර

පුදබිමක අසිරිය



දියලගොඩ විසූ තොටගේ බස්තියන් ප්‍රනාන්දු නමැති අය විසින් පරිත්‍යාග කරන ලද දියලගොඩ 'හුණු කැටිය' නම්වූ ඉඩමේ 1708 දී ගරු එම්මානුවෙල් මිරන්ද පියතුමන් විසින් අත්තිවාරම් දමා වරිච්චි බිත්ති සහිත පොල්අතු සෙවිලි වහලකින් යුත් තාවකාලික කුඩා දෙව්මැඳුරක් ඉදිකරන ලදී. ක්‍රි. ව. 1845 දී ගරු පේදුරු නොරොඤ්ඤෝ පියතුමන් විසින් එය ආරම්භ කරන ලදි.

ක්‍රි.ව. 1871 දී උතුරු කළුතර සිට අළුත්ගම දක්වා තිබුණේ එකම මීසමකි. ප්‍රථමයෙන් එහි මීසම් සේවක වශයෙන් පත්වීම ලැබුවේ ගරු පිච්චනෙල්ලි පියතුමාය. ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයා යන විරුදාවලිය ලත් වන්දනීය ජුසේවාස් පියතුමන් විසින් 1691 ජනවාරි 20 දින අප දෙව්මැඳුර ශු. සෙබස්තියන් මුනිඳුන්ට කැපකර, පළමු දිව්‍ය යාගය පැවැත්වූ බවද, ඉතිහාසයේ සඳහන් වේ. එමෙන්ම දියලගොඩ පුත්‍රයන් දෙදෙනෙක් වු එච්. ඩී. මර්තීනු සහ ඇස්. ඩී. මර්සලීනු යන තරුණයන් දෙදෙනාගේ යෝජනාවක් අනුව, පැවදි නිකායන් ආරම්භ කිරීමේ අදහස පලගැන්වුණි. ඒ අනුව ස්වදේශීය ප්‍රැන්සිස්කාන තාපස නිකාය දියලගොඩ ග්‍රාමයේ ආරම්භ වූ බව පවසනුයේ ඉමහත් සතුටිනි.

ක්‍රි. ව. 1999 දී මග්ගොන මීසමෙන් දියලගොඩ මීසම වෙන් කෙරුනු අතර, දියලගොඩ නව මීසම් සේවක ලෙස ගරු වික්‍රම ෆොන්සේකා පියතුමා පත්විය. මීසම් ජනතාවගේ අධ්‍යාත්මික උන්නතිය සඳහා එතුමාගෙන් සිදුවු සේවාව අමිලය. වත්මන් මීසම් සේවක ලෙස කටයුතු කරන ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමා මීසම් ජනතාවගේ අධ්‍යාත්මික ප්‍රබෝධය පිළිබඳවත්, මීසම දිනෙන් දින දියුණු කිරීමේ අරමුණින්, ක්‍රමවත් වැඩ සටහන් දියත් කර ඇති අතර එතුමාගෙන් මීසම් ජනතාවට වන සේවය ඉමහත්ය.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

නොමිලේ බෙදාහරින ජනතා නත්තල් වාර්ෂිකය වන උඳුවප් මිහිර 36 වන කලාපය ජාඇල නගර ශාලා ශ්‍රවණාගාරයේදී නගරාධිපති උපාලි අරඹවත්ත මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී ගරු ග්‍රෙගරි ජයන්ත ප්‍රනාන්දු පියතුමා උඳුවප් මිහිර උපහාරයෙන් පිදුම් ලැබූ අයුරු. මැක්ෂිමස් රෝයි පෙරේරා හා ශිරාන් මෛත්‍රි සංස්කාරකවරුද මෙහිවෙති.

එච්. ඒ. කල්දේරා



## දයා සේවා සුහද හමුව පයාගලදී

කළුතර සා. වින්සෙන්තිද පාවුලා දිසා සභාවේ වාර්ෂික නත්තල් සුහද හමුව පසුගියදා උතුරු පයාගල ශු. ජුසේ මුනි දෙව්මැඳුරු ශ්‍රවණාගාරයෙදි ආත්මික අධ්‍යක්ෂ ගරු තුසිත ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවත්විණ.

දිසා සභාවේ කොන්ෆරන්සි නියෝජනය කරමින් විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

රංජිත් නෝනිස්

# විනය ගරුක දරුවන් හද වඩා ගැනීම මව්පිය යුතුකමයි

මනුෂ්‍යයන් වශයෙන් අප කුමන ආගමක් ඇදහුවත් ජාතියක් වශයෙන් අප එකමුතු විය යුතුය. කරුණාව, දයාව, පෙරදැරි කරගෙන එකිනෙකා අතර සමගිය, සාමය. වර්ධනය කර ගැනීම අපගේ එකම පැතුම විය යුතුය. අද අපගේ දරුවන්ගේ සුරුකම් විරුකම් තුළින් ඉදිරිපත් කරන මෙවැනි නත්තල් ගායනා වැඩ සටහන් ඉතාමත් අගය කළ යුතුය. දරුවා විනය ගරුකව හැඩගැස්වීමට කැපවීමට යොමුකර වීම මෙම කර්තව්‍යයන් මහෝපකාරිවන බව කිව යුතුය. අද දරුවන් වර්තමාන සමාජය තුළ ජීවත්වන පරිසරය පිළිබඳවද සොයා බැලීම දෙමව්පියන් සතු විශාල වගකීමකි. එය නොසලකා හැරීමෙන් සිදුවෙන්නේ දරුවන්ට අවැඩක්ම බව අමතක නොකළ යුතුයයි, මග්ගොන නිග්‍රෝධාරාම විහාරාධිපති, පූජ්‍ය, රඹුක්වැල්ලේ සීලරතන හිමිපාණෝ පැවසූහ.

එතුමා එසේ පැවසුවේ දියලගොඩ මීසමේ නත්තල් කැරොල් ගී ගායනා උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස කළ අනුශාසනාවේදීය.

වැඩිහිටි, මැදිවිය, තරුණ, ළමා යන වයස් අනුව ඉදිරිපත් කළ නත්තල් කැරොල් ගී ගායනා තුළින්,



සභාව අමන්දානන්දයට පත් කෙරිණ. දහම් පාසලේ දරු දැරියන් සඳහා වු වාර්ෂික ත්‍යාග ප්‍රදානයද මෙදින සිදුකරන ලදී. මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ මූලිකත්වයෙන් දියලගොඩ පියවරුන්ගේ සංගමය තරුණ සමිතිය ඇතුළු දහම් ගුරුවරුන් විසින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදි.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු



# කිතු සමිඳාණන්ගේ උපතින් ඔබ්බට

**කිතු සමිඳාණන්ගේ උපත සමරන දිනය නත්තල වශයෙන් හඳුන්වන්නෙමු. විශේෂයෙන්ම එය කුඩා දරුවන්ට පමණක් සීමා වූ ඇති හැම අය ප්‍රීතිය භුක්ති විඳින දිනයක් වශයෙන් ප්‍රකටය.**

එහෙත් කිතු උපත සිදුවූ වකවානුවේ ඇතිවූ බවට බයිබලයේ සඳහන් වන කරුණු කිහිපයක් ගැන මෙනෙහි කරමු. මෙම සුවිශේෂ සංසිද්ධිය බයිබලයේ සඳහන් කරනුයේ සුවිශේෂක මැතිව් හා සුවිශේෂක ලූක් තුමන් පමණි.

සුවිශේෂක ලූක් තුමා ජුදා ජාතිකයකු නොවේ. එතුමා ග්‍රීක් ජාතිකයෙකි. එහෙත් ජුදා වංශයෙන් පැමිණෙන ක්‍රිස්තුන් වහන්සේගේ උපත අන්‍ය ජාතිකයන් වෙත හඳුන්වා දීමට එතුමා බයිබලය තුළින් වෙර දරයි. ලූක් තුමා සඳහන් කරන කිතු උපත මෙසේ සඳහන් කරයි. "ඇය කුළුඳුල් පුත්‍රයා බිහිකොට රෙදි වලින් ඔතා තානායමේ ඉඩකඩ නොතිබූ බැවින් ගව ඔරුවක බැවුවාය." (ලූක් 2:7).

එපමණක් නොව තවද එම පළාතෙහි එඬේරු රෑ යාමයෙහි සිය බැටළු රැළ රකිමින් පිට්ටනියෙහි සිටියහ. මෙම වාක්‍ය දෙක විශේෂිතය.

ගව ඔරුව සතුන්ට කෑම දීමට භාවිත කරන උපකරණයකි. එම භාජනයේ සමිඳාණන් වහන්සේ සතපනු ලැබුවේ ඇයි ද යන්න විමසීම යෙහෙකි.

ජේසු බිළිඳා පිදුරු ගොඩක සැතප වීමට මරියාවන්ට නොහැකි වූයේ ඇයි ද යන්න ප්‍රශ්නාර්ථයකි. එම ක්‍රියාවලිය මරියාවන්ගෙ තනි තීරණයක් විය හැකි නොවේ. එම සිදුවීම උන්වහන්සේ මෙලොවට බිහිවූයේ තමන් වහන්සේගේ ජීවිත පරිත්‍යාගයේ සංඛේතයක් වශයෙන් සටහන් කිරීමකි.

එඬේරික ජීවිත එදා ජන සමාජය අනුව කොන් කරනු ලැබූ වහල් ජනතාවකි. එහෙත් පුරාණ බයිබලයේ සඳහන් වන අන්දමට එඬේරික ජීවිත දෙවි මහෝත්තමයාණන් වහන්සේගේ උසස් තෝරා ගැනීමක් විය. පරණ ගිවිසුම අනුව ආබ්‍රහම් තුමා එඬේරික පරපුරට අයත් විය. දෙවියන් වහන්සේ ඔහු තෝරා ගනු ලැබූ තැනැත්තෙකි. තවද දෙවි සමිඳාණන් ඊශ්‍රායෙල් ජනතාව හඳුන්වනු ලැබුවේ එඬේරා වශයෙනි.

"සමිඳාණෝ මා එඬේරාණෝය. අග හිඟකම් මට නොවන්නේ ය. එතුමාණෝ සුනිල් තණ බිම් මත මා සතපවා නිසල දිය වෙත පමුණුවා මා පණගන්වන සේක. (ගීතාවලිය 23:1-2).

එහෙත් පසු කලෙක එඬේරික කාර්යයේ ස්වභාවය නිසා නියමිත කාල වේලා අනුව ජුදා නීතිය නිසි ලෙස පිළිපැදීමට නොහැකි වීම නිසා ඔවුන් පහත් කොට සලකනු ලැබූහ.

සුවිශේෂක මැතිව් තුමා සඳහන් කරන අන්දමට මෙසියස් තුමාගේ උපත ශුද්ධ ලියවිල්ල තුළින් ජුදා ජනතාව දැන සිටියහ. එහෙත් ඔවුන් එතුමා නමස්කාර කිරීමට නොගියහ. ජුදා නොවන ජනතාව එතුමා උපත ලැබූ ගවහල වෙත ගියහ.

ශුද්ධවර මතෙව් තුමාට අවශ්‍ය වූයේ ජුදා නොවන ජනතාවට සමිඳාණන්ගේ උපතේ පණිවුඩය ගෙන යාමටය.

එතුමා සඳහන් කරන අන්දමට අහසේ පෑවු තාරකාව විශේෂිතය. එමෙන්ම ගැලවීම උදා වන්නේ ජුදා ජනතාවගෙන් බව බයිබලයේ පැහැදිලිව සඳහන් වේ. මෙවැනි අමුතු තරුවක් උදාවීම සෑම පුද්ගලයකුට විශේෂයෙන් වැදගත් තැනැත්තකුගේ උපත සිදුවන බව ග්‍රහ බලපෑම යටතේ සංඛේත කර ඇත. එසේ හෙයින් ඒ තරුව උදා වීම මඟින් ශාස්ත්‍රවන්තයින් ජෙරුසලමට පැමිණීමත් සමඟ කිතු සමිඳාණන් උපත ලැබූ ස්ථානය දැන ගනු ලැබුයේ ජුදයින් මඟිනි. මෙම පණිවුඩයෙන් ශු. මැතිව් තුමා උත්සාහ කර ඇත්තේ කිතු සමිඳාණන්ගේ උපත සකල ලෝක ජනතාව සඳහාම සිදුවී ඇති බව කියා පෑමටය. එබැවින් එකී කාලවකවානුවකට පමණක් නොව වර්තමානයේ කිතුනුවන්ට ද ජේසුස් වහන්සේගේ උපතේ යථාර්ථය පෙන්වා දීමට යුතුකමක් ද වේ.

එදා කිතු සමිඳාණන් ලොවට බිහි වීම නත්තලක් වශයෙන් සලකනු ලබන අතර වර්තමාන සමාජයට එම පණිවුඩය මඟින් පවසන්නේ උන්වහන්සේගේ දෙවැනි පැමිණීම මෙනෙහි කරමින් හදවත් නමැති ගවහල් එතුමා පිළිගැනීමට සූදානම් කරන ලෙසය.

කරුණු එසේ නම් එදා ශුද්ධවර මතෙව්, හා ශුද්ධවර ලූක් තුමන් ගෙන ආ පණිවුඩය බෙදා හැරීමට, ප්‍රචලිත කිරීමට අපට පවරා ඇත. දුගී පීඩිත ජනතාව වෙත අහසේ තරුවක් ලෙස පණිවුඩය ගෙන යා යුතුය. එයයි වර්තමානයේ නත්තල.

✍ පැට්‍රික් මාකස්

# බෞද්ධයන් තුළ ඉපදුනු ජේසු සමිඳාණන්

**පුංචි දරුවන් එකිනෙකා පැමිණ ගුරු මව්වරුන් පියවරුන් තමන් අතින් අල්ලාගෙන ප්‍රාථමික අංශය වෙත යන්නට විය. මගේ ද අත් අල්ලා ගත් පුංචි දුවා පුතුන් කීප දෙනෙකු ප්‍රාථමික අංශයේ පන්ති කාමරයක් වෙත ගෙන යන්නේ පස්වන ශ්‍රේණියේ දුවා දරුවන්ගේ ප්‍රදර්ශනය හා එම දරුවන් ද්විතික අංශයට පිය මැනීමේ අවස්ථාව වෙනුවෙන් පැවැත්වෙන තේ පැන් සංග්‍රහය වෙනුවෙනි.**

රාජකීය පණ්ඩිත ගරු කලුගහකඳුරේ විජිත හිමි විදුහල්පතිනි සුදර්මා මහත්මිය, නි. විදුහල්පති රණසිංහ බණ්ඩාර මහතා හා ප්‍රාථමික අංශ ප්‍රධානි මල් කාන්ති මහත්මිය ඇතුළු ගුරු මණ්ඩලය ද දුවා දරුවන් හා දෙමාපියන් ද මේ අවස්ථාවට සහභාගි වී සිටි අතර පිළිගැනීමේ උත්සවයෙන් සුළු මොහොතකට පසු මා හට ආරාධනා කළේ මා කිසිසේත් නොපැතූ යමක් විවෘත කිරීමට ය. ඒ මා දැස නොගැසුනු කුඩා ගවලෙන හා නත්තල් ගස විවෘත කිරීමට ය. ළමුන් හයසිය පනහක් පමණ සිටින නුවරඑළිය ශ්‍රී සේනානන්ද මහ විදුහලේ කිතුනු ළමුන් සිටිනුයේ පහළොස් දෙනකු පමණි. එවැනි පරිසරයක මා ලැබූ මේ සුවිශේෂී අත්දැකීම බෞද්ධ පරිසරයක් තුළ කිතුනුවකු ලෙස මට ලැබුණු අපූරු අත්දැකීමක් විය. ඒ සඳහා වැයවුනු කැපවුනු හැමටම උපහාරයක් පිණිස



මෙම සිද්ධිය මෙසේ සටහන් කරන අතර අප තුළ ද සැබෑ අවංක වෙනස් වීමක් සිදුවන තරමට සාමය, සමඟිය ගොඩනැඟිය හැකි බව පසක් කරගත හැකිය.

✍ නි. වි. ඒ ප්‍රැන්සිස්
නුවරඑළිය ශ්‍රී සේනානන්ද විදුහල

# සමිඳුන් හඳුනන නත්තලක්

**කිතුනුවන්ට නත්තල තවත් එක් උත්සවයක් පමණකි නොසිතා, ක්‍රිස්තුන් වහන්සේ දැන හැඳින ගෙන සමරන්නට අදහසක් තිබිය යුතුය. කිතු උපත ආගමික වටිනාකමක් ඇති වන්දනාමාන පිදිය යුතු ශුද්ධවත් දිනයකි. ක්‍රිස්තුන් වහන්සේ ධර්මිෂ්ඨ ශුද්ධවත් ජීවිතයක් ගත කොට ඒ ඔස්සේ අපව කැඳවා ජනතාව දෙවියන් වහන්සේගේ පංගුකාරයන් කරති.**

සමිඳුන්ගේ උපත සරළව සැහැල්ලුවෙන් කතා කළ හැකි උපතක් නොවේ. ඒ සඳහා දෙවියන් වහන්සේ සකස් කළ පසුබිමක් විය. සමිඳුන්ගේ ජීවිතයේ හැම අඳෝනාවකටම හේතුකාරයන් අප බව අමතක නොකළ යුතුය. අපගේ පාපයන් පවිත්‍ර කොට, පාප කමා කර නිහතමානීකම, බැහැපත්කම උදෙසා සාම සිතින් නම්‍යශීලිත්වයට ඇඩි සිත් මෘදු කළේය. දේව වචනය ජනතාවට බෙදා දෙමින් දේවභය, භක්තිය, ශ්‍රද්ධාව, ප්‍රඥාව, ශුද්ධවත් භාවය, සඳහා බුද්ධිය අවදි කළේය. ආදරය, කරුණාව, දයාව, ප්‍රේමය, පරිත්‍යාගය හදවත් වල රෝපණය කළේය. අයුක්තිය අසාධාරණය පිටු දැක සත්‍යතාවය උදෙසා මඟ පෙන්වීය. ඇදහිල්ල තුළ අනුශාසනා, අවවාද අනුව අනුගාමිකව පංගුකාරයන් වී ඇත්නම් ඒ හදවත් සැමදා සමිඳුගේ උපත සමරති.

✍ මිකි ප්‍රනාන්දු

# නත්තල තුළින් අරුත්බර දිවියකට



**අප සිහිපත් කරන බිළිඳු උපත හුදෙක් බිළිඳු උපතක් පමණක් නොවන බව සිහි තබා ගත යුතුය. එය ආදරයෙහි උපතකි. දයා කරුණාවේ පලසකි. උපතකි. අසමසම ජීවිත පරිත්‍යාගයක උපතකි. බාහිර අංග වලින් පිරුණු, අභ්‍යන්තර හර පද්ධතිය වර්තමානයේ බිඳ වැටී ඇත. කිතු සමිඳුන් මෙලොවට වැඩියේ ආධ්‍යාත්මික සංවර්ධනයට සහය වන උත්තුංග ධර්මයක් රැගෙනය. සාම පණිවුඩය රැගත් අනුපමේය දර්ශනයක් ද දෝතින් රැගෙනය.**

මිනිස් සමාජය අන්‍යෝන්‍ය දයාවෙන් යුක්තව මානව හිතවාදීන් බිහිකරලීමටය. කිතු හිමියන්ගේ දර්ශනය ලෞකික වටිනාකම් වලට, මිනුම් දඬු වලට ගෝචර වන්නේ නැත. අප මුළු සිතින් දෙවිඳුන්ට දයාවන්ත දිවි පෙවෙතක් ගත කළ යුතුය. අව්‍යාජ ප්‍රේමය පවතින තැන ස්වාර්ථයට ඉඩක් නැත. මිනිස් ජනතාවට අවංකව ප්‍රේම කරන කල මිනිස් සිත් සතන් තුළින් වෛරය, ක්‍රෝධය, කුහක බව, තෘෂ්ණාව පළා යයි. එයට විකල්ප වශයෙන් ආදරය, සමාව දීම, පරිත්‍යාගය හදවත් තුළින් වෑහෙනු ඇත. ජේසු සමිඳාණන්ගේ දහම මානව දයාවේ අඩිතාලමයි. ඉවසීමේ උල්පතයි. පරිත්‍යාගයේ මූලාරම්භයයි. ආදරය පවතිද්දී අන්‍යයන්ට සවන් දීමට, ඔවුන්ගේ ආකල්ප ඉවසීමට හැකියාවක් නිර්මාණය වේ.

එහි ප්‍රතිඵලයකි, විවිධ ආගම් අදහන සහෝදර සහෝදරියන් සමඟ විවිධාකාර සංස්කෘතික පසුතල තිබෙන්නන් සමඟ ජීවත් වන්නට පහසු වේ. අප වෙසෙන සමාජය තුළ වෛරය දිනෙන් දින වර්ධනය වේ. දයාව, අනුකම්පාව, පරිත්‍යාගය, සමාව දීම, පරෝපකාරය යන සංකල්ප අර්ථශූන්‍ය ප්‍රලාප බවට පත් වී ඇත. ක්‍රිස්තුන් වහන්සේ විසින් දෙසන ලද දෙව් දහම අපට ඉදිරිපත් කරන දෙයක් ඇත. එනම් මෛත්‍රියෙන් දයා කරුණාවෙන් ලොව දෙස අවධානය යොමු කිරීමටය. ජීවත් වන ලෙසය. අප තුළ පෞද්ගලික ශුද්ධවන්තභාවය පමණක් සාමයේ කුමරුන් වෙත කිතු සමිඳුන් බලාපොරොත්තු නොවේ. එය පවුලෙන් පවුලට, ගමින් ගමට ආදි වශයෙන් විශ්ව ව්‍යාප්ත කළ යුතු වන්නේ ය.

පාරිභෝගිකවාදය තුළින් සැඟවී පවතින කිතුනු වටිනාකම් ජීව ගන්වන්නට ඉතා උචිත සමයකි, නත්තල් සමය. කිතු සමිඳුන් අපට ඉදිරිපත් කරන සාමයේ හඬ තුළින් පන්නරය ලබා ගනිමින් ඉතා ශක්තිමත් පදනමක් මත ජීවිතය ගොඩනඟා ගන්නට අප උත්සුක විය යුතුය. ඒ හෙයින් නිරතුරු දෙව් වදනින් පිබිදී සැමදා නත්තලක් අත්දකිමු.

✍ මලින්ත බෝපෙආරච්චි දළුගම - කැලණිය.

## නත්තලේ ඔහු ගියා


සුසිත් දනන් හට සාමය බෙදන — නියා
ගම රට අතැර ආවා දුර ගමක් — සොයා
රජෙකු වගේ ඉන්නට හැකි වුනත් — එයා
හැම මොහොතකම වෙහෙසුනි දුප්පතුන් — සොයා

හිසට සෙවන නැති අය හට සෙවන — දුනි
ගතට වතක් නැති අය හට බෙදා — දුනි
නෙතට කඳුළු ගත් අය සනසා ති — බුනි
සිතට සුවය නැති අය සුවපත් කෙ — රුනි

මිනිසුන් අතර නොමිනිස්කම් ඇති — අයගේ
මිතුරන් නොවේ සතුරන් වට කරපු — රඟේ
අඳුරෙන් එළිය වහගන්නට කරපු — දඟේ
මැඳුරෙන් ඔහු ගියේ අන් සතු පැළට — වගේ

තලාවේ
ඩබ්ලිව්. ඩී. මැටිල්ඩා අධිකාරම්

විශේෂාංග



# මවකගේ කඳුළු කථාවක්

**ප්‍රීතියෙන් දිදුලන මේ නත්තල් සමයේ මුළු ලොවම කිතුනුවන් අන් ආගමිකයන් සමග ද එක්ව සාමය සතුට විසුරුවද්දි එක් කාන්තාවක් පමණක් මේ ලෙස කඳුළු විසුරවමින් සිටින්නීය.**

වර්ෂ 1969 මැයි මස 19 වන දින මගේ එකම පුතා මෙලොවට බිහිවෙලා අප පවුලේ සැමට දුන් සතුට මෙතෙකැයි කියා නිමකළ නොහැක. වර්ෂ 1980 ජනි මස 27 වන දින මගේ පුතා වූ ජූඩ් ප්‍රසන්න ප්‍රියන්ත ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමේ උත්සවය අප පවුලේ සතුට සමග නිවසේ මංගල සිරි ගැන්වීය. සුදු අත් කොට කමිසයෙන් හා සුදු කොට කලිසමකින් සැරසුන මගේ පුත් රුවණගේ දෙපය වැසුනු කළු සපත්තු යුවළින් මා දුටුවේ මහා තේජසින් විරාජමාන වූ ලස්සනම ලස්සන පුංචි මනාලයෙක් විලසිනි. මගේ දෙනෙත් මටම අදහාගත නොහැකි විය.

මේ පුංචි මනාලයා වර්ෂ 1981 මාර්තු මස 20 වැනි දින හලාවත ශාන්ත මරියා ඉංග්‍රීසි විදුහලේ පැවති අධ්‍යාපනික ප්‍රදර්ශනයට තම සොහොයුරියන් දෙදෙනා සමඟ සහභාගිවීමෙන් අනතුරුව එදින රාත්‍රි 10.30 ට පමණ නිවසට පැමිණ "අම්මේ මට සුදු පුතේ කියන්න කෝ" කියමින් උන්මාදනීව මාව වැළඳගෙන සිප සනසා වර්ෂ 1981 මාර්තු මස 21 වන දින අළුයම 5.30 ට පමණ අප කාටත් හොරා දෙව් මව් තුරුළට අවතීර්ණ වූයේ අප සැම කඳුළු අගාධයක සතපවමිනි. රන් රුවක් බඳු මගේ එකම පුතු ජේසු සමිඳුගේ කැඳවීම අනුව මේ ලෙස අප අතරින් සදහටම වෙන් විය.

ජේසු අම්මා මරිය මව් තුමිය තම එකම පුතා ගවලෙනක බිහි කළා සේම මම මගේ එකම පුතුව හලාවත රජයේ රෝහලේ බිහි කර වැඩුවේ පොල් අතු සෙවිලි කළ පුංචි පැල්පතකය. කාලයාගේ ඇවෑමෙන් වයසින් වැඩෙද්දී මගේ පුතත් අකුරට ගිය වකවානුවේ දී මගේ පුතාගේ පාසල් මිතුරන් "ප්‍රසන්න ලස්සනට ඇඳලා ලොකු බෑග් එකක් කරේ එල්ලගෙන ලොක්කා වගේ ඉස්කෝලේ ආවාට ඔයාට තියෙන්නේ කුරුළු කූඩුවක් වගේ ගෙයක් නේද" යනුවෙන් සමච්චල් කළ අවස්ථාවන්හිදී "මගේ අම්මා හරිම ශක්තිමත් සිතූ දේ ඒ විදියටම කරනවා, හලාවතටම තියෙන ලස්සනම ගෙය හදනවා ඔයගොල්ලන්ට දැක ගැනීමට වැඩි කාලයක් යන්නේ නැහැ" යනුවෙන් පවසා ඇත්තේ ස්ථිර සාර බවකිනි. මගේ පුතාගේ ආශාව ඔහුගේ දෙනෙතට අසුකර දීමට වූ මගේ ප්‍රමාදය මගේම අවාසනාවකි. මගේ පුතා අප සැමගෙන් සදහටම සමුගෙන වසරක් පිරෙනවාත් සමගම ඔහුගේ ආශාව පරිදි හලාවතම නැති නිවසක ලස්සන විහිදන්න ආරම්භ කළ නමුත් සම්පූර්ණ කිරීමට පෙරාතුව පුතුගේ පියා මගේ ආදරණීය සැමියා ද ඉතාම හදිස්සියේ දෙව් මව් තුරුළටවන් හෙයින් මම තෙරක් නොපෙනෙනා අඳුරු අගාධයකට පිළිපන් වූයෙමි. කළ යුත්තේ කුමක්දැයි සිහි එලවාගත නොහැකිව උභතෝකෝටික පැනයක මම අතරමං වීමි. සෝ සුසුම් මධ්‍යයේ ජේසු සමිඳුන් අභියස මගේ කඳුළු කථාව කියමින් වැළපෙද්දී ලද පිහිට අනුව සිත ශක්තිමත් කරගෙන හලා / සමූපකාර සමිතියේ සේවයේ යෙදෙමින් ලද විවේක අවස්ථාවන් හිදී ඇඳුම් මසා ලද ආදායමින් මගේ දියණියන් දෙදෙනාට අ.පො.ස. උසස් පෙළ සමත් වන තුරු සිප් සතර ලබා දී යහපත් පුතුන් දෙදෙනෙක් සොයා ආශිර්වාදකාර බන්ධනය නමැති පැන්ඩන පැළඳ වූයෙමි. මගේ දියණියන් දෙදෙනා කුරුළු පැටවුන් වැනි දරු පැටවුන් සමඟ ලස්සන ලස්සන කුරුළු කැදලිවල සතුටින් කාලය ගෙවති. ඒ සතුට දකින මගේ දෙනෙත් සතුටින් පිරී ඇති නමුත් මගේ පුතාව සිහියට නැගෙද්දී මගේ දෙනෙත් අඳුර කරා දිව යන්නේ මටත් නොදැනුවත්වම ය.

මේ වන විට මගේ එකම පුත් රුවන මෙලොවින් සදහටම සමුගෙන වසර 31 ක් පුරාවට කඳුළු සයුරක තනිවම සැතපෙමින් සිටිය දී මගේ නිවසේ විදුලිය පිළිබඳව ගැටලුවකට එක්තරා ගෘහ නිර්මාණ කරුවකුගේ ආධාරයෙන් මගේ නිවසට පැමිණි තරුණයා දරු සෙනෙහසේ කඩතුරාවෙන් මගේ දෙනෙත් ආවරණය කර මගේම පුතු ලෙස මහත් රඟපෑමක යෙදුනේ ය. පුංචිම පුංචි කාලයකින් කිසියම් හේතුන් මත ඒ දරු සෙනෙහසට අවසන් තිත තැබීමට සිදුවිය. ඉන් අනතුරුව හලාවත උඩප්පුවේ හින්දු දේවස්ථානයේ වසරක් පුරා පැවැත්වෙන වාර්ෂික පූජා උත්සවය පවත්වාගෙන යන වෙළෙඳ ව්‍යාපාරයට උපකාර පතා හලාවත බෞද්ධ සිද්ධස්ථානයක ගරුතර ස්වාමීන් වහන්සේ නමක ගෙන් මා කළ ඉල්ලීම අනුව මා හමුවට පැමිණි තරුණයා පුංචිම පුංචි කාලයකින් මගේ දරු සෙනෙහස උපරිමව අත් විඳ මා නොදැනුවත්වම මගෙන් සමුගත්තේ සිත් පිත් නැති ලෙසටය.

අපි දෙදෙනා අතරේ ඈත දුරක සිට පැවත එන අදහාගත නොහැකි තරම් අපමණ බැඳීමක් බෞද්ධ දහම අනුව ඇති බවත්, මා අසනීප වන විට ඔහුත් අසනීප වන බවක් හැඳුම් බරව තෙපළේ ය.

මින්පසු රාත්‍රි කාලයේ දී නිදි නොලබා ඇඳුම් මසා වෙහෙස නොවන ලෙසටත්, අසනීප අවස්ථාවන්හිදී නිසි ප්‍රතිකාර ලැබ විවේකීව කාලය ගත කරන ලෙසටත් අවවාද අනුශාසනා කර මින්පසු මුදල් අවශ්‍ය වූ විට ඔහුගෙන් මුදල් ඉල්ලන ලෙසටත් එම තරුණයා මට අණ කළේ මගේම පුතා විලසටය. නිතර නිතර දුරකථනයෙන් කථා කළ ඒ හඬ දැන් නිහඬය. මට මාවම දැන් ප්‍රහේලිකාවකි.

අහෝ! ජේසු සමිඳුන් මේ ලෙස මා පරීක්ෂාවන්ට ලක්කරනවා ඇතැයි මම සිතමි. අන් දරුවන් තුළින් මගේ පුතා සොයා යාම මිරිඟුවක් පසු පස දිව යාමක් බැව් දැන් මට සක් සුදක් සේ පැහැදිලිය. ජේසු අම්මා තම එකම පුතා දුක් වේදනා රැසක් මධ්‍යයේ කුරුස ගසක අවසන් සුසුම් හෙළුව මොහොත විඳ දරා ගත් සේක. එය මෙනෙහි කරමින් මම මගේ සිත පාලනය කර ගැනීමට උත්සාහ කරමි.

"අහෝ සර්ව බලධාරි වූ දෙවි පියාණන් වන ජේසුනි, මා තුළින් ගලායන ඔබවහන්සේගේ ප්‍රේමයේ මහිමයෙන් මේ නත්තල් සමය මගේ සිතට සැනසිල්ල සතුට ගෙන දේවා! ආමෙන්

✍ **ලුසිල්ඩා ප්‍රනාන්දු**
හලාවත

# නත්තලේ සැබෑ අරුත

**එදා බෙත්ලෙහෙම් පුරයෙහි ගවලෙනක් තිඹිරි ගෙය කර ගෙන මෙලොවට සම්ප්‍රාප්ත වූ ජේසු කුමරාණෝ පසුකාලීනව එවකට තිබූ අධාර්මික පාලනයට පිටුපා උන්වහන්සේගේ සිය ජීවිතයම කැප කළේ පරහට දයාව වෙනුවෙනි. එදවස පැවති දූෂිත සමාජ ක්‍රමය නැති කිරීමට මැදිහත් වන්නේ රජ මැදුරටත් දිළිඳු නිවහනටත් සමානව සියළු දෙනාටම ආදරය, දයාව, ප්‍රේමය දක්වමින් අවිහිංසාවෙන් ජනතාව දිනවීමටය.**

එම ජීවිත වෙනස් කිරීම සඳහා කිසි විට අවිහිංසාවෙන් තොරව අධර්ම ක්‍රියාවන් අනුගමනය නොකළහ. හැම විටම එතුමාණෝ ශ්‍රී මුඛයෙන් දේශනා කළ සත්‍යය සකල ජනතාවගේම හිත සුව පිණිස සුචරිතය පාදක කරගෙන කටයුතු කළ බැවින් උන්වහන්සේ කෙරෙහි අචල විශ්වාසයක් හා භක්තියක් ඇතිවීමේ ප්‍රවණතාව නිසා මිනිසුන් පාපයෙන් මිදී සදාචාර සම්පන්න වීමේ භාග්‍යය උදා කර ගනී.

එම නිසාම වසර දෙදහසටත් වැඩි කාලයක් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමය සිහිපත් කරමින් පවත්වන නත්තල් මංගල්‍යය කිතුනු අප ජීවිත තුළ මාංශගත වීමට නම් කිතු තුමන් සමස්ත සත්වයාටම දයාවෙන් ප්‍රේමයෙන් සාමයිකව අවිහිංසාව පෙරදැරි කරගෙන කටයුතු කළ අගය අවබෝධ කරගෙන ඒකාත්මිකව ජීවත් වීම සුබ නත්තල් උලෙළක අර්ථය වේ.

✍ **ඒ. ඩී. සුනිල්**

# ගවහලේ දැහැමියාව

**මේ වසරේ කිතු සමයයි නත්තලයි. නත්තලෙන් කිතුනු අප උගත යුත්තේ "දැහැමියාවයි" බැගෑ බවයි. අද ලොව තුළින් සමුගන්නට යන්නේ ද දැහැමියාව හෙවත් යහපත, ගුණගරුකබව අපට නොරහසකි.**

මේ දිනවල පුවත්පතක් අතට ගත්තොත් පිටු පුරාම මුණ ගැසෙන්නේ, දැහැමියාවට එරෙහිවන සිද්ධීන්මය. කිතුනුවන් වශයෙන් මේ ගැන සිතා බලා, ඊට පිළියම් යෙදීමට අප තවමත් ප්‍රමාද වැඩි යැයි සිතීමට ඉඩ නැත.

මේ වකවානුව දැහැමියාව මිනිස් හදවත් තුළින් දුරස් වී යාමට හේතු බොහෝ ය. මුල්ම හේතුව වන්නේ දෙවි පියාණන් වහන්සේ මිනිස් සංහතියටම තිළිණයක් වශයෙන්, තලෙන්තුවක් වශයෙන් දුන් මේ දේවල් මිනිසා විසින්ම, අනිසි ලෙස භාවිත කිරීම නිසා යයි අපට පෙනී යයි. දෙවි පියාණන්ගෙන් අප ලැබූ හොඳම තෑග්ග බුද්ධි ඵලයයි. එය පරිහරණය සඳහා දී ඇති වස්තුව, ධන සම්පත වන මේ ලෝ තලය අනිසි ලෙස බෙදා ගැනීම වරදකි. ධනවතා දිළින්දා ගැන ද සිතා බලා අන් අයටත් සාධාරණත්වයෙන් බෙදී යන ලෙස කටයුතු කිරීමට ඉටා ගැනීම ඉතාමත් වැදගත් ය. දිළින්දා ද දිළිඳුකමේ ඇලී ගැලී නොසිට අනලස්ව සිතට දිරිය ගෙන කටයුතු කිරීමට වග බලා ගැනීම අනිවාර්යමය. පරිත්‍යාගයේ වටිනාකම පෙනෙන්නේ මෙහිදී ය.

කිතු තුමා මෙලොව පැමිණියේ මිනිසාට මෙලොව ජීවත් විය යුතු, ජීවන රටාව පැහැදිලිකර දීමටය. උන්වහන්සේ ගවහලේදීම එතුමන්ගේ ධර්මය අපට නිහඬවම පෙන්වා දුන් සේක. බැගෑ සිත, නිහතමානී ව, යුක්තියට සාපිපාසය, දයා ගුණය, නිර්මල සිත, සාමය මෘදු ගුණය, මෙවන් සාරධර්ම අපට ඉදිරිපත් කරන්නේ, එදා ගවහලේ උපත ලැබූ ජේසුස් වහන්සේ ම ය. උන්වහන්සේගේ මුළු ජීවිතයම අප වෙනුවෙන් පූජා කළ සේක. දැනුදු අප වෙනුවෙන් කැපවෙමින් ජීවමානව අප සමඟ ගමන් කරන සේක. බිළිඳු ජේසු අප සමඟ වාසය කරන්නට මෙලොවට ආවේ ආධ්‍යාත්මික ධන නිධානයක් පොදි බැඳගෙන ය. මේ නිධානයේ නිදන්ගත වී ඇති තවත් වස්තුවකි, "ලෝක සාමය" මේ තෑග්ග පළුදුකරගෙන ඇත්තේ තම තමන් විසින්ම බව මිනිසාට අමතක වී ගොස් බොහෝ කල් ය. එය නැවත ගොඩනැගීමට කාලය උදා වී ඇති බව වැඩි දෙනාගේ මතයයි.

සිත ලෞකිකත්වයෙන් පිරෙන කොට, සිත ලෝභයෙන් හැකිලෙන විට, පුහු ආටෝපය අප සමඟ පොර බදනකොට, නවීන පන්නය කර පින්නා ගත්තාම, මිනිස් ලෝකයේ "දැහැමියාව" අඳුරු වී යෑමේ දෝෂ දර්ශනය අප ඉදිරියේ ඇත. මේ ගැන ලොකු - කුඩා, උගත් - නූගත් භේදයයක් නැතිවම, එකාවන්ව, දැහැමි අධිෂ්ඨානයක් ගනිමු.

අපේ මේ ලස්සන ලෝකයේ "දැහැමියාව" ගොඩ නැගිය හැක්කේ අපටමය. පෞද්ගලිකවමය. කිතුනුවන් වශයෙන් මෙයට පළමු පියවර ශුද්ධාත්ම වරම් ඉල්ලා ගනිමින් මේ ගමන යාම ආරම්භ කරමු.

ඒ සමගම අපේ සෘණ ආකල්ප පසෙකලා ධන ආකල්ප හෙවත් "හොඳ සිතුවිලි ජනිත කර ගැනීමට උත්සුක වෙමු. එවිට පවුලේ එක එක සාමාජිකයා තුළ සිතුවිලි වෙනස් වී පවුල තුළ, සාමය ගොඩනැගේවි. මුල් වෙනස්වීම තම තමා තුළය. ඊළඟට පවුල, ගම, රට, ජාතිය තුළ සාමය ඇති වී නිතැතින්ම "ලෝක සාමය" බිහිවනු නොඅනුමානය. එසේ නම් ලෝක සාමයේ වගකීම අප එකිනෙකා වෙතම පැවරෙනු ඇත. ඒ වෙනුවෙන් අපි යාච්ඤා කරමු. දෙවි පියාණෝ මුළු මැවිල්ල ආසිරි ගන්වා ලොව නවතාවයකට පත් කරන සේක්වා. නත්තලේ අරුත බාහිර ආටෝපයට වඩා ආධ්‍යාත්මයට මුල් තැන දීම බව මතකයට ගනිමු.

✍ **ගරු මේරි ඉග්නේෂස් පැව්දි සොයුරිය** (ය.එ.නි)

# නත්තලේ යථාර්ථය

**නත්තල් උත්සව සමය අප සියල්ලන් එකාවන්ව ප්‍රීති ප්‍රබෝධයෙන් සමරනු ලැබුවද, එය විශේෂයෙන් කුඩා ළමුන් සඳහාම කැපවිය යුතු බව අප ඉඳුරාම පවසනු වටී. එය යුක්ති යුක්තය. ඊට හේතු සාධකය වනුයේ ජේසු බිළිඳුන්ගේ උපන් දිනය අනුස්මරණය සඳහා එදින යෙදී ඇති බැවිනි.**

දැනුවත්ව හෝ නොදැනුවත්ව තමන් කළ වරද මකාලන්නට මෙලොව එළිය දකින්නට පෙරුම් පුරා සිටින දරු පැටියා විනාශ කරන අම්මලා කෙතරම් දරුණු අයවෙත් ද? එමෙන්ම තමන්ගේ වගකීම භාර ගන්නට එඩිතර නොවන තාත්තලා අද කොතෙකුත් ජීවමානව ඇති නිසාවෙන් මෙවන් නීච අධම ක්‍රියාවන්හි නියැලීම ද අරුමයක් නොවේ. බිළිඳු ජේසු උත්තමයකුගේ උත්පත්තිය සමරන මෙවන් සමයකවත්, එවැනි අධර්මිෂ්ඨයන්ගේ ඇස් ඇරී, සිත් සතන් එකඟ කර ගනිමින්, තම කුස තුළ ජනිත වී ඇති දරුවන් රැක ගන්නට එඩිතරව අදිටන් කර ගත යුතු කාලයයි මේ. නොඑසේ නම් එකී දරුවන්ගේ අකල් මරණ ගැන කෙදිනක හෝ තමන් හට ඊට වන්දි ගෙවන්නට සිදුවනු ඒකාන්තය. ඒ කිම්දයත් මෙලොව එළිය දකින්නට සිටි එම දරුවන් ස්වර්ගයට මොරගසනු නිසාවෙනි.

නව වසරට දරුවන් පාසල් යා යුතුය. ඊට අදාළ විය පැහැදම් එමටය. තම නිවසේ බිරිඳගේ මෙන්ම තමන්ගේ ද දරුවන්ගේ ඕනෑ එපාකම් සොයා බලා, අඩු පාඩුකම් සපුරාලීම ද වැදගත් වන්නේමය. මේ සියල්ල ඉෂ්ට සිද්ධ කර ගැනීම සඳහා ආර්ථිකය බලපායි. එබැවින් අර පිරිමැස්ම මුල් තැන ගනී. දරුවන්ගේ විනෝදාංශ වලට පවා වියපැහැදම් කිරීමේදී දෙපාරක් සිතනු වටී. මෙයින් දරුවන්ගේ රස වින්දනයට බාධා කිරීමක් අපේක්ෂා නොකෙරේ. එහෙත් බොහෝ අවස්ථාවල අනවශ්‍ය වියදම් කපා හැරිය යුතුමය. එය ඔවුන්ගේම සුභ සිද්ධිය පිණිස වේ.

සැමදා නත්තල් නැතැයි කියමනකි. එබැවින් එදා ගව ඔරුවේ ඇරැඹි පළමු නත්තල සිහියට ගනිමින් දුප්පත් ගොපළු එඬේරුන් සිහියට නගමින් සාමයේ කුමරුන්ගේ පැමිණීම සැමරීම තුළින් කබලෙන් ලිපට ඇද නොවැටී, කුඩා දරුවන් සනසවාලීමේ පරමාර්ථය මුදුන් පමුණුවාලමින් ඔවුන් හට හැකි පමණින් විනෝදය ලබා දෙමින් පවුලේ සාමය, සමාදානය, සහජීවනය රජ කරවන්නට උත්සුක වීම අප සැමගේ පරම යුතුකම වේ.

එබැවින් නත්තලේ නියම යථාර්ථය උකහා ගනිමින් ජේසු බිළිඳුන්ගේ උපත සමරන්නට අදිටන් කරගනිමු.

✍ **එල්. එස්. නෙල්සන් ප්‍රනාන්දු**
ජා-ඇල

ජනතා හඬ

# වැලිකඩ බන්ධනාගාරයේ දෙව්මැඳුර ඉවත් කරන්නේ කාගේ උවමනාවටද?

**කතුතුමනි,**

බොරැල්ල වැලිකඩ බන්ධනාගාරය ඇතුලත පිහිටි දේවස්ථානය අයින් කිරීමට දරණ උත්සහයක් පිළිබඳව කතෝලික සභාව දැඩි විරෝධයක් දක්වන බව වාර්තාවේ. එම දේවස්ථානය බලා හදාගන්නා බන්ධනාගාර රැඳවියකට බන්ධනාගාර නිලධාරියකු විසින් පහරදී ඇති බවට තමන් වෙත එහි රැඳවියන් විසින් පැවසූ බවට බන්ධනාගාර උපාධ්‍ය ගරු හිලරි පීරිස් පියතුමා දක්වා ඇත.

මෑතකදී මෙහි රැඳවූ රැඳවියන් බුරුතුපිටින් ඝාතනය විය. ඇත් විලංගු දමා වෙඩි උණ්ඩයනට භාජනය වූවන්ගේ අඳෝනා කෙඳිරිලි කෑගැසීම් නොඅනුමානව අවට වැසි ජනතාවටත් අප දේවස්ථානයටත් නොවරදවාම ඇසෙන්නට ඇත. ඔවුන්ගේ ලේ මස් වැදලි වලින් වහනය වූ දුක් සුසුම් අවට සුලඟෙ දින කිහිපයක්ම හඹායන්නට ඇත. මෙවැනි බේදවාචකයන් හිරගෙ දර පමණක් නොව අද අප රටේ සමාජයේම සුලබවී ඇත. අවනීතිය, සමාජ විෂමතා කාමසුඛල්ලිතාවය රජවී ඇත. උතුරේ වැරදි මග යැවූ බන්ධනාගාරගත වූ තරුණයන්ද ලේ හලමින් නිතර රෝහල්වල මරණ මංචකයේය. මෙම බේදවාචකයනට අප මුළු සමාජයම වගකිව යුතුය. විශේෂයෙන් වැදගත් යැයි සැළකෙන ධනවතුන්ද ප්‍රභූවරුන්ද නිළධාරී බලවතුන් හා මහත්වරුන් වෙතද එම වගකීම වැඩියෙන් ඇත.

**ජයසිරි සමරතුංග**
දළුගම

# නත්තලට වැරදි අරුතක් ලබාදීම හරිද ?



**කතුතුමනි,**

නත්තලට වැරදි අර්ථකථනයක් දෙමින් 2012 දෙසැම්බර් මස 13 වැනි බ්‍රහස්පතින්දා දිනපතා ලංකාදීප පවුත්පතේ 06 වැනි පිටුවේ සීතලෙන් උදාවෙන ජනේරුව නමින් ලිපියක් පළවී තිබිණි.

කණගාටුවෙන් වුවද පැවසිය යුත්තේ ශ්‍රී ලාංකික කිතුනු භක්තිකයන්ගේ නත්තල පිළිබඳව අර්ථ දක්වා තිබූ ආකාරය ජාතික පුවත්පතක් මගින් අවිචාරවත් අන්දමින් සොයා බැලීමකින් තොරව කර ඇති බවයි. එහි නත්තල පිළිබඳව මෙසේ සඳහන්වේ.

ලංකාවේ කිතු දහම අදහන ලබ්ධිකයන් නම් අවුරුද්ද ලෙස සලකන්නේ ජනවාරි පළමුවැනිදාය එසේවීමට ආගමික කරුණක් ද බලපායි. දෙසැම්බර් 25 වැනිදා මළවුන් අතරට ගිය කිතු සමිඳාණන් මළවුන්ගෙන් නැගිට්ටේ ජනවාරි පළමුවැනිදා වීමය.

මාගේ ගැටළුව නම් එම ලිපිය පත් ඉරු කියවීමකින් තොරව පළකර තිබේද? නැතහොත් සංස්කාරක හෝ කර්තෘ මඬුල්ල ලිපි පිළිබඳව සොයා බැලීමකින් තොරව කතෝලික අපගේ නත්තල හැල්ලුවට ලක් කළාද?

හිතාමතාම කිතුනු අපගේ මංගල්‍යන්ට වැරදි අර්ථකථනයක් දෙන්නට තැත් කරනවාද? එම ලිපියට දුන් ප්‍රසිද්ධියම දෙමින් නැවත එය නිවැරදි කළ යුතු නොවන්නේද? විනිශ්චය කිතුනු ඔබට බාරයි.

**ලලිත් දීපාල් ප්‍රනාන්දු**
නෙළුම්පිටිය - තිඹිරිගස්කටුව

# ශ්‍රී ලංකාවේ දිනකට නීති විරෝධී ගබ්සාවන් 650 ක්



**කතුතුමනි,**

ධර්ම ද්වීපය යනුවෙන් හඳුන්වනු ලබන අප රටේ සමාජ පර්යේෂකයන් විසින් ගබ්සාවන් පිළිබඳ සිදුකර ඇති පර්යේෂණයන්ට අනුව දිනකට මෙරට ළදරුවන් 3 දෙනකු උපත ලබන විට තවත් ළදරු කලල 2 ක් ගබ්සා කෙරෙන බව අනාවරණය වී තිබේ. මෙම පර්යේෂණ වලදී රැස් කරගෙන ඇති දත්තයන්ට අනුව දිනකට මෙරට සිදු කෙරෙන නීති විරෝධී ගබ්සාවන් සංඛ්‍යාව 650 - 750 අතර සංඛ්‍යාවකි.

එමෙන්ම, මෙරට දරුවන් දෙදෙනකු සිටින විවාහකයන් අතරින් ගබ්සාවන් කර ගැනීම සඳහා පවතින ඉල්ලුම වැඩි වෙමින් පවතින බව ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය පවසයි. පවතින ආර්ථික දුෂ්කරතාවන්. මත තවත් දරුවකු හදා වඩා ගැනීමට නොහැකි වීම, අවශ්‍ය පමණ දරුවන් සිටීම හා දෙවැනි දරුවා වයසින් අඩුවීම, මෙසේ ගබ්සාවන් කර ගැනීමට පෙළඹෙන විවාහක කාන්තාවන් ඉදිරිපත් කරන නිදහසට කරුණු බව එම සංගමය පෙන්වා දෙයි.

තවද, මෙරට අඩු වයස් කාණ්ඩවල පසුවන යෞවන යෞවනියන් අතර සිදුවන විවාහ සංඛ්‍යාව වැඩි වෙමින් පැවැතීම ද අනවශ්‍ය ගැබ් ගැනීම් හා ගබ්සාවන් ඉහළ යාමට හේතුවක් වී ඇති බව පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂිකා තුමිය පවසන්නීය.

මෙම කරුණු කාරණා සැලකිල්ලට ගෙන බලන විට ගබ්සා නීතිය තව දුරටත් පාලකයන් විසින් ලිහිල් කළහොත් මෙරට අම්මා වරුන්ගේ කුස තුළ උපදින්නට හිමිකම් ලබන වටිනා මිනිස් ජීවිත වලට යන කල දසාව කුමක් වේ දැයි සිහි නුවණක් ඇතිව මෙලොව උපදින්නට වාසනාව ලද උතුම් මිනිසුන් ලෙස අප වඩාත් බැරෑරුම් ලෙස සිතා බැලිය යුතුය. එමනිසා පාලකයන්ට මෙම අමානුෂික පාපතර පනත හකුලා ගන්නා ලෙස බල කරමින් දෙවියන් වහන්සේගේ නාමයෙන් පෙළ ගැසෙමු.

**ලූෂන් ෂර්ලි එඩ්වඩ්**
ගෝනවල

# දේව මෙහෙයකදී අපි එකිනෙකාට සාමය පතන ක්‍රමවේදය නිවැරදිද ?

**කතුතුමනි,**

අපි දේවස්ථානයක් ලෙස පිළිගන්නේ දෙවියන් වහන්සේ ජීවමානව වැඩවසන ගෘහයක් ලෙසටය. බාල, තරුණ, මහළු, දුප්පත්, පෝසත්, උසස්, පහත්, දිළින්දා, පොහොසතා, උගතා, නූගතා, වංගාධිපතියා. කුලහීනයා යන සියළුම භේද වලින් තොරව සැම අයකුටම එකම වහලක් යට සමතැන දෙන තැන, භේදයක් නොමැතිව සළකන එකම ස්ථානය දේවස්ථානයය. ඒ දෙවියන්ගේ ගෘහය සැමටම විවෘත නිසාය. ඒ දේව ගෘහය තුළදී දෙවියන් වහන්සේ නිරතුරුව අප සමග රැඳෙන බවටත්, අප දෙස නිතරම බලාසිටින බවටත් අප තුළ පවතින විශ්වාසය නිසාය. එම දේව ගෘහය තුළද අප කරන සැම ක්‍රියාවක්ම, අප සිතන සැම සිතුවිල්ලක්ම අව්‍යාජ විය යුතුය.

කොළඹ පදවියේ එක්තරා දේවස්ථානයක ඉරුදින දේව මෙහෙයකට හදිසියේම මට සහභාගි වන්නට සිදුවූයේ වෙනත් ගමනක් යන අතරතුරදීය. එම දේව මෙහෙයට සහභාගි වී සිටි කිසිවෙකුද මා හඳුනන්නේ නැත. දේව මෙහෙය තුළදී පූජා ප්‍රසාදි තුමා 'අපි එකිනෙකාට සාමය පතමු' ඔබට සාමය වේවා යැයි පැවැසූ විට මා දැත් වැඳ දෙපස සිටි දෙදෙනාට සාමය පතනට සූදානම් වූ විට දෙදෙනාම මා වෙතට හැරී අතට අතදී මගේ දෙනෙත් දිහා බලාගෙන සිනාමුසුව, ඉතාමත්ම සුහදශීලීව මට සාමය පතන ලදි. එය මට නුහුරු අත්දැකීමක් වූයේ දැත් එක්කොට වැඳ සාමය පතන්නට අපගේ දේවස්ථාන වලදී පුරුදුව සිටි නිසාය.

බොහෝ දෙනෙකු සිනා මුසුව දැස දෙස බලා වැඳ සාමය පතනවා වෙනුවට දෙනෙත් වසාගෙන දැත පමණක් අදාල පුද්ගලයා දෙසට හරවා කිසිදු වචනයක් පවා නොපවසමින් බොරු සාමයක් පැතීම විහිළුවට කාරණයකි. එම ක්‍රියාව තරහ කරුවකුට පියතුමාගේ වචනය නිසාවෙන් ඇපයෙන් ගැලවීමට කරන කාරියකට සමානය. කෙනෙකුට සාමය පැතීමේදී හෝ සුබ පැතීමකදී අව්‍යාජවම අපි එම පුද්ගලයා දෙසට හැරී ඔහුගේ හෝ ඇයගේ දෙනෙත් දෙස එක එල්ලේ බලා, සිනා මුසුව, සුහද ශීලිව සාමය හෝ සුබ පැතීම නිවැරදිම ක්‍රමවේදය බැව් මගේ වැටහීමයි.

නමුත් අභාග්‍යයකට මෙන් දේවස්ථානයක් තුළදී පවා අප දෙපස සිටින්නන්ට 'සාමය' පතන්නේ බොහෝවිට දෙනෙත් වසාගෙන අත් දෙක පමණක් අදාල පුද්ගලයා දෙසට හරවා ඕනෑවට එපාවට මෙන් 'ඔබට සාමය වේවා' යන පද තුන හෝ මුමුණන්නේ නොමැතිවය එම ක්‍රියාව සත්‍ය වශයෙන්ම අප අපව මෙන්ම දෙවියන් වහන්සේවද රැවටීමකි.

විශේෂයෙන්ම දේව මෙහෙයක් තුළදී සිදුවන මෙම අර්ථාන්විත ක්‍රියාව පිළිබඳව ගරු පූජාප්‍රසාදි තුමන්ලා විසින් දේව මෙහෙයයන් තුළදීම සැදැහැවතුන් දැනුම්වත් කොට දේව මෙහෙය තුළදී නිවැරදිව එකිනෙකාට සාමය පතන ක්‍රමවේදයක් කියාදී සැදැහැවතුන් දැනුවත් නොකරතහොත් අපි දෙවියන් අබියසදී පවා එකිනෙකාට සාමය පැතීමද සමච්චලයට කරුණක් වනු නොඅනුමානය.

**එම්. ජෝ පාරිස්**
වැලිවිට

# ආගමික කටයුතු වලට මත්පැන් අවශ්‍යමද?




**කතුතුමනි,**

අද බොහෝ තරුණ පිරිස් මංගල්‍ය තොරණ සෑදීමේ සිට සියළුම සංවිධාන කටයුතු වල මුල්තැන දෙන්නේ මත්ද්‍රව්‍ය වලටයි. මෙය බොහෝ කණගාටුවට කරුණකි.

මේ නත්තල් කාලයේ අප නිවෙස්වල මෙන්ම දේවස්ථාන භූමිය ඉදිරිපිටත් නගර මැද, මහපාරවල් අයිනෙත් විශාල ගවලෙන් නිර්මාණය කරති. එය ජේසුතුමාගේ උපත සිහිග න්වන හොඳ නිර්මාණයක් වුවත් අද තරුණ පිරිස් එය නිර්මාණය කරන්නෙත් ගවලෙන තුළ මත්පැන් භාවිතයේ යෙදෙමිනි. ගවලෙන තැනීම ආරම්භ කළ දවසේ සිට දෙසැම්බර් 24 මධ්‍යම රාත්‍රිය දක්වා ගවලෙන තුළ මත්පැන් පානය කර ඒ රාත්‍රිය තුළ ශු. පවුලේ ප්‍රතිමා ඇතුළු අනිත් සුරුවම් තබා ගවලෙන සරසති. නැවත නත්තලින් පසු ගවලෙන් අස් කිරීමේදි සිදුවන්නෙත් ඒ ක්‍රියාවමයි.

ගවලෙන් ගලවපු තැන මාස ගණනක් යනතුරුත් හිස් බියර් ටින්, සිගරට් පෙට්ටි, හිස් අරක්කු බෝතල් දකින්නට ලැබීම කණගාටුවට කරුණකි. මේවා අන්‍ය ආගමිකයින්ට අප දෙන ආදර්ශද කියා අපම විමසා බලමු. ජේසුතුමන් මෙලොව එළිය දුටුවේ මෙවන් ගවලෙනක් තුළ නොවෙයි. එසේ නම් අප මේවා නිර්මාණය කිරිමේදී මත්ද්‍රව්‍ය වලින් තොරව නිර්මාණය කිරීමට සිතට ගනිමු.

**ක්‍රිශාන්ත ප්‍රදීප්**
වැලිවේරිය



දිව්‍ය බිළිඳාණන් රජුන්ට ප්‍රත්‍ය

# ශාස්ත්‍රවන්තයන් සොයා ගෙන ගිය තාරකාව කුමක් ද?

"පෙරදිග දී ඔවුන් දුටු තාරකාව, ළදරුවා උපන් තැනට අවුත් ඉහළින් නවතින තුරු, ඔවුන්ට පෙරටුවෙන් ගියේය. තාරකාව දැක ඔව්හු අතිශයින් ප්‍රීති ප්‍රමෝද වූහ." (මතෙව් 2:9-10).

මෙහි මතෙව් තුමා සඳහන් කරන තාරකාව කුමක් ද? එය සාමාන්‍ය තාරකාවක් ද? වල්ගා තාරකාවක් ද? සුපර්නෝවාවක් ද? (එනම්, ස්කන්ධයේ ස්ඵෝටනයක් නිසා දීප්තිය ඉතා වැඩිවන තාරකාවක්). එසේත් නැත්නම් ග්‍රහයෝග යක් ද? (ග්‍රහලෝක කිහිපයක් එකට බැඳී ඇති ලෙස පෘථිවි වාසීන්ට පෙනී යෑම).

ක්‍රි.ව. පළමු වන ශත වර්ෂය තුළ මැද පෙරදිග ප්‍රදේශය තුළ ජුදෙව්වරුන්ගේ රජගේ උපත ප්‍රකාශ කරන තරුවක් ගැන සඳහන් වීම සහ ශාස්ත්‍රඥයන් විසින් එම තරුවේ ආධාරයෙන් උන්වහන්සේව සොයා ගෙන යෑම පුදුමයට කරුණක් නොවේ. වර්ජල් නම් ලතින් ලේඛකයාට අනුව ඊනියාස් නම් සෙන්පතියාට රෝම නගරය ගොඩනැගිය යුත්තේ කොහේද කියා තාරකාවක් විසින් මඟ පෙන්වන ලදි. ෆ්ලාවියස් ජොසෙෆස් නම් ජුදා ජාතික ඉතිහාසඥයා ක්‍රි.ව. 70 දී ජෙරුසලම රෝම හමුදාව විසින් විනාශ කිරීමට පෙර එහි අහස් තලයේ මතු වූ තාරකාවක් ගැනත්, මුළු අවුරුද්දක් පුරාම පායමින් තිබූ වල්ගා තාරකාවක් ගැනත් සඳහන් කරයි.

ඔහු ඒ ගැන මෙසේ ලියා ඇත; "දෙවියන් වහන්සේ මනුෂ්‍යයන් උදෙසා සැලකිල්ලක් දක්වන සේක. සියලු ආකාරයේ පූර්ව නිමිති මඟින් උන්වහන්සේ සිය ජනතාවට ගැලවීමේ මාර්ගය පෙන්වා දෙන සේක." එමෙන්ම ඔහු ජුදා ආගමේ විශ්වාසයක් වූ, "ඔවුන්ගේ රටේ පුද්ගලයෙක් යම් දවසක ලෝකයේ පාලකයා වන්නේය" යන අදහසට ඉහත කරුණ සම්බන්ධ කරන්නේ ය.

සෑම පුද්ගලයෙක්ම උපදින විට එම පුද්ගලයාට අදාළ තාරකාව බැබළීමට පටන් ගන්නා බවත්, එම පුද්ගලයා මිය යන විට එය ක්‍රමයෙන් නොපෙනී යන බවටත් ජනප්‍රියව පැවති මතය රෝම ජාතික ලේඛකයකු වන ප්ලිනි විසින් විවේචනයට ලක් කරයි. කරුණු එසේ වුවත් ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ උපත සහ මරණය විශ්වයේ සලකුණු මඟින් පෙන්නුම් කරන බව ඉතා ප්‍රචලිතව පැවති මතයකි.

සිසෙරෝ වාර්තා කරන අන්දමට, එපීසියේ ඩයනා දෙවඟනට කැපවූ මහා දේවාලය ගින්නෙන් දැවී යෑමෙන් පසු පර්සියානුන් අතර ප්‍රඥාවන්තයන් සහ දැන උගත්කම් ඇති අයගේ මතය වූයේ මෙම සිද්ධිය නිසා ආසියාවට විශාල හානියක් සිදු කරන පුද්ගලයකු බිහිවන බවයි. එම පුද්ගලයා වෙන කවුරුත් නොව මැසිඩෝනියාවේ මහා ඇලෙක්සැන්ඩර් බව පසුව පෙනී ගියේ ය.

එමෙන්ම ක්‍රි.ව. පළමුවන සියවසේ රෝම අධිරාජයෙක් වූ නීරෝ (ක්‍රි.ව. 54-68), රාත්‍රී කිහිපයක් තිස්සේම පායා තිබූ වල්ගා තාරකාවක් නිසා කලබලයට පත් වූ හැටි සුටෝනියස් නම් ඉතිහාසඥයා වාර්තා කරයි. එවකට ජනප්‍රියව තිබූ මතයක් වූයේ වල්ගා තාරකාවක් ඉතා වැදගත් පුද්ගලයකුගේ මරණය ගැන පෙර නිමිත්තක් බවයි.

ඒ නිසාම තම පාලනයට තර්ජනයක් වේ යැයි සැක කළ හැකි ප්‍රභූවරුන් කිහිප දෙනෙක්ව මරණයට පත් කරමින් එම පෙර නිමිත්ත නීරෝ විසින්ම ඉටු කරන ලදි.

ලෝක ගැළවුම්කරුවාණන්ගේ උපත පෙරමඟ දන්වන සහ දක්වන තාරකාව පමණක් නොව, හෙරෝද් රජ විසින් එම අලුත උපන් බිළිඳාව මැරීමට ප්‍රයත්න දැරීමත්, ක්‍රි.ව. පළමුවන සියවසේ ජනප්‍රියව පැවති මාතෘකාවන්ය. මෙවැනි ඓතිහාසික පසුබිමක් තුළ ජේසුස් වහන්සේගේ උපත හා සම්බන්ධ තාරකාව කුමක් ද යන්න සලකා බැලීම අර්ථාන්විතය. දහ හත්වන ශත වර්ෂයේ ජීවත් වූ ජොහැන්නස් කෙප්ලර්ගේ කාලයේ සිට ක්‍රිස්තුන් වහන්සේගේ ඉපදීමට පෙර වූ දශකය තුළ සිදු වූ තාරකා විද්‍යාත්මක වෙනස්කම් ගැන සවිස්තරාත්මක සහ සංවිධානාත්මක අධ්‍යයනයන් අප සත-ව තිබේ. ඒ අනුව ක්‍රිස්තුන් වහන්සේගේ තාරකාව සම්බන්ධයෙන් ප්‍රධාන මතයන් තුනක් පවතී.

### 01. සුපර්නෝවාවක් හෝ අලුත් තරුවක්

මතෙව් සුවිශේෂයේ සඳහන් වන තාරකාව සුපර්නෝවාවක් හෝ නව තරුවක් යන අදහස මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ ජොහැන්නස් කෙප්ලර් විසින් ය. "නෝවා" යනු ඉතා දීප්තිමත් නව තාරකාවකි. සුපර්නෝවා යනු පිපිරීමට භාජනය වෙමින් පවතින සුවිශාල තාරකාවකි. ඒ අනුව සුපර්නෝවාවක් නෝවාවකට වඩා දීප්තිමත් ය. සුපර්නෝවාවක ස්ඵෝටනය නිසා සති හෝ මාස ගණනාවක් තිස්සේ එයින් සුවිශාල ආලෝකයක් නිකුත් වීමට පුළුවන. සමහර විටෙක සමස්ත මන්දාකිණියක්ම එයින් ආලෝකවත් වේ.

එය කොතරම් ප්‍රබල ආලෝකයක් ද කිවහොත් දවල් කාලයේ පවා එය දැක ගත හැකිය. සඳටත් වඩා එය ආලෝකමත්ව අපට පෙනේ. සුපර්නෝවාවකින් අපේ ඉරට වඩා මිලියන සිය ගණනක ආලෝකයක් නිකුත් විය හැකිය. සෑම වසරකම මෙවැනි සුපර්නෝවා දුසිමක් පමණ විද්‍යාඥයෝ සොයා ගනිති. නමුත් අපගේ පියවි ඇසට දැක ගත හැකි ඒවා ඉතාමත් විරලය. චීන ජාතික තාරකා විද්‍යාඥයෝ ක්‍රි.ව. 185 දී සුපර්නෝවාවන් නිරීක්ෂණය කර ඇත.

ක්‍රිස්තුන් වහන්සේගේ උපතට පෙර පෘථිවි වාසින් විසින් නිරීක්ෂණය කරන ලද නව තරුවක් හෝ සුපර්නෝවාවක් ගැන වාර්තා මානව සංහතිය සතුව නොපවති. ඒ නිසාම ක්‍රිස්තුන් වහන්සේ උපත ලද මොහොතේ පහළ වූ තාරකාව සුපර්නෝවාවක් හෝ අලුතින් බිහි වූ තරුවක් යන්න උපකල්පනයක් පමණි.

### 02. වල්ගා තාරකාවක්

මෙය වාර්තා ගත වී ඇති ඉතිහාසය පුරාම මානව සංහතියේ ගැඹුරු කුතුහලයට පාත්‍ර වී ඇති දෙයකි. වල්ගා තාරකාවන් ඉර වටා නිරන්තරයෙන් ඉලිප්සාකාර මාර්ගයක ගමන් කරයි. ඒවා තම ගමන් මාර්ගයේ දුර ස්ථානයක පිහිටියේ නම් පෘථිවියේ සිට දැක ගත නොහැකිය. නමුත් ඒවා ඉරට සහ පෘථිවියට ආසන්න වූ විට ඉතා පැහැදිලිව පෙනෙන්නට පටන් ගනියි. විශේෂයෙන් දූවිල්ලෙන් සහ වායු වලින් සෑදුනු වලිගයක් සෑදේ නම් ඒවා ඉතා දීප්තිමත්ව පෙනෙන්නට පටන් ගනී.

ඉතා පැහැදිලිව බබළන වල්ගා තරු පැමිණෙන්නේ ශත වර්ෂයටම කිහිපයකි. එයිනුත් විශේෂයෙන් හේලීගේ වල්ගා තරුව ලෙස නම් ලත් වල්ගා තාරකාව විද්‍යාඥයින් අතර විශේෂ කුතුහලයක් ජනිත කර ඇත. 1705 දී ඉංග්‍රීසි ජාතික එඩ්මන් හේලී විසින් එය පෘථිවිය ආසන්නයට පැමිණෙන කාල සීමාව සොයා ගන්නා ලදි. එය සෑම අවුරුදු 75 / 76 කට වරක් පෘථිවිය අසළින් ගමන් කරයි. ඒ අනුව එය අවසාන වතාවට පෙනී ගියේ 1986 මාර්තු මසය. (මාත් මගේ මල්ලීත් පාන්දර තුනට පමණ අවදි වී එය නැරඹීමට උත්සාහ කළ අයුරු මට තවමත් මතකය.) ඊට පෙර එය පෙනී ගියේ 1911 දී ය. මීළඟට එය පෘථිවිය අසළට පැමිණෙන්නට නියමිත වී ඇත්තේ 2061 දී ය.

ක්‍රි.පූ. 240 සිට මෙම වල්ගා තාරකාවේ පැමිණීම චීනය, ජපානය, යුරෝපය සහ බැබිලෝනියාව යන රටවල නිරීක්ෂකයන් විසින් වාර්තා කොට ඇත. නමුත් එසේ කාලෙන් කාලෙට පැමිණෙන්නේ එකම වල්ගා තාරකාව බව ඔවුන් පුරාණ කාලයේ දී දැන සිටියේ නැත.

තාරකා විද්‍යාත්මක ගණන් කිරීම් වලට අනුව මෙය පෙනී ගිය ක්‍රිස්තු උපතට ආසන්නම කාලය නම් ක්‍රි.පූ. 11/12 අතරය. එනම් ක්‍රිස්තුන් වහන්සේගේ උපතට වසර හතකට පමණ පෙරය. (චීනයේ වාර්තා සටහන් අනුවත් මෙය ක්‍රි.පූ. 12, අගෝස්තු මස 26 දින පෙනී තිබේ). එමෙන්ම එය පෙරදිග සිට අපරදිග දෙසට ගමන් කර ඇත. මැද පෙරදිග සිට බැලූ විට පෙනෙන්නේ එසේය. උදාහරණයක් ලෙස ප්‍රසිද්ධ, දොමිනිකාන නිකායට අයත් බයිබලීය විශාරදයකු වන එම්. ජේ. ලග්රාන්ජ පියතුමා 1911 දී ජෙරුසලමේ ජීවත්ව සිටිය දී හේලීගේ වල්ගාතරු නැගෙ නහිරින් පැමිණ නොපෙනී යනවා නිරීක්ෂණය කරන ලදි. දවස් කිහිපයකට පසු නැවත එය පෙනී ගොස් බටහිර දිශාවෙන් එය බැස ගියේ ය.

ක්‍රි.ව. තුන්වන සිය වස තුළ ජීවත් වූ කතෝලික සභා පියකු වූ ඔරිගන් මෙසේ ලියා තිබුණේ ය. එතුමාට අනුව ශාස්ත්‍රවන්තයින් විසින් දකින ලද තරුව සාමාන්‍ය තරුවක් නොව, "එය වර්ගීකරණය කළ යුත්තේ ඉඳ හිට පහළ වන වල්ගා තාරකාවක් ලෙස හෝ උල්කාපාතයක් ලෙස හෝ රැවුලක් මෙන් හෝ සිලින්ඩරාකාර තාරකාවක් ලෙස හෝ ග්‍රීක ජාතික තාරකා විද්‍යාඥයන් විවිධාකාරයෙන් විස්තර කරන තාරකාවක් ලෙසයි." සාමාන්‍ය ජනතාව අතර වල්ගා තාරකාවක් ප්‍රසිද්ධ වී තිබුනේ රැවුලක් සහිත තාරකාවක් ලෙසයි.

ක්‍රිස්තුන් වහන්සේගේ උපතට අවුරුදු කිහිපයකට පෙර පහළ වූ වල්ගා තාරකාවක් එසේ උන්වහන්සේගේ උපතට ඈඳා අර්ථකථනය කරන්නට මතෙව් තුමා උත්සාහ කළ බව සිතිය හැකිය. පුරාණ කාලයේ එවැනි ප්‍රයත්නයන් වෙනත් ලේඛකයන් විසින් ද දරා තිබෙන බව අපි දනිමු. ක්‍රි.පූ. 11/12 දී පහළ වූ හේලීගේ තාරකාවත්, ක්‍රි.පූ. 8 දී හෙරෝද් රජතුමා විසින් සාදා නිම කරන ලද සේසාරියා මරිටිමා නම් වරාය විවෘත කිරීමට විදේශීය තානාපතිවරුන්ගේ පැමිණීමත් මතෙව් තුමාගේ සුවිශේෂය ලියවීමේ දී බලපාන්නට ඇත.

### 03. ග්‍රහලෝකවල එකට බැඳීම හෝ ග්‍රහ යෝගය

අපගේ ඉර වටා ගමන් කරන, ග්‍රහ ලෝකයන් අතර ඉතා සෙමෙන්ම ගමන් කරන ග්‍රහලෝක දෙක නම් බ්‍රහස්පති සහ සෙනසුරුයි. බ්‍රහස්පති ග්‍රහලෝකයට ඉර වටා ගමන් කිරීමට අවුරුදු දොළහක් ගත වෙයි. සෙනසුරුට අවුරුදු 30 ක් ගත වෙයි. මෙම ග්‍රහලෝක දෙක අවුරුදු 20 කට වතාවක් එකිනෙකා පසුකර යයි. එවිට මෙම ග්‍රහ ලෝක එකට බැඳී තිබෙන්නාක් මෙන් පෘථිවි වාසීන්ට පෙනෙන්නට පටන් ගනී.

එමෙන්ම කලාතුරකින් තවත් ග්‍රහලෝකයක් වන අඟහරු ද ඉහත සඳහන් කළ ග්‍රහ මාරුව සිදුවන විට හෝ ඊට පසුව එතැනින් ගමන් කරයි. එවිට ග්‍රහලෝක තුනක් ඉතා සමීපයෙන් තිබෙනවා මෙන් පෙනීමට පටන් ගනී. ජොහැන්නස් කෙප්ලර් මෙවැනි දෙයක් සිදුවෙනවා 1604 ඔක්තෝබර් මාසයේ දී නිරීක්ෂණය කරන ලදි. මෙලෙස බ්‍රහස්පති, සෙනසුරු සහ අඟහරු යන ග්‍රහලෝක තුනම එකට පැමිණීම සෑම අවුරුදු 805 කට වතාවක් සිදු වන බව කෙප්ලර් ගණනය කළේය. එම ගණනය කිරීමට අනුව එය ක්‍රි.පූ. 7 - 6 අතර සිදුවී ඇත. පුරාණ කාලයේ කීලාකාර අක්ෂර වලින් ලියැවුනු වාර්තාවල පවා මෙම ක්‍රි.පූ. 7 - 6 අතර සිදුවූ ග්‍රහ මාරු වීම සඳහන් වී ඇත.

බ්‍රහස්පති සහ සෙනසුරු ග්‍රහ මාරු වීමේ උච්ඡතම අවස්ථාවන් තුන සිදු වී ඇත්තේ ක්‍රි. පූ. 7 මැයි / ජුනි, සැප්තැම්බර් / ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලය. එමෙන් ම ක්‍රි. පූ. 6. ජනවාරි මාසයේ දී අඟහරු ග්‍රහයා ද මාරු වී ඇත. පාර්තියානු හෝ පර්සියානු ජාතික නක්ෂත්‍ර ශාස්ත්‍රඥයන්ට බ්‍රහස්පති ග්‍රහලෝකය විශේෂ වැදගත් කමක් තිබුණි. බ්‍රහස්පති ග්‍රහලෝකය සමස්ත ලෝකයම පාලනය කරන පාලකයා සමඟ සම්බන්ධ කර තිබුණාක් මෙන්ම , සෙනසුරු ග්‍රහලෝකය සිරියා - පලස්තීන ප්‍රදේශයේ වාසය කරන අමොරයිට්වරුන්ගේ තාරකාව ලෙස ද සලකන ලදි. ඒ අනුව ඉහත ග්‍රහ මාරුව නිසා පලස්තීනයේ වාසය කරන ජුදා ජාතිකයොත් ලෝක පාලකයෙක් පැමිණෙන බවට පාර්තියාන නක්ෂත්‍රකරුවන් අනාවැකි කියන්නට ඇත.

අපි දැන් මතෙව් තුමා සඳහන් කරන තාරකාවේ දේව ධාර්මික අර්ථය සලකා බලමු. ජෙරමියා දිවැසිවරයාගේ පොතේ මෙසේ සඳහන් වේ. "ස්වාමින් වන මම මෙසේ වදාරමි. දාවිත්ගේ පෙළපතින් දැහැමි රජ කෙනෙකු නැගී එන කාලය පැමිණෙන්නේ ය. එතුමාණන් නැණ නුවණින් රජකම් කරමින්, දැහැමිකමත් යුක්තියත් දේශය මුළුල්ලේ ඉටු කරනු ඇත." (23:5-6). එවැනි ධර්මිෂ්ඨ පාලකයකුගේ පැමිණීම කාලයක් මුළුල්ලේ මිනිසුන් විසින් අපේක්ෂා කර තිබෙන බව ඉතාමත් පැහැදිලිය.

තාරකාවක් යනු ස්වභාව ධර්මයා තුළ දෙවියන් වහන්සේගේ අනාවරණයක් ලෙස සැළකිය හැකිය. ශුද්ධ බයිබලය තුළින් දේව අනාවරණය නොලැබී තිබුණු පුද්ගලයන්ට එලෙස දෙවියන් වහන්සේ අනාවරණය කරන්නට ඉඩ ඇති බව සිතන්නට පුළුවන.

ඉහත සඳහන් ප්‍රඥාවන්තයන් කොයි රටේ සිට පැමිණියත් ඔවුන් ප්‍රඥාවන්තයන් ලෙස සලකනු ලබන්නේ ඔවුන් තාරකාවක් සොයා ගෙන ආ නිසා නොව, ජේසුස් වහන්සේව සොයා ආ නිසයි. අපව ප්‍රඥාවන්තයන් බවට පත් කරන්නේ ආකාශ වස්තූන් නොව ක්‍රිස්තුන් වහන්සේයි. අපගේ ප්‍රඥාවේ ප්‍රමාණය, ගුණාත්මකභාවය සහ ගැඹුර අප ක්‍රිස්තුන් වහන්සේට ළං වෙන ප්‍රමාණයට සමානුපාතික වේ. ක්‍රිස්තුන් වහන්සේව සොයා යන ගමනේ දී අපගේ ප්‍රඥාවද තව තවත් වැඩි වර්ධනය වේ.

එමෙන්ම සැබෑ ප්‍රඥාවන්තයා දේශපාලන අධිකාරින්ගේ බලපෑම සහ බලය නිසා ක්‍රිස්තුන් වහන්සේව පාවා දෙන්නේ නැත. සැබෑ ප්‍රඥාවන්තයා ඉටු කරන්නේ දේශපාලනඥයන්ට අවශ්‍ය කරන දේ නොව දෙවියන් වහන්සේට අවශ්‍ය කරන දෙයයි. එවැන්නෙක් දෙවියන් වහන්සේගේ න්‍යාය පත්‍රය ක්‍රියාවට නඟයි. ප්‍රඥාවේ උල්පත දෙවියන් වහන්සේ වන නිසා සැබෑ ප්‍රඥාවන්තයා සේවය කරන්නේ උන්වහන්සේට පමණය. එවිට එම පුද්ගලයා තව තවත් ප්‍රඥාවෙන් වැඩි වර්ධනය වේ.

ඉහත සඳහන් තාරකාවේ කාර්යභාරය වූයේ ක්‍රිස්තුන් වහන්සේව සොයා දීමය. උන්වහන්සේ සිටින තැනට මිනිසුන්ව මෙහෙය වීමය.

ජ්‍යොතිෂ ශාස්ත්‍රය දේව ධර්ම ශාස්ත්‍රයට සේවය කරයි. එය ක්‍රිස්තුවේදයේ දාසයෙකි. ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීමත් සමඟ ජ්‍යොතිෂ ශාස්ත්‍රය අවසන් වී ඇත. මිනිසුන් එයින් ලබා ගැනීමට උත්සාහ කරන සෑම දෙයක්ම ක්‍රිස්තුන් වහන්සේ තුළින් ද නොමිලේ ලබා ගත හැකිය. එමෙන්ම ජ්‍යොතිෂ ශාස්ත්‍රය විසින් අපට ලබා දිය නොහැකි තවත් බොහෝ දේවල් ද ක්‍රිස්තුන් වහන්සේ අපට ලබා දෙන සේක. ජ්‍යොතිෂ ශාස්ත්‍රය පවා සෙවිල්ලක යෙදී සිටියි. ජ්‍යොතිෂ ශාස්ත්‍රඥයන් පවා සොයන්නේ දෙවියන් වහන්සේවයි. ඔවුන් ඒ ගැන අවදියෙන් නොසිටිනවා විය හැකිය. නමුත්



අවසාන විග්‍රහයේ දී ඔවුන් නොදැනුවත්ව හෝ සොයන්නේ උන්වහන්සේවයි.

නූතන තාරකා විද්‍යාව පවා දේව ධර්ම ශාස්ත්‍රයේ කොටසකි. අප සෑම දෙනාවම විස්මයට පත් කරවන විශ්වයේ අභිරහස්මය බව ගණිතමය ලෙස ග්‍රහණය කර ගැනීමට දරන ලද ප්‍රයත්නයක් ලෙස නූතන තාරකා විද්‍යාව හැඳින්විය හැකිය. තාරකා විද්‍යාඥයන් විසින් අසන ලද ප්‍රශ්න වලට සැබෑ පිළිතුරු සැපයිය හැක්කේ දේව ධර්ම ශාස්ත්‍රයට පමණි. තාරකා විද්‍යාව යනු ස්වභාව ධර්මයා නම් බයිබලය අධ්‍යයනය කරන දේව ධර්ම ශාස්ත්‍රයයි. තාරකාවන් පවා සේවය කරන්නේ අපට ක්‍රිස්තුන් වහන්සේව සොයා ගැනීම සඳහාය. එසේ සොයා ගත් විට උන්වහන්සේගේ අනුගාමිකයෙක් බවට පත් වීම සැබෑ ශාස්ත්‍රවන්තයකුගේ, ජ්‍යොතිෂ්‍ය කරුවකුගේ, රජකුගේ, සහ තාරකා විද්‍යාඥයකු කාර්යභාරයයි.

මහාචාර්ය ඇන්

ක්ෂවීමේ මංගල්‍යය අදට යෙදේ

# බිළිඳෙක්, ප්‍රඥාවන්තයන් සමූහයක් සහ තරුවක්

## මේ කවුද? මොනවද ඔවුන් සොයන්නේ ?

ශුද්ධවූ මතෙව් තුමාගේ ශුභාරංචියේ සඳහන් වන ආකාරයට ; "හෙරෝද් රජු දවස ජුදයේ බෙත්ලෙහෙමෙහි ජේසුස් වහන්සේ උපන් කල, පෙරදිගින් ශාස්ත්‍රවන්තයෝ ජෙරුසලමට අවුත්, "ජුදෙව්වරුන්ට රජ ව උපන් උතුමාණෝ කොතැන්හිද? අපි එතුමාණන්ගේ තාරකාව පෙරදිග දී දැක. එතුමාණන්ට නමස්කාර කරන පිණිස ආවෙමු" යි කීහ. (2:1-2) මෙහිදී ශාස්ත්‍රවන්තයන් හෙවත් ප්‍රඥාවන්තයන් (ග්‍රීක භාෂාවෙන් ලියැවී ඇති නව ගිවිසුමේ මේ සඳහා යොදා ඇත්තේ "මගොයි" යන පර්සියාන වචනයයි.) ලෙස අදහස් කරන්නේ කවුරුන්ද? ඔවුන් පෙරදිග පිහිටි කුමන රටවලින් පැමිණියේ ද? ඒ සඳහා බයිබලීය විශාරදයන් අතර ප්‍රධාන යෝජනා තුනක් පවතී.

### 01. පාර්තියාව හෝ පර්සියාව

පෙර සඳහන් කළ පරිදි ශාස්ත්‍රවන්තයන් සඳහා මතෙව් තුමා භාවිත කරන වචනය "මගොයි" වන පර්සියාන වචනයකි. ඒ අනුව ඔවුන් මේදවරුන් හෝ පර්සියානවරුන් විය හැකිය. මෙම ජාතින් දෙක ජීවත් වූ භූමිය වර්තමානයේ ඉරානයට සමාන වේ. ක්‍රි.පූ. 6 වන ශත වර්ෂය වන තෙක් මේදවරුන් මෙම ප්‍රදේශයේ ජීවත් වූ බලසම්පන්න ජාතිය විය. මේදවරු එවකට මැද පෙරදිග ප්‍රදේශයේ අධිරාජයා වී සිටි අසිරියාන බලය පරාජය කිරීමට ශත වර්ෂයකට වඩා කාලයක් අරගල කරන ලදි. ඔවුන් ක්‍රි.පූ. 612 දී බැබිලෝනියාවේ සහයෝගය ද ඇතිව අසිරියාවේ අගනුවර වූ නිනිවය විනාශ කරන ලදි. නමුත් එම ජයග්‍රහණය තාවකාලික එකක් විය.



එවකට පර්සියාන ජාතියේ රජ වූ මහා සයිරස් සමස්ත පර්සියාන ජාතිකයන් එක්සේසත් කොට මේදියවරුන්ගේ අග නගරය වන එක්බතානා (වර්තමාන ඉරානයේ "හමදාන්" නගරය) ක්‍රි.පූ. 550 දී ආක්‍රමණය කර එය පර්සියාන අධිරාජ්‍යයට ඈඳා ගන්නා ලදි. එසේ මේදියාව පර්සියාන අධිරාජ්‍යයේ කොටසක් බවට පත් විය. ඒ අනුව එක අධිරාජ්‍යයක් තුළ ජාතින් දෙකක් ජීවත් විය.

හෙරඩෝටස් නමැති ග්‍රීක ඉතිහාසඥයා ක්‍රි.පූ. 6 වන ශත වර්ෂයේ මේදියවරුන් අතර සිටි පූජක පැලැන්තියක් ගැන විස්තර සපයයි. ඔවුන්ට සිහින අර්ථකථනය කිරීමට විශේෂ බලයක් සහ හැකියාවක් තිබුණි. මේදීයවරුන්ගෙන් පර්සියානවරුන්ට ක්‍රි.පූ. 550 දී දේශපාලන බලය මාරු වීමෙන් පසුවත්, එමෙන්ම ශක්තිමත් වෙමින් පැවති සරතුස්ත්‍ර ආගමේ හෝ සොරුස්ට දහමේ බලපෑමෙන් පසුවත් මෙම ප්‍රඥාවන්ත පූජක පන්තිය විනාශ නොවී පැවතුණි. ඒ අනුව හෙරඩෝටස්ගේ කාලය (ක්‍රි.පූ. 450 පමණ) වන විට මෙවැනි ශාස්ත්‍රවන්තයන් සාරතුස්ත්‍ර දහමේ පූජකවරුන් ලෙස ද කටයුතු කළහ.

ඊට පසු ශත වර්ෂවල මෙවැනි ශාස්ත්‍රවන්තයන්ගේ කාර්යභාරයේ විවිධත්වයක් ඇති වූයෙන්, "මගොයි" යන නාමය විවිධ රහස් පිළිබඳ ඥාන සම්භාරයක් සහ සම්ප්‍රදායයන් දැන සිටි පුද්ගලයන්ට මෙන්ම මායම් පිළිබඳ ශ්‍රැතියක් සහිත පුද්ගලයන්ට ද ආරෝපණය කරන ලදී.

මුල් කාලීන ක්‍රිස්තියානි බිතු සිතුවම්වල පවා මෙම ශාස්ත්‍රවන්තයන් සිත්තම් කර තිබුවේ පර්සියානු හෝ පාර්තියානු ඇඳුම් සමඟය. එනම් ඉන පටි සහිත දණ හිස දක්වා වැටෙන අත් දිග කබාය. ප්‍රිගියන් කැප් තොප්පිය සහ කලිසමක් මෙන් කකුල් වසා අඳින ඇඳුමය. ශාස්ත්‍රවරුන්ව මෙවැනි ඇඳුම් සමඟ සිතුවම් කර තිබීම නිසා ඇති වූ ප්‍රසිද්ධ සිද්ධියක් වාර්තා වේ. ක්‍රි.ව. 614 දී සසනිඩ් නම් පර්සියාන රජ වංශයේ කොස්රෝස් රජුගේ හමුදා පලස්තීනය දරුණු ලෙස ආක්‍රමණය කර ක්‍රිස්තියානි දෙව්මැඳුරු වලට ගිනි තබමින් සිටියේ ය. නමුත් කොන්ස්තන්තීනු අධිරාජ්‍යයා විසින් තනන ලද සහ ජස්ටිනියන් අධිරාජ්‍යයා විසින් ප්‍රතිසංස්කරණය කරන ලද බෙත්ලෙහෙමේ පිහිටි බැසිලිකාවට පර්සියාන හමුදාව විසින් කිසිදු හානියක් සිදු නොකරන ලදි.

එයට හේතු වූයේ එම බැසිලිකාවේ බිතු සිතුවම්වල ශාස්ත්‍රවන්තයන්ව පර්සියාන ජාතිකයන් ලෙස නිරූපණය කර තිබීමයි. ආක්‍රමනික පර්සියාන යුද හමුදාව තම රට වැසියන්ව ක්ෂණිකවම හඳුනා ගන්නා ලදි. (මෙම සිද්ධිය වාර්තා වූයේ ජෙරුසලම් මන්ත්‍රණ සභාව සම්බන්ධයෙන් ක්‍රි.ව. 836 දී ලියැවුණු හසුනකය.)

සමහර සභා පියවරු ද මෙම ශාස්ත්‍රවන්තයන්ට පර්සියාන සරතුස්ත්‍ර ආගමේ පසුබිමක් ඇති බවට තර්ක කළහ. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් තුමා ඒ අතර ප්‍රධාන තැනක් ගනී. මෙසියස් තුමාගේ පැමිණීම සම්බන්ධයෙන් සාරතුස්ත්‍ර තුමා අනාවැකි පළ කළ බව සමහර සභා පියවරුන් අතර මතයක් විය.

ඒ අනුව සරතුස්ත්‍ර තුමා, ක්‍රිස්තුන් වහන්සේගේ සපැමිණීම ගැන අනාවැකි ප්‍රකාශ කළ දිවැසිවරයකු ලෙස සලකන ලදි.

පර්සියාන යුගාන්තයේදී සහ ජුදා ජන ශ්‍රැතියේ මිශ්‍රණයකින් ක්‍රි.පූ. 100 - ක්‍රි.ව. 100 අතර කාලය තුළ ලියැවුණු "හිස්ටපෙස්ගේ ජේන කීම්" නම් කෘතියේ දේව පුත්‍රයා සහ එතුමාගේ පැමිණීම සම්බන්ධයෙන් සඳහන් වී ඇති බව ක්ලෙමන්ට් තුමා සඳහන් කරයි. එමෙන්ම "ළදරු විය පිළිබඳ ආරාබි සුභාරංචිය" මෙසේ වාර්තා කරයි; "සාරතුස්ත්‍රගේ අනාවැකියට අනුව සමහර ශාස්ත්‍රවන්තයන් ජෙරුසලමට පැමිණියහ." (7:1).

### 02. බැබිලෝනියාව

පෙරදිගින් නැඟ එමින් තිබූ තරුව යන අදහසේ නක්ෂත්‍ර විද්‍යාත්මක අර්ථයක් තිබෙන නිසා, ශාස්ත්‍රවන්තයන් පැමිණෙන්නට ඇත්තේ බැබිලෝනියාවෙන් විය හැකිය. බැබිලෝනියානුවරු සහ කල්දිවරු තාරකා විද්‍යාවේ සහ නක්ෂත්‍ර ශාස්ත්‍රයේ දියුණුවට ඉමහත් සේවයක් කරන ලදි. විශේෂයෙන් නක්ෂත්‍ර ශාස්ත්‍රය හෙවත් ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය ඔවුන් විසින් ආරම්භ කරන ලදි. (නක්ෂත්‍ර ශාස්ත්‍රය සහ ක්‍රිස්තුන් වහන්සේ අතර ඇති සම්බන්ධය විස්තරාත්මකව පසුවට සාකච්ඡා කරනු ලැබේ. ) ක්‍රි.පූ. 587 දී ආරම්භ වූ බැබිලෝනියානු විප්‍රවාසත් සමඟ ජුදා සහ බැබිලෝනියානු සංස්කෘතින් දෙකේ මිශ්‍ර වීමක් ඇති වුණි. ක්‍රි.පූ. 539 දී මහා සයිරස් රජු බැබිලෝනියාව පරාජය කොට ජුදා වංශයට නැවත තම දේශය වන පලස්තීනයට යෑමට ක්‍රි.පූ. 538 දී ආඥාවක් ද නිකුත් කරන ලදි.

නමුත් සමහර ජුදා ජාතිකයෝ බැබිලෝනියාව තුළම නැවතී තම ව්‍යාපාරික කටයුතු සහ අනෙකුත් වෘත්තීන් දිගටම කරගෙන යන ලදි. එම නිසා බැබිලෝනියානු නක්ෂත්‍රකරුවන් ජුදා ජාතියේ සංකල්පයක් වූ මතු පැමිණෙන ගැලවුම්කරුවකු පිළිබඳව බලාපොරොත්තුව ගැන යමක් දැන සිටින්නට ඇත. එබැවින් මෙම සුවිශේෂිත තරුව ජුදෙව්වරුන්ගේ රජව උපන් තැනැත්තාට ආදේශ කරන්නට ඇත.

ක්‍රි.පූ. දෙවන ශත වර්ෂයේ ග්‍රීක භාෂාවෙන් ලියැවුණු දිවැසිවර දානියෙල් ගේ පොතේ බැබිලෝනියේ නෙබුකද්නෙසර් රජ සමයේ සෑම තැනම වර්ධනය වෙමින් පැවති මෙවන් ශාස්ත්‍රවන්තයන් ගැන සඳහන් වේ. වශී කරන්නන් සහ නක්ෂත්‍රකරුවන්ට මෙන් මෙවැනි ප්‍රඥාවන්තයන්ට ද සිහින සහ පරිකල්පනමය පණිවුඩ අර්ථ කථනය කිරීමට ද බලය තිබෙන බවට විශ්වාස කෙරුණි.

"එබැවින් ඔව්හු රාජ සේවයට ඇතුළත් කරන ලදහ. තේරුම් පැහැදුම් ඇතිව විමසිය යුතු යම් යම් කරුණු සම්බන්ධයෙන් රජතුමා ඔවුන්ගෙන් විමසූ විට, මුළු රාජ්‍යයේ සිටි සියලු මන්ත්‍රකාරයන්ටත්, අනාවිනකාරයන්ටත් වඩා දස ගුණයකින් ඔවුන් සමත් බව එතුමාට පෙනී ගියේ ය." (දානියෙල් 1:20). "එවිට රජු දුටු ස්වප්නය ඔහුට දන්වන පිණිස මන්ත්‍රකාරයන් ද අනාවිනකාරයන් ද මායා කාරයන් ද කල්දිවරුන් ද කැඳවන්න රජතුමා අණ කෙළේ ය." (දානියෙල් 2:2). "මා යහනේ සිටිය දී මට ඇති වූ සිතිවිලි හා හිසට නැඟුනු දර්ශන මා බිය ගැන්විය. ස්වප්නයේ තේරුම මට දන්වන පිණිස බැබිලෝනියේ සියලු ශාස්ත්‍රවන්තයන් මා ඉදිරියට පමුණුවන හැටියට මම අණ කෙළෙමි. එවිට මන්ත්‍රකාරයෝ ද අනාවිනකාරයෝ ද ජේන කියන්නෝ ද මා වෙත ආවෝය." (දානියෙල් 4:5-7)

සී. එස්. මාන් නමැති බයිබලීය විශාරදයාට අනුව මතෙව් සුවිශේෂකවරයා සඳහන් කරන ශාස්ත්‍රවන්තයෝ යනු බැබිලෝනියාවේ විසූ ජුදා ජාතික කට්ටඩියන් සහ තාරකාවලට වන්දනා මාන කරන්නන් ය. නමුත් ඔවුන් තමන් පෙර කරන ලද කටයුතු සම්පූර්ණයෙන්ම නවතා දමා ජේසු බිළිඳාට ගරු බුහුමන් දැක්වීම උදෙසා බැබිලෝනියාවේ සිට පැමිණ ඇත.

පුරාණ මිසරයේ පාරාවෝ රජ ගේ ශාස්ත්‍රවන්තයන්, අනාවින කාරයන් සහ ඉන්ද්‍රජාලිකයන්, මෝසෙස් තුමන් විසින් අභිබවා කටයුතු කළ ආකාරයට, ක්‍රිස්තුන් වහන්සේගේ උපතත් සමඟ නක්ෂත්‍ර ශාස්ත්‍රඥයන්ගේ බලය බිඳ දමන ලදි. ඩබ්ලිව්. ඩී. ඩේවිස් නමැති බයිබලීය විශාරදයා පවසන අන්දමට ශාස්ත්‍රවන්තයන් සිය කරඬු ඇර රන් ද, කට්ටකුමංජල් ද, ගන්ධ රස ද පුදමින් පසඟ පිහිටුවා වැඳ වැටුනේ වඩා ශ්‍රේෂ්ඨ මෝසෙස් කෙනෙක් (එනම් ජේසුස් වහන්සේ) පාමුලය.

### 03. අරාබිය හෝ සිරියානු කාන්තාරය

මතෙව් තුමාගේ සුවිශේෂයේ සඳහන් ශාස්ත්‍රවන්තයන් රැගෙන ආ තිළිණයන් අනුව මෙම ප්‍රදේශ වලින් එන්නට ඇත. රත්තරන් සහ තුවරලා යන තිළිණයන් උතුරු අරාබියේ මිදියන් ප්‍රදේශයෙන් සහ දකුණු අරාබියේ ෂෙබා ප්‍රදේශයෙන් එන ඔටුවන් විසින් රැගෙන එන ද්‍රව්‍යයන් ය.

යෙසායා දිවැසිවරයාගේ පොතේ ඒ ගැන මෙසේ සඳහන් වේ; "ඔටුවන් සමූහයකින් යුත් තවලම් මිදියන් හා ඒපා දේශ වලින් නුඹ වෙත රොක් වෙයි. ඔවුන් ෂෙබා දේශයෙන් රන් ද සුවඳ ද්‍රව්‍යය ද රැගෙන අවුත් සමිඳුන්ගේ ප්‍රශංසාව ප්‍රකාශ කරනු ඇත." (60:6) ගීතාවලියේ ඒ ගැන මෙසේ ලියා ඇත; "ෂෙබාහි රත්තරන් එතුමාට පුදනු ලැබේවා" (72:15). ජෙරමියා දිවැසිවරයාගේ පොතේ මෙසේ සඳහන් කර තිබේ; "ෂෙබාගෙන් කට්ටකුමංජල් ද (හෝ තුවරලා) දුර දේශයකින් හඳුන්කූරු ද මට ගෙනෙන්නේ කුමට ද?" (6:20). දෙවන වංශාවලිය පොතෙන් ද ෂෙබා දේශය රත්තරන්, සුවඳ ද්‍රව්‍ය සහ මැණික් ගල් වලට ප්‍රසිද්ධ බව සඳහන් කරයි. "ෂෙබාහි රැජින සලමොන්ගේ කීර්තිය අසා, ගැටලු ප්‍රශ්න වලින් ඔහු පිරික්සන පිණිස ඉතා විශාල පිරිවරක් ද සුවඳ ද්‍රව්‍ය සහ රන් මහා රාශියකුත් මැණික් ගලුත් පටවන ලද ඔටුවන් ද ඇතිව ජෙරුසලමට ආවා ය." (9:1).

පැරණි ගිවිසුම තුළ පවා "නැගෙනහිර ජනතාව" වශයෙන් හඳුන්වන්නේ කාන්තාරයේ ජීවත් වන අරාබි ජාතිකයන්ට ය. ඔවුන් අතර ප්‍රඥාවන්තයන් හෝ ශාස්ත්‍රවන්තයන් සිටීම පුදුමයට කරුණක් නොවේ. ඔවුන් ප්‍රඥාව සම්බන්ධයෙන් කීර්ති නාමයක් දිනා ගෙන තිබුණේ ය. ඒ ගැන පරණ ගිවිසුමේ මෙසේ සඳහන් වේ; "සලමොන්ගේ ප්‍රඥාව පෙරදිග රටවල (අරාබිය) සියලු ජනතාවගේ ප්‍රඥාවත්, මිසර වැසියන්ගේ සියලු ප්‍රඥාවත් ඉක්මවා ගියේය." (1 රාජාවලිය 4:30). "මස්සාහි ජාකේගේ පුත් ආගුර්ගේ විශිෂ්ට අවවාදානුශාසනා ය" (හිතෝපදේශ 30:1). "මස්සාහි ලෙමුවෙල් රජුගේ මව ඔහුට දුන් උපදේශ මේය" (හිතෝපදේශ 31:1). මෙහි "මස්සා" යනු උතුරු අරාබි ගෝත්‍රිකයෙකි. ප්‍රඥාව සම්බන්ධයෙන් අරාබි ගෝත්‍රිකයන් යම් ප්‍රසිද්ධියක් දරා සිටි බව මින් පැහැදිලි වේ.

එපමණක් ද නොව, නක්ෂත්‍ර ශාස්ත්‍රය අරාබිවරුන්ට ආගන්තුක දෙයක් ද නොවේ. අරාබි ගෝත්‍ර හතරක් ම තම ගෝත්‍රවල නාමයන් ලබා ගත්තේ තාරකා වල නම් වලින් ය. ඊට අමතරව ජුදා ජනතාව සමඟ ද ඔවුන් ට සම්බන්ධතාවයන් තිබුණේ ය. සලමොන් රජගේ කාලය පටන් ඊශ්‍රායලයත්, දකුණු අරාබියත් අතර වාණිජ සබඳතා පැවතුණි. එමෙන්ම යේමනයේ සිටි අරාබි රජ කෙනෙක් වූ "දූ නොවාස්" ජුදා ආගම වැළඳ ගත්තේ ය. එමෙන්ම අරාබියේ මෙඩිනා නුවර අවට ජුදා ජනපද කිහිපයක් ජීවත් වුණි.

ජේසු බිළිඳාව බැලීමට පැමිණි ශාස්ත්‍රවන්තයන් පර්සියානුන් බව කිතුනු සභා පියවරුන් අතර වැඩියෙන්ම ප්‍රචලිතව තිබූ මතය වූවත්, ඔවුන් පැමිණියේ අරාබිකරයෙන් බව ක්‍රිස්තියානි සභා පියවරුන් අතර ප්‍රචලිත වූ මුල්ම මතයයි. ක්‍රි.ව. 160 දී ජස්ටින් ප්‍රාණපරිත්‍යාගිවරයා තම "දෙබස" නම් පොතේ ඒ බව මෙසේ ලියා තිබුණේ ය. "අරාබියෙන් ශාස්ත්‍රවන්තයන් හෙරොද් වෙත පැමිණියේ ය." ඊට අවුරුදු 50 කට පමණ පසු ටර්ටූලියන් තුමා පවසා සිටියේ ඔවුන් පැමිණියේ ඩැමස්කස් සහ අරාබියෙන් බවයි. එසේ කීමට හේතු වූයේ ඔවුන් රැගෙන ආ තිළිණයන් ය.

ක්‍රි.ව. 96 දී පමණ රෝමයේ ක්ලෙමන්ට් තුමා පවසා සිටියේ කට්ටකුමංජල් සහ ගන්ධරස පැමිණෙන්නේ පෙරදිගින් හෙවත් අරාබියට ආසන්න ප්‍රදේශ වලින් බවයි.

ඉහත කරුණු අනුව පෙනෙන්නේ ක්‍රිස්තුන් වහන්සේව සොයා පැමිණි ශාස්ත්‍රවන්තයන් පර්සියාවෙන් හෝ බැබිලෝනියාවෙන් හෝ අරාබිකරයෙන් පැමිණි බවයි.

15 පිටුවට »

ටන් මීමන

## පව් මල සෝදා

බැති බව වඩමින් කිතු දන සිත් තුළ
ඇති නැති සැමදෙන සතුටට පත් කළ
සිතිවිලි අතරට සාමය එක් කළ
පැතිරෙයි ගී නද ඔපකර නත්තල

ගවහල එළිකර රජ මැදුරක් කළ
නවතම යුගයක් ලෝකෙට එක් කළ
ලොව වෙත සාමයෙ හස්තය දිගු කළ
පව දුර හරිමින් ආවා නත්තල

**බටහිර වැලිවේරියේ ඇලෙක්සි පල්ලෙවෙල**

## විශ්ව මඟුලයි - ගමයි

දුම් පිඹලා වලෙන් ගොඩට ගත් රබ කැන කහ පාටයි
මඟුල් දිනේ මනාලියක් සුදට ඇඳල ආ පාටයි
තෙල් සුවඳට ගෙදර "කිරි" හොරගල් අහුලන පාටයි
කුස්සිය පැත්තෙන් කලබල නත්තල ළඟ එනවාටයි

සීනු හැඬෙන ගීත ගැයෙන පල්ලියෙ ගවලෙන ඇරිලා
කිරෙන් ඉදුනු, තෙලෙන් බැදුනු දේ හැම මේසෙම පිරිලා
පස මිතුරන් අද මිතුරන් හැමටම ගෙයි දොර ඇරිලා
ජේසු උපතේ සාම සැපතෙ මිහිරෙන් හැම සිත් පිරිලා

**යූ. ඩී. ප්‍රැන්සිස් ඇන්ටනි**
හීන්කෙන්ද - රාගම

## නත්තල් සිරි

සුර මැදුරු නැත හිසට
රස අහර නැත කුසට
යස ඉසුරු නැතුවාට
සිතේ දැල්වෙයි සතුට

අඳුර රජයන රැයක
පායලා රන් තරුව
සීතලට ගුළි වෙන්ට
පිදුරු පියසකි හිසට

සිහින වරුසා කුමට
උදා වන හෙට දිනට
සාමයත්, ප්‍රේමයත්
අගනේය සැම දනට

මල් සුවඳ නැති වුවද
ගුණ සුවඳ ඇති හදට
හැකිවේය නත්තලේ
සිරි අසිරි විඳින්නට

**පී. ඒ. නිරාෂා**
ගිරිඋල්ල

## සැමට පතමි සුබ නත්තල්

මිහිබට දෙව්පුත් මනුකය ලැබගෙන
සව් ලෝ දන හට සෙනෙහෙන් අපමණ
සිදු කළ මා හැඟි සේවය අද දින
අමතක නොකරති බැතිමත් කිතු දන

සුරදූතු කැල විත් එම රෑ මැදියම්
සුරපුතු වෙනුවෙන් ගැයූ ගී මනරම්
පැතිරී මුළු වා තල විය උණුසුම්
සත් දන ඉන් ලැබ ගති සුව සැනසුම්

දුප්පත් ගොපලුන් බලවත් නිරිඳුන්
එතුමන් බැහැදැක කළ ලෙස බුහුමන්
උස් මිටි භේදය ඉවතම දමමින්
මෙදිනදි අපි සැම නමදිමු සැදැහෙන්

පැතිරෙන අතුරුතුරුදි උඳුවප් පවනැල්
සැරසේ කුසුමින් අවටැති තුරු වැල්
කිතු'පත සමරණ මෙම දින මනකල්
පතනෙමි සැමටම සිරි සුබ නත්තල්

**දළුපත - පිලිෂියන්**

## සාම කුමරුනි

පුංචි පැල්පතේ
ලොවට එළිය දුන්
දෙව් කුමරාණෙනි
ශ්‍රී ශුභ නත්තල්......

අපේ පැල්පතේ
දුක් විඳි ජනයාට
සැපත සොයාදෙන
ඔබ සැම හට
නත්තල්....

ජීවිත ගමනේ
බාධක ජයගෙන
සාමය දෙන්නට
පැමිණි කුමරුනි
ශ්‍රී සුභ නත්තල්...

**ටයිටස් සපරමාදු**
බෝපිටිය - තුඩුව

## වන්දන කරමු ජේසුට පෙමින් නිති

සම්පත් පිරුණු මැදුරුත් රන් රුවන් ඇති
පින් මදිවා නොවෙයි බැහැපත්කම කරන රැති
ලන්කර ගව බටළු රැල ගෝහල ලැගුම් ගති
වන්දන කරමු අපි ජේසුට පෙමින් නිති

වුනු රුව කුමරි මරියාවන් නොවන දෙස
මනුවෙස් රැගත් දින ඇයගේ කුසින් බැස
දිනු දින දියත සැමදෙනා වඩවමින් තොස
එනු පා සිඹගන්න ජේසුට නමන් හිස

**බර්නාඩ් බොතේජු**

## දෙව්පුත් උපත

දිවැසිවර වූ "යෙසායා" කී අනාවැකි
දිගු කලක් ගත වී
සැබෑ විය "නාසරියෙ ජේසුස්"
දෙව්කුමරු බෙත්ලෙමේ බිහිවී
උතුම් පින්වත් "මරිය තුමියට"
"ජුසේ තුමනට" සිය පුතුන් වී
තරුව සුදිලෙන රැයේ සිටියේ
ගවලෙනෙහි තණ ඔරුවෙ නැළැවී

**රුවන්පුර සුනිමල් ප්‍රියරුවන්**

## උඳුවපේ සිරිය

සීතල උදුවපයේ සිරිය දස අත පැතිරෙන්නේ
හිනැහෙන බිළිඳුන් තරුවකින් පාර කියන්නේ
තනි තරුවක සීතල කතාවක් තැන තැන කියැවෙන්නේ
ජේසු බිළිඳු සුර සැප තුනි යහන් තලේ වැජඹෙන්නේ

සුර සැප නැති යහන් තලේ ගීත ඇසෙන්නේ
දන්නා නොදන්නා අය උදුවපේ අසිරිය විඳගන්නේ
ගව ඔරුවේ පිපුනු කුසුමේ සාමයේ සුවඳ පැතිරෙන්නේ
නත්තල් දින ජේසු බිළිඳු උපත අප සමරන්නේ

**සුරේෂ් මැන්ඩිස්**
මොරටුව

## නත්තල

නත්තල දොර ළඟ හිනැහෙනවා වෙනුවට අද....
සුරා සුදු විලාසිතා මුල් බැස ඇත හිත් තුළ.....
අන්න අතන ගෙණ හඬ නගනවා
මෙන්න මෙතන බෙර හඬ තලනවා

අයියෝ..... අනේ සල්ලි මෙලෙස නාස්ති වනවා මිසක....
පව් අසරණ දුප්පත් අය සරණ වෙයන්ලා අද දින.....
යක්ස උපත සිදු නොවේ අන්න එවිට
සැබෑ කිතු උපත සිදුවෙයි මෙන්න එවිට

**කේ. නෙලස් ටෙස්මි ප්‍රනාන්දු**
මැරවල - හලාවත

## යළි වඩිනු මැනවි

අමුතු තරුවක් ගුවන දිලෙයි මැදියම් රැයේ
ගොපලු කැල අවදි කර සුරදූත ගී ගැයේ
රන් සුවඳ දුම් රැගෙන රජ තිදෙන එම පැයේ
පිවිසියෙන් විස්මකුරු දැයෙක සලකුණු තියේ

සග පුරය අහිමි කළ පව් බැඳුම් මුදාහැර
විමුක්තිය රැස් දහර දනන් වෙත උදාකර
දහම් මග හෙළි පෙහෙළි කළ සදිසි උදාහිර
වඩිමු නිරතුරු සාමයේ කුමරු සදාදර

**කටානේ කුවින්ටින් හපුආරච්චි**

## සාමයට තිත !

සිරියෙන් සපිරුනු සුපතල නම ඇති ලෝකෙම දන්නා දහම් දිවයිනේ
කිතුනු බැතිමතුන් අතලොස්සකි ඒ අය සැමවිට කැපිලා පෙනේ
නත්තල එනවිට රටම බබලවයි කාට කාටත් එය ඇඟට දැනේ
කනවා බොනවා ජොලියෙ ඉන්නවා මේකද නත්තල කියනු මැනේ

ඇතිවුණු සාමය ආයෙත් ටික ටික නැතිවී යනවා ලකුණු දැනේ
බලයට ලෝභිව අපේම උන් ටික එක පරදමින් මරා ගැනේ
මොනවා වුනමුත් එකක් කියන්නම් කිසිදු සැකයක් නැතිව අනේ
ඊළඟ නත්තල එන්නට ඉස්සර අපට ඔහේලට නර ලෝකෙ පෙනේ

**ආනන්ද රණවීර**
කැපුන්ගොඩ

## වර දෙන්න කුමරුනේ

වෛරයේ නියගයෙන්
ඉරි තැලුනු මිනිස් හදවත
ප්‍රේමයේ සිසිල දිය
උල්පතක් වන්නට
මිනිස්කම නැති
නොමිනිසුන් හට
මිනිසත් බවේ
කැඩපතක් වන්නට
නව හැඟුම් උපද්දා
නව සිතුම් ජනිතකර
අප හැඟුම් අරුත්බර වන්නට
දෙන්න වර සාම කුමරුනේ

**මාරි පැන්සි පෙරේරා** - කලමුල්ල

## අසිරිමත් දිනක්

කැකුළු මලක් පුබුදුවී
බිළිඳු පුතෙක් සිනාසේ
බැහැපත් බව ලොවට කියා
ගව ඔරුවකි තොටිල්ලේ

මිනිස් මවක් දෙව් මව් වී
මරි මව් ආසිරි ලබා
දෙව් පුතු මිනිසත් බව ගෙන
ජේසු බබා ඉපදිලා

**කමලා කාන්ති ගොඩගේ**
ගැටහැත්ත

## දෙව්පුත් මනුකය ගත්තා

රිදී සිත්තමෙන් හිම බේරෙනවා
හිරිගඩු පිපි පිපි සීත දැනෙනවා
අහසින් පොළවට සෙනෙහෙ ගලනවා
දෙව් පුත් මනුකය රැගෙන වඩිනවා

ජේසු උපන් බිම පිවිතුරු වෙන්නයි
ජේසු උපන් තැන සාමෙ රඳන්නයි
ජේසු උපන් සිත තුටින් පිරෙන්නයි
ජේසු උපන්දා නත්තල වෙන්නයි

**සුෂිල් රිටානි**
තල්විල

## නත්තල් සිහිනය

අම්මාගේ කඳුළු බිංදු - සැතපුම් දහයක් තරමය
තාත්තගේ දුක් සුසුමන් - ගව් සියගණනක් හඹාය
කොලේජ් එකට මට ඇත්තේ - සැතපුම් දෙකකට අඩුවය
ඒත් අනේ, කොලේජ් එකට - මාව තේරිලා නැතිවය

නත්තල් ලඟා එනවානේ - අලුත් අවුරුදුත් ලඟනේ
අලුත් සපත්තුත් හොඳනේ - මට කලිසම් ෂර්ට් ගෙනේ
මගේ යාලුවෝ කියනවනේ - මගේ හිතේ ඒක නෙමේ
ජේසුනි මට නම් ඕනේ - කොලේජ් එකට යන්න අනේ

**බර්නාඩ් ද සිල්වා**
පාඇළ

## සතුට පිරේවා!

සව්ලොව් සත වෙත සාමය පැතිරෙන
ලෝවැසි දන සිත නත්තල පුබුදන

නත්තල බිහිවෙන කුමරෙකි දෙව්පුත
මරිමව් උකුලෙහ මුදු ගී නැලවෙන

එළඹුරු වටවෙන ගයමින් ගී විත
විමුක්ති මාවත රැඳී පිළිරැව් දෙන

පවිටු දනට මෙත ලෝ ගැලවුම වෙත
පෙන්වා දෙව්පුත සාමය පතුරන

ගවලෙන දුප්පත ඉපැදුන දෙව්පුත
ලෝ වැසි දන සිත සතුටින් ඉපිලෙන

**ෆ්‍රැන්සිස්කා ගුණතිලක**
වත්තේගම

## ජය ගී නැගුණා

ඒව ආදම් ලොවට ගෙනදුන් පාපයේ වන්දිය ගෙවන්නට
දෙව් පුතුගේ දිවියෙ වන්දිය ඇවැසිවිය දෙව් පියාණන් හට
දහස් ගණනක් වසර ගතවිය මිදුම් කරුවකු ලොවට එන්නට
කුමරි මරියාවන් උපන්නේ දෙව් පුතුගේ මෑණි වන්නට

දිවැස්වරු සැම කියා ඇති ලෙස ජේසු බිළිඳුට උපත ලැබුමට
මරිමවුන් සහ ජුසේ මුනි හට යන්ට සිදු විය බෙත්ලෙහෙම් පුරයට
ජේසු බිළිඳුගෙ උපත සිදුවිය ගවහලක අප පවින් මිදුමට
සුරලොවත් මේ ලොවත් එක්විය දෙව් දූ තුන් ජය ගී ගයන්නට

**ඩී. ඇන්ටනි වික්‍රමසිංහ**
පමුණුගම

## අළුත් වසරේ අළුත් ගමනක්!

ජේසු බිළිඳුනි අද එබට ගෙනෙන්නට
රන් රුවන් මිණි මුතු කිසිත් නැත මට
ගෙනෙන්නේ මොනවද කියා සිතෙන විට
මගේ දෙනෙත් තෙත් විය හනිකට

එදා නත්තල් සිරියෙන් පිරුන මගේ නිවහන
අද එහි නත්තල් ගස් තරු සැරසිලි නැතිවින
මෙය දකිද්දී මගේ අසරණ හදවත කැන
කඳුළු ඉතිරී වැටුනි නෙත් කොන

විසිතුරු නත්තලක් මම නොසිත මී
ගවලෙන තුළින් මා සාමය දුටුවෙමි
පිවිතුරු හදවත මගේ ජේසුට දෙන්නෙමී
අළුත් වසරේ අළුත් ගමනක් ජේසු සමගින් යන්නෙමී

**අයිරින් මල්ලිකා සිල්වා**
කඩවත

## අලුත් අහසක්

ගෙවී වසරක් තවත් වසරක් උදාවෙන මේ නත්තලේ
පුරුදු විදිහට ලොවම සැරසෙයි සැමතැනම හරි කලබලේ
පාට පාටින් ගෙවල් දොරවල් නවමු හැඩගැන්වෙන කලේ
කිතුනු නොකිතුනු සැමට මඟුලකි ජේසු උපතේ ඇති බලේ

මෙවන් විශ්මිත ජේසු ගමනේ විමුක්තිය සමරන මෙදා
ප්‍රේමයේ බැම්මෙන් බැඳී අපි අයුක්තිය පරදමු සදා
සියලු සම්පත් බදාගෙන නොව සැම සමග සුහදව බෙදා
අලුත් අහසක් අලුත් පොළවක් උදාකරලමු අපි මෙදා

**දිලීප ජයමාන්න**
පමුණුගම

## නව වසර කරා

දියෙන් ගින්නෙන් නොවේ මගෙ රට මලින් බරවී පල දරා
ගුණෙන් දහමින් බැඳී නජ සෙත සදා පවදුරු පට ඉරා
බියෙන් සැකයෙන් දුරස්වී නිති සිනා මල් මුළුවත පුරා
සිතින් ලස්සන සිතින් අපි පියනගමු මේ නව වසර කරා


**පිටිපන මා. ජයවීර**

බැසිල් ෆොන්සේකා විසිනි

# කිතුමග ක්‍රිස්තායන් හින්දි චිත්‍රපටය තිරගතවේ

ජේසුස් වහන්සේගේ චරිතය නිරූපණය කෙරෙන හින්දි බසින් චිත්‍රපටගතකෙරුණු කිතුමග නම් චිත්‍ර පටය ඉන්දියාවේ සිනමාහල් වල ප්‍රදර්ශනය කිරීම ආරම්භ කරත. චිත්‍ර පටයේ ප්‍රදර්ශන කාලය පැය 6 ක් වීම විශේෂත්වයකි.

කිතුමග නම් චිත්‍රපටය නිපදවීමට හත් වසරක් ගතවී ඇති අතර එය මහජන ප්‍රදර්ශනයට මුදා හරිනු ලැබුවේ ඇදැහිල්ලේ වසර මුල්කරගෙන බැව් චිත්‍රපටයේ නිෂ්පාදක අධ්‍යක්ෂ ජියෝ ජෝර්ජ් ඉන්දීය පූජක තුමා ජාත්‍යන්තර කතෝලික මාධ්‍යයට පවසා ඇත. නළු නිළියෝ 200 දෙනෙක් පමණ මෙම චිත්‍රපටයේ රඟපාති. එම නළු නිළියන්ගෙන් 80% දෙනා කිතුනුවන් බැව් ද අනෙක් අය අන්‍යාගමිකයන් බැව් ද වාර්තා වේ. ඉන්දීය රිදී තිරයේ සුපතළ තරුණ හින්දි නළුවෙක් වන අන්කිට් ශර්මා මෙම චිත්‍ර පටයේ ජේසුතුමාගේ




චරිතය රඟපායි. චිත්‍ර පටය නිපදවා ඇත්තේ ඉන්දීය සංස්කෘතිය ද සංගීතය ද සමාජ පැවැත්ම ද නිරූපණය කැරෙන අන්දමින් දේශීය උෟරුවක් ලබාදීමෙන්‍ය.

මෙම චිත්‍ර පටයේ ක්‍රිස්තු චරිතය තුළින් වනිතාවන්ගේ ද දිළින්දන්ගේද අනාථයින්ගේ ද පව්කාරයන්ගේද විමුක්ති මග විදහා දැක්වෙන බැව් ඉන්දීය රදගුරු සම්මේලනයේ ප්‍රකාශක දොමිනික් ද අබ්රෙයෝ විසින් මාධ්‍යයට ප්‍රකාශ කරනු ලැබීය. ඉන්දීය සමාජයේ පවත්නා කුල භේද සහ වාර්ගික පීඩනයන් විදහා දක්වමින් ක්‍රිස්තු චරිතය මගින් කාලීන මිනිස් සමාජ ප්‍රශ්න වලට උත්තර සැපයුමක් කෙරෙනා බැව් ද විචාරකයෝ ද දක්වති. තවද මෙම චිත්‍ර පටය මගින් ක්‍රිස්තු චරිතය හා ඉන්දීය කතෝලික සභාව කෙරෙහි අන් ආගමිකයන් තුළ පවත්නා වැරදි මතිමතාන්තර වලට පිළිතුරු සැපයෙන බැව් ද ඉන්දීය රදගුරු සම්මේලනයේ ප්‍රකාශක පෙන්වා දෙයි. ඇදැහිල්ලේ වර්ෂය තුළදී ඉන්දීය දේශය පුරා අන්තර් ආගමික කතිකාවන් ද බයිබලීය සාකච්ඡා ද කිතුනු කලා කටයුතු ද ඉදිරිපත් කැරෙනා අතර කිතුමග චිත්‍ර පටයෙන් ද මහරු අධ්‍යාත්මික සේවාවක් ඇතිවේ යයි ද අපේක්ෂා කරේ.

## නෝවාගේ නැවේ ආකෘතියක් බිහිවේ



ලන්දේසි ජාතික ජොහාන් හියුබර්ස් නම් ඉංජිනේරුවා විසින් උත්පත්ති පොතේ දැක්වෙන නෝවාගේ නැවේ මිනුම් හා හැඩරුව ප්‍රකාශ ආකෘතියක් සාදා නිමකොට ඇත. මෙම නෝවාගේ නැවේ ආකෘතිය නිම කිරීමට ඔහු වසර තුනකට වැඩි කලක් ගත කළේය. මෙම දැවැන්ත නෝවා නැවේ ආකෘතිය තුළ ඒ ඒ නිශ්චිත ප්‍රමාණයේ සත්ව අනුරූපයන් ද දක්වා ඇත. තවද එම නැව් ආකෘතිය අඩි 450 ක් දිගය. එක්වරකදී 3000 ක් පමණ දෙනාට ඒ තුළට ගොස් නැරඹීම කළ හැක. නරඹන්නන් සඳහා ආපන ශාලාවක් ද වේ. නැව තුළ ඇති සියලු දෑ නරඹමින් දැස් හමුවේ සටහන් කරගැන්ම සඳහා දැවැන්ත කැමරා ද චිත්‍ර පට ශාලා දෙකක් ද පිහිටුවා ඇත.

මෙම කාර්යයේ නියැලීම සඳහා ජෝහාන් මෙහෙය වූ සිද්ධියක් ද වේ. වසර කීපයකට ඉහත දී ගං වතුරකින් නෙදර්ලන්තය විනාශ වී යන අයුරු ඔහු සිහිනයෙන් දැක ඇත. ඒ අනුව ඔහු විසින් මෙම නෝවා නැවේ ආකෘතිය නිර්මාණය කිරීමේ කාර්යයට තමා කැඳවනු ලැබ ඇතැයි ඔහු විසින් ප්‍රකාශ කැරේ.

වර්ෂ 2003 දී ඔහු විසින් නිමා කැරුනු කුඩා ප්‍රමාණයේ නෝවාගේ නැව් ආකෘතියක් ඕලන්දයේ ගංගාවල ප්‍රදර්ශනය කරනු ලැබීය. එම කාර්යය හේතුකොට ගෙන ඔහු ලද මූල්‍ය සම්පත් යොදවා මෙම දැවැන්ත නෝවා නැවේ ආකෘතිය නිම කරත. ලෝක විනාශය පිළිබඳ කතා බහට ආනුශංගි කව නෝවාගේ නැව් ආකෘතිය නිර්මාණය කරනු ලැබුවේ දැයි බොහෝදෙනා හා ආයතනයන් තමාගෙන් විමසන්නේ යයි ජොහාන් හෙළි දක්වා ඇත. එහෙත් එවැන්නක් අරමුණු කොටගෙන තමා නෝවාගේ නැව් ආකෘතිය නොකළ බවත් බයිබලයේ උත්පත්ති පොතේ දැක්වෙන පරිදි එම නිර්මාණය කිරීමට තමා ලද මෙහෙයුම අනුව එම කාර්ය කළ බැව් ඔහු සනාථ කරයි.

## 27 දෙනෙක් මරා දැමීමෙන් දහස් සංඛ්‍යාවක් යැදුමේ



දෙසැම්බර් 14 වැනි සිකුරාදා ඇමරිකාවේ මෑත ඉතිහාසයේ ජනාධිපතිවරයා ඇතුළු සමස්ත ජනතාව හැඬවූ අතිශය දුක්බර දවස වූවා. ඒ මන්දයත් කෙනෙක් මිකෙම් නගරයේ ප්‍රාථමික පාසලක සිදුවූ වෙඩි තැබීමක් නිසයි. ප්‍රකාශිත පරිදි අවුරුදු 5-10 දක්වා වයසැති දරුවන් 20 දෙනෙක් ද ගුරුවර ගුරුවරියන් 7 දෙනෙක් ද දිවි පූජා කොට ඇත. තවත් ගුරුවරියකගේ 20 හැවිරිදි පුතා විසින් මේ විනාශය කිරීමට දායක වූ හේතුන් විග්‍රහවෙමින් පවතී.

මෙම ඝාතනය සිදුවූ නගරයේ පිහිටි සා. රෝස කුසුමේ මෑණියන්ගේ දෙව්මැඳුර කිසිවකුගේ මෙහෙයුමක් නැතිව පිරී ඉතිරී ගොස් ඇත. දෙව්මැඳුර තුළත් අවට පරිසරයෙත් ඉටිපහන් දල්වමින් කඳුළු හෙලූ ජනතාව නිරායාසයෙන්ම පෙළඹුනේ අම්මලා තාත්තලාගේ දුක දෙවිඳුන් හමුවේ ප්‍රකාශ කිරීමටයි. බොහෝ දෙනා රූරා හැලෙන කඳුලින් දෙවියනී..... දෙවියනී...... (O GOD) යන කෙටි යැදුමෙන් වැළපුනේය. තවත් අය එකිනෙකා වැළඳගෙන බොහෝ වේලාවක් වැළපුනෝය. තවත් කණ්ඩායම් ජපමාලය මහා හඬින් උච්චාරණය කළහ. දෙව්මැඳුර තුළත් පිටතත් කන්නලව්වෙන් සර්ව රාත්‍රිය මහා යැදුමක් බවට හැරවිණි.

මේ වේදනාකාරී සිද්ධිය තුළින් අමෙරිකාවේ දරුවන් හා අවි ආයුධ පිළිබඳ ප්‍රතිපත්තීන් යළි සළකා බැලීම සඳහා පණිවුඩයක් ඇතැයිද කිතුනු පුවත් පෙන්වා දී ඇත. තවද පසුදා පුවත්පත්වල පළවූ සුදොතුම් පියාගේ පිතෘක සෙනෙහසේ පණිවුඩය විසින් පීඩාකාරී ජනතාවට ආදර සිසිලක් ගෙනදී ඇත.

## චීන බලධරයෝ කතෝලික රදගුරු පත්වීම අවලංගු කරති

චීනයේ දිගින් දිගට පවත්නා කතෝලික විරෝධතාවයන් හමුවේ මේ වසරේ ශුද්ධාසනය විසින් රදගුරු ලෙසින් පත්කෙරුණු ලැබූ තද්දේවෝ මා ඩාකුයින් හිමිපාණන්ගේ එම තනතුර චීනයේ බලධරයන් විසින් තහනම් කොට ඇත. එම චීන බළධාරින්ගේ බලපෑම් වලට යටවූ ඊනියා රදගුරු මණ්ඩලයක් චීනයේ පවත්නා අතර එම බළධාරීන්ගේ තර්ජන ගර්ජන ඔස්සේ තද්දේවෝ මා ඩාකුයින් රදගුරු තුමා සිය තනතුරෙන් ඉවත් කර ඇතැයි ලොවැ දහම පතුරුවාලීමේ සංසදයේ ලේකම් හොං තායි පායි නම් අගරදගුරු හිම්පාණන් විසින් සනාථ කොට ඇත.

චීන බළධාරින්ගේ ඕනෑ එපාකම් අනුව එරටේ පවත්වාගෙන යනු ලබන ඊනියා රදගුරු මණ්ඩලය ශුද්ධාසනය විසින් කිසිදා පිළි නොගනු ඇත. චීනයේ හැර ශුද්ධෝත්තම පියාගේ පිතෘක නායකත්වය පිළිනොගන්නා එබඳු රදගුරු මණ්ඩලයක් ලෝකයේ අන් කිසිදු රටක නොපවත්නා බැව් ද හෙළි දක්වා ඇත. තවද තද්දේවෝ ඩාකුයින් රදගුරු තුමන් වෙත එල්ල කරති තාඩන පීඩන හා සිරකර තැබීම් හමුවේ වුවද ශුද්ධෝත්තම පියාගේ ඒකීය නායකත්වය යටතේ රැඳී සිටීම චීන බළධාරින් වෙත එල්ල වී ඇති අභියෝගයකි. එතුමා විසින් අත්දකිනු ලබන හිංසනයන් ලෝක ජනතාව අතර ප්‍රචලිත වීමේ හේතුවෙන් චීනයේ කතෝලික සභාව වර්තමානයේදී මොනතරම් පීඩනයට ලක් කර ඇතැයි ද ජාත්‍යන්තර මාධ්‍යයන් විසින් ද දැන් දැන් විශාල වශයෙන් ප්‍රකාශයට පමුණුවා ඇත.

ලෝකය පුරා ධර්මදානයේ යෙදෙන සාවියෝ හොං තායි පායි අගරදගුරු හිමිපාණන් විසින් චීනයේ පවත්නා කතෝලික හිංසනයේ අමානුෂිකත්වය හුවා දක්වමින් ඊට එරෙහිව හඬ නගනා ලෙසට ද ආයාචනය කරත. තවද මෙම ක්‍රිස්තු ආගමන සමයේදී චීනයේ පීඩිත කිතුනු ජනතාව වෙනුවෙන් දෙවිඳුන්ට කන්නලව් කරනා ලෙස ද එතුමා ලෝක කිතුනු ජනතාවගෙන් ඉල්ලා සිටිති.

## බ්‍රිතාන්‍ය කිරුළට වනිතා හා කතෝලික වෙනස්කම් අවසන්



බ්‍රිතාන්‍ය කිරුළ පිළිබඳව එරටේ අදට පවත්නා නීතිය අනුව ඔටුන්න හිමිවන්නේ රජ පරම්පරාවේ උපත ලබන රජ කුමරුවන්ටය. ප්‍රථම උපත කුමරියක් වූවත් ඇට ඔටුන්නේ හිමිකම ලැබෙන්නේ නැත. දෙවෙනි එළිසබෙත් රැජිනට එදා රජකම ලැබුණේ ඇට සහෝදරයන් නොසිටි නිසාය.

තවද ඔටුන්න හිමි කුමරකු විසින් කතෝලික කාන්තාවක් විවාහ කරගතහොත් ඔටුන්න කෙරෙහි ඔහුගේ අයිතිය අහිමි වනු ඇත. පවත්නා මෙම තත්ත්වය යටතේ බ්‍රිතාන්‍ය වනිතාවගේ මූලික අයිතිවාසිකම් බිඳ වැටී ඇතැයි ද කලක් මුළුල්ලේ හඬක් නැගෙමින් පවතී. මෙම කරුණ අළලා බ්‍රිතාන්‍ය රජයේ නියෝජ්‍ය අගමැති නිග් කෙල්ග් විසින් දෙසැම්බර් මස 04 වෙනිදා ප්‍රකාශ කරනු ලැබුවේ බ්‍රිතාන්‍ය කිරුළ කෙරෙහි හිමිකම් බ්‍රිතාන්‍ය වනිතාවන්ට තහනම් කරනු ලැබ තිබීම කඩිනමින්මැ අවසන් කරන බවයි. පවත්නා නීති ප්‍රකාර බ්‍රිතාන්‍ය කිරුළ අරභයා බ්‍රිතාන්‍ය වනිතාවගේ අයිතිය සුරැකීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයේ අනෙකුත් රාජ්‍යයන් 15 වේ ද අනුමතිය දැනටමත් ලැබී ඇතැයි ද නියෝජ්‍ය අගමැති වරයා විසින් ප්‍රකාශ කොට තිබේ.

වර්ෂ 2011 ඔක්තෝබර් මාසයේදී එම ව්‍යවස්ථාගත වෙනස ක්‍රියාත්මක කිරිම සඳහා සියලු පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් විසින් දී ඇති තීන්දුව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට එම තීන්දුව වර්ෂ 2011 සිටමැ ක්‍රියාත්මක කෙරෙනා බැව් ද වාර්තා වේ. නීතියේ වෙනස්කම් ඇති කිරීමෙන් පසුව රාජකීය පවුලේ අයට කතෝලික කාන්තාවන් හා විවාහ වී තවදුරටත් ඔවුන්ගේ ඔටුන්නේ අයිතිය රැක ගැන්මට හැකිවනු ඇත. නමුත් කතෝලික කාන්තාවකට රජ කිරුළ දැරීමේ අයිතියක් නම් නොමැත. මන්දයත් වර්ෂ 1701 පාර්ලිමේන්තු පනත අනුව බ්‍රිතාන්‍ය කිරුළ දරන්නා එංගලන්ත සභාවේ සාමාජිකයකු විය යුතු වේ.

## ආරාමයට සත් වරක් පහර දුන්නත් සමාව දෙති

පසුගිය සතියේ කෙරුනු පහරදීම ඇතුළුව යුදා අන්තවාදි කණ්ඩායමක් විසින් ජෙරුසලමේ ඔතොඩොක්ස් සභාවට අයත් ආරාමයකට සත් වතාවක් පහරදී තිබේ. ආරාමයේ දොරගුලු බිඳ දමමින් ද ආරාමයේ වටපිටාවේ කිතුනු විරෝධි පාඨයන් හා චිත්‍ර දක්වමින් ද වාහන කීපයකට පහර දෙමින් ද සෑහෙන විනාශයක් සිදුකොට ඇත. විටින් විට සිදුවූ මෙම දුර්දාන්ත ක්‍රියාදාමය ඊශ්‍රායෙල් අගමැති බෙන්ජමින් නෙතායන් යාහු විසින් ද හෙළා දැක තිබේ. ඔහු විසින් මාධ්‍යයට ප්‍රකාශ කරනු ලැබුවේ එම ත්‍රස්ත ක්‍රියාකරුවන් සොයා ඔවුන්ට දඬුවම් ලබාදෙන බවයි. එම පීඩාකාරී හා වේදනාකාරී තත්ත්වය යටතේ වුවද එකොළොස්වෙනි ශත වර්ෂයේ ගොඩනැගී ඇති එම ආරාමයේ පාලක ක්ලෝඩියස් පියතුමා විසින් මෙලෙස ප්‍රකාශ කොට ඇත.

'මෙම සිත් රිදවන ක්‍රියාව දැනට සත් වතාවක් සිදුවී ඇත. එසේ වුවද මෙම වරදට අපි සත් වතාවක්මැ සමාව දෙන්නෙමු. තවද ඔවුන් විසින් තවත් හැත්තෑ හත් වරක් ඒ වරදම කරනු ලැබුවහොත්, අපි යළි යළිත් 77 වාරයක්මැ ඔවුන්ට සමාව දානය කරන්නෙමු. ඔවුන් අපේ දොරටුවට තට්ටු කළහොත් අපි ඔවුන්ව සතුටින් බාර ගෙන කෝපි කෝප්පයක රස විඳිමින් අපේ ඇදැහිල්ල ගැන ඔවුන් හා පිළිසඳරේ යෙදෙන්නෙමු.' එම ප්‍රකාශය තුළින් දෙදහස් වසරකට ඉහතදී එම පරිසරයේදීමැ ජේසුස් වහන්සේ පැවැසූ සමාවේ වදන් යළි රාව නැංවීම සැබෑ අභියෝගයක්මැ බැව් වාර්තා වේ.


## 52 ක් මරා දැමූ දෙව් මැඳුර යළි උපදී



ඉරාකයේ බැග්ඩැඩ් හී පිහිටි සදා සරණ මෑණියන්ගේ දෙව් මැඳුර වර්ෂ 2010 ඔක්තෝබර් මස 31 වෙනිදා, එහි දිව්‍ය යාගයට සහභාගි වෙමින් සිටි ඇදැහිලි වන්තයන් 50 ක් ද පූජක වරුන් දෙදෙනෙක් ද මරා දමමින් ද තවත් විශාල පිරිසක් තුවාල කරමින් ද අල්කයිදා ත්‍රස්තයෝ මෙම දෙව් මැඳුර විනාශ කළෝය. එලෙස ජීවිත පූජා කළ ඇදැහිළි වන්තයන්ගේ ලේ ගැවැසුණු එම භූමියේම නව දෙව් මැඳුර ආසිරි ගැන්වූයේ ලොව නැගෙනහිර සභාවන් භාර අතිඋතුම් ලෙනාර්ඩෝර් කාදිනල් සන්ද්‍රි හිමිපාණන් විසිනි. එතුමා ඉරාකයේ දින 5 ක සංචාරයක නියැළී සිටියේය.

ඉරාක කිතුනුවෝ වසර ගණනාවක් මුළුල්ලේ තාඩන පීඩනවලට ලක්වී සිටිති. එහෙත් ප්‍රාණ පරිත්‍යාගයන් මැද වුවද ඉරාක කිතුනුවෝ සිය ඇදැහිල්ල තුළ තව තවත් අධ්‍යාත්මික සවිය ලබමින් පෙරට යති. ලෙනාඩෝ කාදිනල් තුමා ඒ ඒ පීඩා විඳින ප්‍රජාවන් කරා ගොස් ඔවුන්ට සවියක් ගෙනදීමේ දෙව් වදන් බෙදා ගත් සේක. ඉරාකයේ ඇදැහිල්ලේ වර්ෂය දියත් කරමින් නත්තල් ගීත නාට්‍යයක් ද එතුමාගේ ප්‍රධානත්වයෙන් බැග්ඩෑඩ් හී වේදිකා ගත කරනු ලැබීය. උන්වහන්සේගේ දින පහේ චාරිකාව, අර්බිල් නගරයේ පූජක පුහුණු ආයතනයේදී සිදු කැරුණු දිව්‍ය යාගයෙන් අවසන් විය.

විශේෂාංග



# තානායම් පාලකයාට දෝෂාභියෝගයක්

**තානායම් පාලකයාට එරෙහිව නැගෙන්නට වූ උද්ඝෝෂණ සහ විරෝධතා දිනෙන් දිනම උග්‍ර අතට හැරෙමින් පැවතිනි. දරුවන් අහිමි වූ දෙමාපියන් පමණක් නොව අනෙකුත් ජනතාව ද ඊට එක් වූයේ සේසරු අධිරාජයා හා කෙලෙසින්වත් මැඩ පැවැත්විය නොහැකි අන්දමිනි. එකාමෙන් නැගී සිටි ජනතාව භේද බින්න කිරීමට ගත් තැත ද සාර්ථක කර ගැනීමට නොහැකි වූ තැන ඔහු හට කළ හැකිව තිබුණේ තානායම් පාලකයාට ඉල්ලා අස්වන ලෙස කියා සිටීමය. එහෙත් එයින් පසුව ඔහුට දෙන්නට තරම් ඊට වඩා උසස් තනතුරක් ද නොවූයෙන් ඔහු එසේ කළේ නැත.**

හිටපු අධිරාජයාට එරෙහිව සටන් වැදුනු අයවලුනට තමන් බලයට පැමිණි විගස කළගුණ සැළකීමට අමතක නොකළ මොහු මෙම විරෝධතා දෙස දින සියයත් ඉක්මයන තුරුත් බලා සිටියේ ඔවුන්ටම ඇති වී ඔවුන්ම ඒවා නතර කරනු ඇතැයි සිතාගෙනය. මෙම කල් මැරීමට මඟ පෑදුවේ මෙම සිද්ධියෙන් පසු රෝහල් ගත කරන ලද තානායම් පාලකයාට සිදුවූ සියල්ල අමතක වී තිබීමයි. මේ අතරතුර සේසරුගේ ආරක්ෂක භටයින් විසින් ජල ප්‍රහාර කඳුළු ගෑස් රබර් උණ්ඩ පමණක් නොව ජීව උණ්ඩද යොදා ගනිමින් විරෝධතාකරුවන් පළවා හැරීමට කළ මෙහෙයුමේ දී විරෝධතා කරුවන් අතරින් විශාල පිරිසක් ජීවිතක්ෂයට පත් වූහ.

එසේ වුවද සේසරු උතුමාණන් කියා තිබුණේ තමන් හට ගැහැනියක පිරිමියකු කරනවා හැර කරන්නට බැරි දෙයක් නැතැයි කියාය. සැමදා බලයේ රැඳෙන්නට දැමිය හැකි හැම දහන්ගැටයක් ම දැමූ ඔහු උන් හිටි ගමන් ජන සංගණනයක් පවත්වා තම බලය තක්සේරු කිරීමට අදහස් කළේ තැටිය රත් වූ විටදී රොටිය පුළුස්සා ගැනීමේ සංකල්පය මතය.

මෙම ජන සංගණනය ගැන නිල වශයෙන් ප්‍රචාරය කරන්නටත් පෙර ඔහු තානායම නිරීක්ෂණය කිරීමට පැමිණි අන්දම රූපවාහිනියේ සෑම නාලිකාවකින් එකවර ප්‍රචාරය කෙරුණි. ඔහු එසේ පැමිණියේ කිසිවකුටත් නොදන්වා යැයි ප්‍රචලිත වුද, ඊට ප්‍රථම තානායමට කඩා වැදුනු ආරක්ෂක භටයින් තානායමේ අස්සක් මුල්ලක් නෑර පරීක්ෂා කළේ තමන්ගේ ආරක්ෂාව තමන්ම සලසා ගැනීමේ පදනම මතය. මෙම සම්ප්‍රාප්තිය රූපවාහිනී නාලිකා සියල්ලෙන්ම ප්‍රචාරය නොවුනි නම් සිදුවන සන්තෑසිය සැවොම දනිති. එවැනි මාධ්‍ය ආයතනවලට පහර දීම හා මාධ්‍යවේදීන් හට සිදුවූයේ කුමක්දැයි සොයා ගැනීමට නොහැකි තත්ත්වයකට පත් කරලීම අධිරාජයා හට නුපුරුදු දේවල් නොවීය.

තානායම නිරීක්ෂණය කිරීමට අධිරාජයා පැමිණෙන බව දැනගත් තානායම්කරුවා සේවකයිනට මාසික වේතනය පවා නියමිත ලෙස ගෙවා ගත නොහැකි අන්දමින් ප්‍රපාතයට වැටී තිබුණු තානායම තුළ කිසිදු අඩුපාඩුවක් නැතිබව මවා පෑමට නොගත් තැතක් නැත. කැඩී බිඳී ගොස් තිබුණු ගේට්ටුව අලුත්වැඩියා කර කාමර සකස් කර සේවකයිනට නිල ඇඳුමෙන් සැරසී සිටින්නට නියෝග කළ ඔහු බුලත් හුරුල්ලක් දී අධිරාජයාණන් පිළිගත්තේ මහත් භය භක්තියකිනි. මෙහිදී ද සංගනණය සඳහා තානායමේ නවතින්නට එන සියල්ලන්ටම උස් පහත් බවකින් තොරව ඉඩකඩ ලබා දිය යුතු බව ප්‍රකාශ කිරීම සුපුරුදු ලෙසම සිදුකෙරුණි.

තමන් ජනතා සුබ සිද්ධියට ඇප කැප වන බව එසේ ප්‍රකාශ කළ අධිරාජයා එයින් නැවතුනේ නැත. ඊළඟ අයවැයෙන් වැඩිම මුදලක් වෙන් කළේ තානායමේ ප්‍රතිසංස්කරණය වෙනුවෙනි. තානායමට පැමිණෙන පාර කොන්ක්‍රීට් අතුරා සකස් කිරීම ද ඔහුගේ සැලසුමට අයත් විය. මේ සඳහා තෝරා ගැනුණේ තමන්ගේ අනුගාමිකයින් බැවින් සිදුවූ දූෂණ අක්‍රමිකතා මෙන්ම නාස්තිය ගැන ද අමුතුවෙන් කිවයුතු නැත. ලැබුණු මුදලින් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් ගියේ ඔහුගේ සහචරයින්ගේ සාක්කුවලටය. සේසරු උතුමාණන් පවසන වදන් කොතරම් සිත් ඇද ගන්නා සුළු වූවත් කෙරෙන විටදී අනෙකක් සිදුවීම කොයි කවදත් දැක ගත හැක්කකි.

නන්නාඳුනන, ඈත පළාතක සිට මැදියම් රැයේ කුස තුළ දරු බරද දරාගෙන පැමිණි යුවළට තානායම තුළ ඉඩ නැතිවූයේ ද මේ හේතුවෙනි. අධිරාජ්‍යාගේ ලැයිස්තුව අනුව පැමිණි අයටත් තානායම් පාලකයාට අත මිට මෙළවූ අයටත් ඉඩ ලබාදීමෙන් පසු තවත් ඉඩක් තානායම තුළ නොතිබිණි. මෙම යුවළට තානායමට නුදුරින් වූ ගවහලේ නතර වෙනවා හැර කරන්නට අනෙකක් නොතිබිණ.

මෙලෙසින් ගවහළ තුළ රජකුමරකු මෙලොව ජනිත වීමත් සමඟ පැයු වල්ගාතරුවේ එළිය ඔස්සේ පැමිණි ශාස්ත්‍රවන්තයින්ගෙන් මේ ගැන හෙරෝද් රජුට දැනගන්නට ලැබීමෙන් තත්ත්වය බරපතළ විය. මෙලොව උපත ලද රජකුමරා ගැන ඇසීමෙන් මහත් සේ කැළඹීමට පත් හෙරෝද් රජු කියා සිටියේ තමන් හට ද කුමරා බැහැදකින්නට යාමට ඔහු උපන් තැන නිශ්චිත වශයෙන් දන්වන ලෙසය. මුළු ප්‍රදේශය පුරා මතට තිත තියා ඇතත් රතු වයින් පානයෙන් පදමට සප්පායම් වී සිටි ඔහුට පඬිවරුන් සමඟ යන්නට හැකිවූයේ නැත. පඬිවරුනට ද කුමරා වැඳ පුදා ගැනීමෙන් පසු හෙරෝද් වෙත එන්නට ලැබුනේ නැත.

මෙහිදී තමන් හට එරෙහිව නැගිය හැකි බලවේගය වනසා දැමීම සඳහා හෙරෝද් හට කළ හැකි වූයේ වයස අවුරුදු දෙකට අඩු දරුවන් ඝාතනය කරන ලෙස අණ පැනවීමය. බිළිඳාගේ මව්පියන් බිළිඳා රැගෙන එම රැයේම පළා ගොස් සිටි අතර අහිංසක අසරණ අවුරුදු දෙකට අඩු දරුවන් සැවොම හෙරෝද්ගේ කුරිරු අණසක හමුවේ දිවි පිදූහ. තම දරුවන් සඟවා ආරක්ෂා කර ගැනීමට අසරණ දෙමාපියන් නොගත් තැතක් නැතිවූයේ දරුවන් තරම් සම්පතක් ඔවුනට තවත් නොවූ බැවිනි. එහෙත් අධිරාජයාට එසේ නොවීය. ඔහුගේ අණසක අනුව ඔහුගේ හිතසුව පිණිස නූපන් දරුවන් මරා දැමීම වුවද ඔහුට හරිය.

තානායම් පාලකයාට එරෙහිව ජනතා විරෝධය මතු වූයේ මෙම අමානුෂික ක්‍රියාදාමයත් සමඟය. තානායම්කරුවා මැදියමේ පැමිනි යුවළට තානායමේ ඉඩ දුන්නා නම් මෙවන් රුදුරු ළදරු ඝාතන සිදු නොවන බව ඔවුන්ගේ අදහස බැවින් ඔවුන් පාරට බැස්සේ කිසිවකුගේ බලපෑමකින් හෝ මෙහෙයවීමකින් තොරවය.

මෙම විරෝධතා මැඩ පැවැත්වීමට කළ සියල්ලම නිශ්ඵල වූ තැන සේසරු අධිරාජයා කළේ තානායම්කරුට එරෙහිව දෝෂාභියෝග යක් ගෙන ඒමය. තානායම්කරුවා තරම් සේසරුට තවත් හිතවතකු නොවූ බැවින් මෙය කිසිවකුටත් වටහා ගත නොහැකි ගැටලුවක් විය. තමන්ගේ පැත්තේ අයට උපරිමයෙන් සැළකීමත් අන් අයගේ ගෙල සිඳ දැමීමත් සේසරුගේ සිරිත බව නොදන්නා කෙනෙක් නැත.

සේසරු අධිරාජයාගේ දෝෂාභියෝගය අනුව පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කැඳවනු ලැබූ තානායම් පාලකයා එහි පැමිණියේ කිසිදා පසුබට වීමකින් තොරවය. ඔහු එහිදී කියා සිටියේ තානායමේ ඉඩ තිබුණු බවත් ඔවුන් ගවහලට ගියේ තමන් එපා යැයි කියද්දී ඔවුන්ගේම කැමැත්තෙන් බවත් ය. මෙහි සත්‍ය අසත්‍යතාවය දැන ගැනීමට බිළිඳාත් ඔහුගේ මව්පියන් දෙදෙනාත් ආගිය අතක් නොවූයෙන් විත්තිය පැමිණිල්ල බවටත් පැමිණිල්ල විත්තිය බවටත් පත් වෙමින් තානායම්කරුවා සියලුම චෝදනාවලින් නිදහස් කෙරුණි.

✍ පස්කල් ජයමාන්න
උස්වැටකෙයියාව

# කන්‍යාවකට දරුවකු ලැබීම නත්තලේ අභිරහසයි

**ජේසු උපත සිහිගන්වන නත්තල වසර අවසානයත් සමඟ එන ආගමික උත්සවයකි. 2012 නත්තල ලංකාවාසී ජනතාව පවත්වන 507 වන නත්තල කීවොත් නිවැරදිය. ක්‍රි.ව. 1505 දී ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා අරාබි නැව් ලුහුබඳිද්දී ඉන්දියන් සාගරය දෙවනත් කරමින් හැමූ කුණාටුව හරහා ගාලු පෙදෙසට සේන්දුවූයේ අහම්බෙනි. 1505 ඉල් මස ලක්දිවට ගොඩබට ඔහුගේ නඩය මසකින් එනම් උඳුවප් මහේ අවසන් සතියේ (25) පළමු නත්තල මෙහිදී සැමරූ බව ඉතිහාසය කියයි.**

එදා නත්තල් දේව මෙහෙය සිදු කළේ එම පිරිසේ සිටි වින්සෙන්ති නම් පූජකතුමා බව කියැවේ. මෙසේ අහම්බෙන් මෙහි පැමිණි පෘතුගීසින් සිරිලක් ජනතාවට කිතු දහම තෑගි කළෝ ය. අද ලංකාවේ ජීවත්වන කිතුනුවන් පමණක් නොව, සෙසු ආගමිකයින් ද ජාත්‍යන්තර උලෙළක් වූ නත්තල උත්සවාකාරයෙන් පවත්වති.

නත්තලට පාදක වන්නේ ලොව මවා පාලනය කරන, දෙවි මහෝත්තමයාණන්ගේ ඒක ජාත පුතණුවන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දුබල මිනිස් කය ගෙන මිනිසුන්ගේ ලෝකයට පැමිණීමයි. මේ සිද්ධිය අපේ යුගය, ක්‍රිස්තු පූර්ව හා ක්‍රිස්තු වර්ෂ ලෙස යුග දෙකකට බෙදා වෙන් කිරීමට තුඩු දුනි. නත්තලේ අසාමාන්‍ය පසුබිම වන්නේ කන්‍යාවක් ගැබ් දරා දරුවකු ප්‍රසූත කිරීමේ අසමසම සිද්ධියයි. මිනිස් බවට දෙවි බව මිශ්‍ර වීමයි. මේ කන්‍යා උපත සිදුවීමට ශත වසර කීපයකටම පෙර දිවැසි වාක්‍යයක් ලෙස ශුද්ධ ලියැවිල්ලේ සඳහන් වීමත් එක්තරා සුවිශේෂී සංසිද්ධියකි (යෙසායා 7:14). කන්‍යා උපත් අප අසා ඇත්තේ මිත්‍යා සාහිත්‍ය කථාවල පමණි. එහෙත් ජේසු උපත මිථ්‍යාවක් නොව, සත්‍ය සිදුවීමක් මැයි, ජේසු උපත වැල්වටාරම් වලින් තොරව, ග්‍රන්ථාරූඪ කළ ශු. ජුවාම් තුමා නත්තල යනු දෙවි පියාණන්ගේ "වචනය තෙම" එනම් දේව ආදරය මිනිස් බව ගැනීමක් ලෙස අර්ථකථනය කරයි.

මෙම අභිරහස්මය උපත තේරුම් ගැනීමට අපි ජේසුගේ කාලයේ ජුදයාවේ තිබූ සමාජ චාරිත්‍රවල පසුබිම මඳක් සොයා බැලිය යුතුයි. ජුදා විවාහයට ඉසව් තුනකි. විවාහ ගිවිස ගැනීම පළමුවැන්න විය. මෙය දෙදෙනාගේ ළමා අවධියේ සිට ගිවිස ගනී. දෙවැනි අදියර ඔවුන් යෞවන වියේ දී දෙමාල්ලන්ගේ කැමැත්තෙන් ස්ථිර වීමයි. එහෙත් මේ අවධියේ දෙදෙනාට ලිංගික සම්බන්ධකම් පැවැත්වීමට තහංචි විය. නමුත් දෙදෙනා ඇමතුම් ලැබුවේ විවාහක පුරුෂයා හා විවාහක ස්ත්‍රිය ලෙසයි. දේවදූතයා මංගලම් කීම සිදුවූයේ මේ අවස්ථාවේදීය. මරියතුමී "එහෙත් මම පුරුෂයකු නොහඳුනම්"යි ගාබ්‍රියෙල් දේවදූතයාට කීවේ මේ පසුබිම යටතේ ය. (ලූක් 1:34). විවාහ ගිවිසගත් අවස්ථාව මෙය නිසා, අඹු සැමි ඇසුරක් නොතිබුණ නිසාවෙනි. මතෙව් 01 පරිච්ඡේදයේ 19 වගන්තියේ "ඇගේ ස්වාමිපුරුෂයා වන ජුසේතුමා" ලෙස හඳුන්වන්නේ මේ පසුබිම මතය. ජුසේ තුමා "මරියතුමිය රහසින් අත්හැරීමට" සිතුවේත් මේ පසුබිම මතය (මතෙව් 1:19). ළදරු සභාව විසින් විශ්වාස ලක්ෂණයේ මෙම කන්‍යා උපත විශ්වාසයට බඳුන්විය යුතු ලක්ෂණයක් ලෙස ප්‍රකාශ කෙරිණි. ඒ යුගවල විසූ ඇරිස්තයිඩ් (ක්‍රි.ව. 140) සහ ප්‍රාණපරිත්‍යාගි ජස්තින් තුමා (ක්‍රි.ව. 170) මේ ගැන සංදේශ ලිපි ලියා ඇත. චල්දියානු විශ්වාස ලක්ෂණයේ ද (ක්‍රි.ව. 450) මෙය ඇදහිය යුතු ලක්ෂණයක් ලෙස ප්‍රකාශිත විය.

මෙම අභිරහස විශ්වාසවන්තයින්ට ගැඹුරුව පසක් කිරීමට දෝ ශු. ලූක් තුමා "දෙවියන් වහන්සේට කළ නොහැකි දෙයක් නැතැ"යි (1:37) ලියයි. ජේසු උපත පමණක් නොව, එතුමාගේ ජීවිතය, මරණය, උත්ථානය වැනි අසමසම සිද්ධීන් මෙනෙහි කරද්දී, කන්‍යා උපත ගැන අපි මවිත නොවිය යුතුයි. කන්‍යාවක් ගැබ්දරා දරුවකු ප්‍රසූත කරන්නීය" (මතෙව් 1:23) යන්න පැරණි ගිවිසුමේ සඳහන් අනාවැකියකි. මෙවැනි විශ්වාසයක් පැරණි චීන ජාතිකයින් අතර තිබූ බව ඇලෙක්සැන්ඩර් හිස්ලොප් විසින් රචිත ද "ටූ බැබිලෝන්ස්" දේවදූතයා මරියතුමියට ගැබ් දරා දරුවකු ලබන පුවත ප්‍රශ්නයක් වූයේත්, ඇය කන්‍යාවක්ව සිටියදී එවැන්නක් කෙසේ සිදුවේදැයි නැගුණු සසලවීම හේතුවෙනි. කන්‍යා උපතට හොඳම සාක්ෂිය මෙය නොවේද? ඇය සමඟ විවාහ ගිවිසගෙන සිටි ජුසේ තුමා ඇය දරුවකු ලැබීමේ ලකුණු පෙන්වද්දි රහසින් ඇය අත්හැරීමට තීරණය කළේත් මේ කන්‍යා උපතයි. කන්‍යාවක් ලෙස ජේසු සමිඳුන් බිහිකළ මරියෝත්තමාවෝ එම පවිත්‍රතාවය මරණය දක්වා රැකගත් බව සභා මාතාව අපට උගන්වන්නීය. මරිය තුමිය සිය මව වූ ශු. ආනා තුමියගේ කුසේ ජම්ම පාපයෙන් නිදොස්ව පිළිසිඳීම ගැන සලකද්දි කන්‍යභාවය රැකගෙන බිළිඳා බිහිකිරීම ආශ්චර්යයක් නොවේ.

ගලාතිවරුන්ට යැවූ සංදේශයේ ශු. පාවුළු තුමා මෙසේ ලියා ඇත. "නිසි කාලය පැමිණි කල, පියාණන් වහන්සේ කන්‍යාවක් මඟින් තම පුතණුවන් මෙලොවට එවා වදාළහ." කන්‍යා උපත නියම ලෙස සඳහන් වන්නේ ජුවාම්ගේ සුපුවතේ බව කිව යුතුයි. දේව පුතණුවා මිනිස්බව ගත්තේ ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවයෙනි. මාංශගතවීමේ ප්‍රාතිහාර්යය නම් ජේසු දෙවි බවින් හිස් වී මිනිස් භාවයේ ඉපදීමයි. එයට ස්ත්‍රී පුරුෂ කායික සම්බන්ධයක් අනවශ්‍යය. මේ නිසා ශු. ලියවිල්ලේ ජුසේ තුමා ජේසුගේ පියා ලෙස කොහේවත් සඳහන් නොකිරීම කන්‍යා උපතට ඉඟියකි. කිසිම ආධාරකයක්, අමු ද්‍රව්‍යයක් නොමැතිව ලෝකයත් මිනිසාත් මැවූ පියාණන් වහන්සේ තම පුත්‍රයාට මිනිස් බව දීම විශේෂිතව නොකරයි ද? ජුවාම් සුපුවතේ පමණක් ජේසු පිය දෙවිඳු "පියාණන් වහන්සේ" ලෙස 107 වතාවක් හඳුන්වන සේක. තමා බිහිවූයේ මිනිස් පියකු ගෙන් නොවන බව පුන පුනා කීමකි. ඒ "ඔබ මා සෙව්වේ මන්ද? මගේ පියාණන්ගේ ගෘහයෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නේ ද?" (ලූක් 2:49) මෙවැනිම ප්‍රකාශයක් නව තෙස්තමේන්තුව සිසාරා එමට ඇත. කන්‍යාවක්ව සිටියදී ජේසු බිහිකළ මරියතුමිය එය හොඳින් තේරුම් ගන්නට ඇත.

ලෝකයේ දෛනිකව ලක්ෂ ගණනින් මිනිස් උපත් සිදුවේ. ඒත් ජේසු උපත එවැන්නක් නොවේ. දෙව් ලොව, මිනිස් ලොවට යා කළ දේව උපතකි. නත්තල එවැන්නක්. සාමාන්‍ය ලෙස සිදුවිය හැකිද? උපත් පිළිබඳව මිත්‍යා කථා, ජනප්‍රවාද සෙසු ආගම් තුළ ඇත. එහෙත් ජේසු උපතට ඓතිහාසික හා භූගෝලීය පසුබිමක් ඇත.

☛ 15 පිටුවට

✍ ලෙනාද් රංජිත් මහආරච්චි
මොරටුව

විශේෂාංග

ප්‍රදීපය කෙටි කතා

# නත්තල් සීයාට තෑග්ගක්!

නත්තල් උත්සව කමිටුව රැස්විණි. එය සමන්විත වූයේ වැඩිහිටියන්ගෙනි. මෙදා නත්තල් උත්සවය ඉහළින් පැවැත්විය යුතු බවට කමිටුවේ සියල්ලෝ අවධාරණය කළහ. ළමුන්ගේ උත්සවයක් නිසා ඔවුන් වැඩිපුර කථා කළේ ගවලෙන හා නත්තල් රෑ පූජාව හා නත්තල් සීයා ගැනය. නත්තල් සීයාට හැමදාම ආ රපියෙල් උන්දෑ අසනීප වී සිටීමත් විශේෂයෙන් උන්දෑගේ ඇස් නොපෙනීමත් වැඩිවශයෙන් සාකච්ඡා විය.

වසර නමයක් දිගටම නත්තල් සීයාමෙන් උන්දෑ කළ සේවය කවුරුත් එකසේ අගය කළහ. ළමුන් උන්දෑට කළ ආදරය, බොහෝ දෙනා ප්‍රශංසා මුඛව කථා කළහ. එහෙත් උන්දෑගේ අසනීප තත්ත්වය නිසා අවසානයේ තීරණය කළේ නත්තල් සීයාට මෙවර වෙනත් අයකු තෝරා ගන්නට ය.

එක් එක් අය එක් එක් යෝජනා කළහ. සමහරුන්ගේ යෝජනා සමහරුන් තරයේම ප්‍රතික්ෂේප කළහ. සියල්ලන් යෝජනා කළ අයගේ සැඟවුනු ජීවිත ගැන සමහරු කතා කළහ. බොහෝ අය ගැන නොදන්නා දේ සත්‍යය හෝ අසත්‍යය ලෙස සමහරු දැනගත් හ.

පල්ලියේ සංක්‍රිස්තියන්ගේ සහෝදරයා මෝසෙස් ගැන කවුදෝ කථා කළේ ඉන් අනතුරුවය. මෝසෙස් නත්තල් සීයාට ගැලපෙන යහපත් මිනිසෙකැයි බොහෝ දෙනා අදහස් දැක්වූහ. අන්තිමේ ඊළඟ නත්තල් සීයාට මෝසෙස් උන්දෑ සුදුසු යයි හැමෝම තීරණය කළහ.

මෝසෙස් උන්දෑ සාමකාමී මිනිසෙකි. අතපය පණ ඇති දා රපියෙල් උන්දෑ මෙන් ගමේ ඕනෑම කටයුත්තකට කාටත් ඕනෑවූ මිනිසෙකි. කුඹුරක, පාරක, වහලයක අතු සෙවිල්ලක, ගමේ පල්ලියේ, ඉස්කෝලේ ප්‍රජා ශාලාවේ, ශ්‍රමදානයක් ඕනෑම තැනක රපියෙල් මෙන් මෝසෙස් ද වැඩ කිරීමේ පෙරමුණ ගෙන සිටියේ ය.

මෝසෙස් උන්දෑ නත්තල් සීයාට තෝරා ගැනීමට තීරණය කළ බව ගමේ කොයි කා අතරේත් පැතිර ගියේය. කොයි හැටි කෙසේ වූවත් ගමේ ළමුන්ට මේ ආරංචිය සැනසුම් දෙන එකක් නොවීය. "අපිට අපේ නත්තල් සීයා රපියෙල් සීයා" ගමේ ළමුන් එක හඬින් කීහ. ඔවුහු පියතුමා හමුවී මේ අසාධාරණය උන්වහන්සේට සැළකර සිටියෝය.

"ළමයින්ගේ රපියෙල් සීයා ලෙඩින්නේ. ඒ විතරක් නෙවී ඇස් පේන්නෙත් නැතිලු. ඉතින් කොහොමද එයා නත්තල් සීයා කරන්නේ. ජේසු කරන දෙයක් අපි බාරගන්න ඕනෑ" පියතුමා කී විට ළමුන් සියල්ලෝ කම්පා වූහ. ළමෝ සියල්ලෝ රපියෙල් සීයා බැලීමට ගියහ. මේ වන විට සිදුවන්නට යන දේ රපියෙල් සීයාට ආරංචි වී තිබිණි. දරුවන් තමා සොයා ආ බව ඔවුන්ගේ කතා බහින් හා පෙනෙන නියාවෙන් මෙන් ඔහු හඳුනා ගත්තේ ය. රපියෙල් උන්දෑගේ දෙනෙත් තවත් කඳුලින් වෑහුනි.

ලණු වැල් ලා ඉවුනු හාන්සිපුටුවේ දිගාවී හුන් රපියෙල් සීයා ළමුන් දැක වාරු ගනිමින් මඳක් පුටුවේ ඉදිරියට ලිස්සමින් හිස කෙළින්කර ගත්තේ ය.

"අපි සීයා බලන්ට ආවේ, දැන් නත්තලුත් ළඟ නේ."

"පුතේ නත්තල් ළං වුණාට රපියෙල් සීයාට දැන් නත්තල් සීයාවෙන්න බැහැනෙ දරුවනේ රපියෙල් කතා කළේ වේදනාවෙන් ගොත ගසමිනි. ඔහුගේ දෑසින් ගලා ආ කඳුලු කුඩා දරුවන්ගේ දෙනෙත් ද තෙත් කළේ ය.

"දැන් සීයාට මොනවද වෙලා තියෙන්නේ අපිට කියන්නකෝ

"මගේ ඇඟේ වේදනාවයි හංදිපත් කැක්කුමයි. ඇස් දැලක් බැඳලා වගේ පේන්නෙ නෑ. ඡායාවක් වගේ දෑස නිසා පුළුවන් විදියකටවත් බෑ කකුල උස්සලා ඇවිදගන්න"

දරුවෝ ඒ වදන් අසා බොහෝ සේ කම්පා වූහ.

"අපි රපියෙල් සීයාව ඉස්පිරිතාලෙට පෙන්නමු"

"ඉතින් ඒවාට සල්ලි, ඔවුන් සියල්ලෝ සාකච්ඡා කළහ. අපි මෙහෙම කරමු. "අපි නත්තලට පුරවපු කැට කඩලා සීයාට වියදම් කරමු". සියල්ලෝ ඊට කැමැති වූහ.

පසුදින ඔවුන් රපියෙල් සීයා ඉස්පිරිතාලයට කැටුව ගියේ ය. දරුවන් අල්ලා ගෙන ගිය දරුවන්ට, සීයා දොස්තර මහතා ළඟට ගෙන යාමට පෝලිමෙන් කරදරයක් නුවූයේය.

කතා කළේ ක්‍රිෂාන්තිය. "අනේ ඩොක්ට අංකල්, මේ අපේ රපියෙල් සීයා අපේ නත්තල් සීයා. හැමදාම අපේ නත්තල් සීයා ඔත්පල වෙලා වාත අමාරුවලු. ඇස් පේන්නැතිලු නත්තලුත් ළඟයි අපිට සීයා සනීප කරල දෙන්න. අප්පච්චිලා වෙන නත්තල් සීයා කෙනෙක් ගන්න යනවා.

දරුවන්ගේ වේදනාත්මක ස්වරූපය වෛද්‍යවරයා හඳුනාගත්තේ ය. ඔහු දරුවන් දෙස බැලූයේ තම දරුවන් තමන් ගෙන් අවශ්‍යම දෙයක් ඉල්ලන්නා සේය. රෝගියා කරේ දමා තිබූ තුවායෙන් තම දෑසට ආ කඳුළු පිස දමනවා. ඔහු දුටුයේ ය. ඔහුගේ හදවත කම්පා විය. ඔහු සෑහෙන වෙලාවක් දරුවන් දෙස බලා සිටියේ ය. පරිස්සමින් රෝගියා පරීක්ෂා කළේ ය. ඔහුගේ ශරීරයේ අමාරුකම් බොහෝමයක්ම ද, ඇස් දුර්වලවීමට හේතු වද ඔහුට අවශ්‍යය පෝෂ්‍යදායී ආහාර නොලැබීමද හේතුවක් බව වෛද්‍යවරයා හඳුනා ගත්තේ ය. ඔහුට පෝෂ්‍ය ආහාර වේල් ලබා දිය යුතු බවත් ඇස් පරීක්ෂා කිරීම සඳහා අක්ෂි වෛද්‍යවරයකුට පෙන් විය යුතු බවත් තීරණය කළේ ය. දොස්තර මහතාම ලියලා ඔතා දුන් බෙහෙත් වලට අමතරව පාමසියෙන් ගත යුතු බෙහෙත් වට්ටෝරුවක් ද ලියා දුන්නේ ය. දරුවකු රෙදි උරයක බහලූ කැට සල්ලි වෛද්‍යවරයාට දිගු කළේ ය. "අනේ අපේ සීයා නත්තලට සනීප කරල දෙන්න පිං"

"ඔය සල්ලි ඔයාලා සීයට වියදම් කරන්න තියාගන්න. මේක රජයේ ඉස්පිරිතාලයක්. රජයෙන් නොමිලෙනෙ බේත් කරන්නෙ. අපි දොස්තරවෙලා තියෙන්නෙත් ඔයාලගේ සල්ලි වලින්නේ. අපි සීයව සනීප කරමු" වෛද්‍යවරයා දරුවකුගේ හිස අතගෑවේය. සීයාට දිය යුතු කෑම බීම මොනවාදැයි ඔවුහූ වෛද්‍යවරයාගෙන් අසා දැනගත් හ. එවෙලේ නගරයේ පෞද්ගලික රෝගීන් විනිශ්චය කරන රෝහලේ අක්ෂි වෛද්‍යවරයාට දෙන්න කියා ලිපියක්. වෛද්‍යවරයා රපියෙල් අත තැබුවේය. මේක රපියෙල් තියාගන්න. ඔහු තමාගේ පර්සය දිග හැර රුපියල් එක්දාහේ නෝට්ටුවක් රපියෙල් අත තැබුවේ ය.

ඔයාලගේ සීයාට මේ විටමින් දවසට කරල් දෙකක් එක බැගින් උදේ රෑයට කෑමට පසුව දෙන්න. ඔහු විටමින් පිරවූ කුඩා කුප්පියක් දරුවකු අත තැබීය. "මිනිසුන්ට මේ ළමයි වගේ වෙන්නට බැරි හැටි" වෛද්‍යවරයා මඳකට සිතුවේය.

උපදෙස් දුන් පරිදි ළමුන් සීයා හඳුන්වාදුන් දොස්තර මහතා වෙත කැඳවා ගියේ ය. ඉංගිරිසියෙන් ලියා තිබූ ලියුමේ කියා තිබුණේ "ළමුන්ගේ නත්තල් සීයාට උදව් කරන්න" කියාය. රපියෙල්ගේ රෝගි තත්ත්වය වෛද්‍යවරයාට කීවේ දරුවෝය. රපියෙල් සීයා වේදනාවෙන් හැඬුවා පමණි. ඒ වේදනාව තුළ දරුවන් ඔහුට දක්වන ආදරය කැටි වී තිබිණි. "සීයා බයවෙන්න එපා. සීයා තනිවෙලා නෑ. සීයට මේ දරුවො ගොඩක් ඉන්නේ. මේ දරුවො නිසා සීයට අපිත් ඉන්නවා." වෛද්‍යවරයා රපියෙල් සැනසුවේය. දැනුත් සීයා එනවට වැඩියෙ හොඳයි. සීයා සුවපත් කළ හැකි බව වෛද්‍යවරයා තේරුම් ගත්තේ ය.

වෛද්‍යවරයා රපියෙල් පරීක්ෂා කළේ ය. වෛද්‍යාගාරයේ තිබූ උපකරණ දැක දරුවෝ විශ්මිත වූහ. "මම ලොකුවෙලා දොස්තර කෙනෙක් වෙලා සීයට බේත් කරනවා" පිරිසේ උන් කුඩා දැරියක් කීවාය. වෛද්‍යවරයා සීනාසී දරුවාගේ මුහුණ බැලුවේය.

රපියෙල් පරීක්ෂා කළ වෛද්‍යවරයා කතා කළේය. "මේ ළමයින්ගෙ නැද්ද ලොකු කෙනෙක්."

"අපේ තාත්තා එක්කරගෙන එන්න පුලුවන් අංකල්" ඔහුගේ එක් ඇසකට මුලින් එක් කාචයක් දැමිය යුතු බව වෛද්‍යවරයා තීරණය කළේ ය. ඔහු දුරකථනයෙන් කීප වරක් කාට කාටදෝ කතා කළේ ය.

"මෙන්න මේ දුව තාත්තත් එක්ක සීයා එක්කරගෙන එන්න හත්වෙනිදා උදේ හතට මේ දරුවන් එන්න ඕනෑ නෑ මම තාත්තත් එක්ක සීයාව කාර් එකේ කොළඹ එක්කන් යන්නම්.

වෛද්‍යවරයා දරුවන් දෙස ආදරයෙන් බලා සිටියේය. සමහර විට දවස් දෙකක් විතර සීයාට කොළඹ නතර වෙන්නත් සිද්ධ වෙයි මේ සල්ලි වලින්. මේ කොලයේ ලියා තිබෙන බෙහෙත් අරගෙන යන්න. බේත් දෙන හැටි සීයාට කියා දෙයි. මුදල් තිබෙන බව දරුවන් පවසා සිටියත් ඔහු දරුවන් කීප දෙනෙකුගේ හිස් ආදරයෙන් අත ගෑවේය.

නියමිත දින දරුවාගේ පියා ද සමඟින් රපියෙල් වෛද්‍යවරයා හා කොළඹ ගියේ ය. ඔහු නැවත ගම ආවේ දින තුනකට පසුවය. ඒ වන විට ඔහුගේ එක ඇසක් පුළුන් වලින් වසා ප්ලාස්ටර් කර තිබිණි. දරුවාගේ පියා රපියෙල් තම නිවසට කැඳවා ගියේය. ඒ හොඳින් වෛද්‍යවරයා කී පරිදි සාත්තු සප්පායම් කරන්නටය.

දින කීපයකින් වෛද්‍යවරයා රපියෙල් පරීක්ෂා කිරීමට පැමිණියේ ය. "දැන් සීයාට සනීපයි. ඇඟත් සනීපයි" රපියෙල්ගේ ඇස වසා තිබූ පුලුන් ප්‍රවේශමෙන් ඉවත් කළ වෛද්‍යවරයා. ටික වේලාවක් බලා සිට දැන් මොකද වෙන්නෙ කියා රෝගියා වෙතින් තමා ඉවත් වී විමසුවේ ය. ඇස් පිල්ලම් ගසමින් ඒ තුළින් ආ ආලෝකය තුළින් රපියෙල් සීයා දුටුවේ තමා වටකරගෙන සිටින කුඩා දරුවන් ය. "දැන් මට පේනවා දොස්තර මහත්තයෝ ජේසු බබාලව"

වෛද්‍යවරයා තම දෑස් තෙත් කළ කඳුළු කුඩා දරුවන් වෙතින් සඟවා ගත්තේ ය. කුඩා දරුවන්ගේ මුහුණු සිනහවෙන් පිරී ගියේ ය. වෛද්‍යවරයා පල්ලියේ පියතුමාට ලියුමක් දුන්නේ ය. එහි ලියා තිබුණේ "දරුවන්ගේ නත්තල් සීයාට සනීපයි" යනුවෙනි.



**කේ. ජේ. හෙන්රි පෙරේරා**

# නූතන ලොවේ ඇරියුම

අද සමාජය තුළ ගැළවුම්කරුවාණන්ට නව උපතක් ලබා දීමට අපට අද ඇරැයුමක් හිමිව තිබේ. මෙම ඇරියුම යථාර්ථයක් බවට පත්කර ගන්නට අපට හැකියාවක් තිබෙනවාද? පසුගිය සෑම නත්තලකම පාහේ අපි දැඩිව අදිටන් කරගන්නවා ජේසු සමිඳුන්ට මගේ ජීවිතය තුළ උපදින්නට හදවතේ ඉඩක් ලබාදෙන්නට ලබා දීමට. නමුත් අද අපිට වැටහෙන දෙයක් වනුයේ මෙය යථාර්ථයක් බවට පත්වී නොමැති බවය. එසේ නම්, යමෙකුට අසන්නට පුළුවන් එසේ නොවීමට හේතුව කුමක් ද යනුවෙන්. මෙය ඉතා වැදගත් සහ කාලෝචිත ප්‍රශ්නයකි. එයට පිළිතුර නම් "මම" නමැති "පුද්ගලයාය". මම කැමතිද? සූදානම් ද සැබෑ වෙනසක් මගේ ජීවිතය තුළ ඇති කර ගැනීමට. ජේසු සමිඳුන් කේන්ද්‍ර කරගත් ජීවිතයක් ගත කරන්ට? සැබෑ වෙනසක් ඇතිකර ගන්නේ කෙසේද? කෙසේද අපගේ ජීවිත සූදානම් කරගන්නේ ජේසුතුමාව අප තුළට පිළිගන්නට ? එදා ස්නාවක ජුවාම් තුමා පාළුකරයේ මොරගසා කියූ ආකාරයේ සැබෑ වෙනසක් අප ජීවිත තුළ ද ඇතිවිය යුතුය. මෙම වෙනස අපගේ ජීවිත වලට විශාල අභියෝග යකි. මෙම අභියෝගය නියත වශයෙන්ම අපහසු කාර්යයකි. අද සමාජය තුළ ජීවත්වන ඔබටත්, මටත්. නමුත් මම, අපි සූදානම් ද සැබෑ වෙනසකට?

ජේසු සමිඳුන්ගේ උපතෙන් පසුව එළඹෙන සමය අද අපි හඳුන්වන්නේ ජනවන්දනාවට අනුව නත්තල් සමය යනුවෙනි. නමුත් ලූක් සුභාරංචියට අනුව කිතු උපතත් සමඟ ඇතිවූයේ බිළිඳුන් ඝාතනය කිරීමකි. අතිශය පීඩිත සමයකි. ඒවාගේම අද වර්තමාන ලෝකයේ අප ජීවත්වන සමාජයේ ජේසු උපත සමරනු ලබන්නේ යුරෝපයේ හිමෙන් වැසී ඇති පරිසරයකය. හිම මුවන් සහ කරත්ත, විවිධ වෙළෙඳ පුවරු අත ගත් නත්තල් පප්පලා, නත්තලට ආවේනික විවිධ සැරසිලි තම ව්‍යාපාරික ලාභ වැඩි කර ගැනීම සඳහා යොදා ගන්නා සමාජයකය. ජනවන්දනාවට අනුව ආගමන කාලය පටන් ගන්නටත් පෙර ව්‍යාපාරික ලෝකය සැලසුම් කරනවා, සූදානම්ව සිටිනවා මේ අවුරුද්දේ කෙසේ ද නත්තල ව්‍යාපාර ලාභ වැඩිකර ගැනීම සඳහා යොදා ගන්නේ කියලා. අපිට මොහොතකටවත් සිතෙනවද අපි ජීවත් වන්නේ නත්තල විකුණගෙන කන ලෝකයක කියලා, ඒකට අපිත් හවුල්කරුවන් කියලා, නොදැනුවත්ව හෝ දැනුවත්ව අප අවංකවම සහ ගැඹුරින් සිතා බැලුවහොත් අපිටත් වැටහෙන්නට ඉඩ තිබෙනවා බොහෝ දුරට අපිත් මෙම මායාවට හසුවී සිටින දේව ජනතාවක් බව.

ජේසු සමිඳුන්, සාමයේ කුමාරයාණෝ ඉපදුනේ ආසියාවේ. මට සිහියට නැගෙනවා පසුගිය වසර කීපය තුළ නත්තල් කාල වලදී අපගේ දෙව්සත්හලේ සහෝදරතුමන් විවිධ කාර්යයන් සඳහා විවිධ පළාත්වල මීසම්වල අවශ්‍යතාවයන්ට අනුව ඒ ඒ සේවාවන්ට යොමු කරනු ලැබුවා. මගේ ජීවිතයටත් ඒ සුන්දර අවස්ථාව ලැබුණා. මටත් පසුගිය වසර කිහිපය තුළ විවිධ ප්‍රදේශවල නත්තල් කාලය ගත කිරීමට හැකියාව ලැබුණා. සමහර අවුරුදුවල නාගරික මීසම් වලත් සමහර අවුරුදු වල ඉතා දුෂ්කර මීසම් වලත් සේවය කිරීමේ භාග්‍ය මට ලැබුණා. මට බොහෝ වෙලාවට දකින්නට ලැබුණු පොදු ලක්ෂණයක් වූයේ මේ ජන කොටස් දෙකම ඉතා උනන්දුවෙන් ආශාවෙන් හා උද්යෝගයෙන් නත්තල් උත්සවය සැමරීමට සැරසෙන බවය. නමුත් කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ ඔවුන් නත්තල සමරන ආකාරයය. එනම් එක් ස්ථානයක මහත් උත්සවශ්‍රීයෙන් සමරනු ලබන අතර තවත් ස්ථානයක ඉතා චාම් ලෙස සමරනු ලැබීම. දේව ජනතාව කිතු උපත විවිධාකාර මට්ටම් වලින් සමරනු ලබනවා. මෙහිදී මගේ සිතට නැගුණු ප්‍රශ්නයක් වූයේ දෙවියන් වහන්සේ ඉදිරියේ වඩාත් ප්‍රසන්න නත්තල් සැමරුම කුමක් ද? කෙසේ සිදුවිය යුතු ද යන්නයි?

අද දකින තවත් ප්‍රවණතාවයක් වනුයේ නත්තල් සමය තුළ අපගේ එදිනෙදා ජීවිත චර්යාවන්වල ඇතිවන තාවකාලික වෙනස්කම්ය. එනම් නත්තලට ඇඳුම් පැළඳුම් ගන්න ෂොපින් යනවා. නත්තලට විශේෂ කෑම බීම වර්ග සාදනවා. විවිධාකාරයේ නත්තල් උත්සව සංවිධානය කරනවා. විවිධාකාරයේ සැරසිලි සැලසුම් කරනවා. නත්තල් නිවාඩුව කෙසේ, කොහේ ගත කළ යුතු දැයි සැලසුම් කරනවා. මේ ආකාරයට විවිධ වූ දේවල් අප දැනුවත්ව හා නොදැනුවත්ව අපගේ ජීවිතවල සිදුවෙද්දි අපිට අපගේ මේ ප්‍රශ්න අසා පිළිතුර සොයා ගැනීම ඉතා වැදගත් ය.

එනම් ජේසු ඉපදුනේ ඇයි? ඇත්තටම ජේසු සමිඳුන්ගේ උපත නිසා අපි සතුටු විය යුතුමය. විනෝද විය යුතුමය. මන්ද අපට ගැලවුම්කරුවෙක් උපන් නිසා. නමුත් මේ නත්තල අපිට ඊට වඩා වැඩි දෙයක් අදහස් කරනවාද? පවසනවාද? එසේ නම් ඒ මොකක්ද? උන්වහන්සේ මනුෂ්‍යයකු ලෙස මිනිසත් බව අරගෙන අපිට පෙන්නුම් කෙරුවේ දේව දරුවකු ලෙස අපි ජීවත් විය යුත්තේ කෙසේද යන්නයි. මාංශගත වීම යනුවෙන් අදහස් කරන්නේ සමාජය තුළ සංස්කෘතිය තුළ සැබෑ කිතුනුවන් ලෙස ජීවත් විය යුත්තේ කෙසේද යන්නයි. උන්වහන්සේ මේ ලෝකයට ගෙනා ආදරය, කරුණාව, අනුකම්පාව, දයාව, සාමය, සමඟිය අප තුළින් අනිත් පුද්ගලයන් වෙත ගලා යන්නේ නැතිනම් අපගේ ජීවිත වලින් අප වපුරන්නේ අසමගිය, වෛරය, ඊර්ෂ්‍යාව වැනි දේවල්ය. මේවා සැම කිතු උපත විකෘති කරයි.

**ගරු ශිහාන් ශානක නි.ම.නි. සහෝදරතුමා**

# තිර ඇදහිල්ලෙන් පිරීයේවා !

වසර ගණනකට පෙර අතීතයේ සිදුවූ එක්තරා උපතක් වුවත් එය අතීත සැමරුමක් පමණක්ම නොවේ. ඒ මාංශගත වීමේ උතුම් සිද්ධියයි. අප සැමගේ ජීවිත හා බැඳී පවතී. එය අපගේ තිර ඇදහිල්ල ශක්තිමත් කර ගැනීමට බොහෝ සෙයින් උපකාරී වේ.

ශු. බයිබලයට අනුව මරියතුමිය හා ජුසේ තුමා දේව අණට මුළුමනින්ම හිස නැමූ ඉතාමත් ධාර්මික හා තිර ඇදහිල්ලෙන් ජීවත් වූ අය වූහ.

නත්තල කිතුනු අපට ඓතිහාසික උපතක් මතක් කර ගැනීමක් හා ඒ වෙනුවෙන් උත්සව පැවැත්වීම හා විනෝද වීම පමණක් නොවිය යුතුය.

එසේ නම් අප කුමක් කළ යුතුද? මේ වසර අපට ඉතා වැදගත් වසරකි. මන්ද වන්දනා ගමනක නිරත වන අපට මේ වසර අපගේ විශ්වාසය වඩා ශක්තිමත් කරගැනීම සඳහා කැප කර තිබීම අපගේ ප්‍රීතිය දෙගුණ තෙගුණ කරයි. අප සමිඳාණෝ මරණය පරදා උත්ථාන නොවූයේ නම් අපට එතුමාණන්ගේ උපතක් ගැන කතා කරන්නට හැකියාවක් නොමැත.

අප එකිනෙකා සතුව ඇති විශ්වාසය විවිධ මට්ටමින් යුක්ත වන්නට පුළුවන. ඒ කෙසේ වෙතත් අප සැම දෙනා කිතු සමිඳුන් තුළ එකම දේව ජනතාවකි. එසේ නම් මෙවර උදාවන නත්තලේ දී ඔබට මට කරන්නට යමක් ඇත. එනම් මා තුළ ඇති විශ්වාසය වර්ධනය කරගැනීමට උත්සාහ කිරීම මෙන්ම මගේ සහෝදරයාගේ විශ්වාසය ශක්තිමත් කර ගැනීමට ඔහු හෝ ඇය වෙනුවෙන් යාච්ඤා කිරීමය.

**ගරු ප්‍රසන්න දිල්රුක් ප්‍රනාන්දු සහෝදරතුමා**
හතරවන වසර - අම්පිටිය ජාතික දෙව්සත්හල

දැල්වෙන පහන්

# බෙත්ලෙහෙමේ යසෝ ගී රාවය

අන්ධකාරයෙහි ඇවිද්දාවූ සෙනග මහත් ආලෝකයක් දුටුවෝය. ගනඳුරු දේශයෙහි විසූ අය කෙරෙහි එළියක් දැන් බැබලෙන්නේය........ (ඉසයියස් 9:2)

විවිධ විෂමාචාරයන්ටද, වෛරය, ක්‍රෝධය අසාධාරණත්වයට, පීඩනයට ලක් වූ ජනතාව වෙත සදා විමුක්තියේ ආලෝකයත්, සහජීවනයත්, සාමයත් උදා කළ කිතු උපත, එනම් ලෝක ඉතිහාසයෙහි ඉතා සැළකිය යුතු මෙම සුරදූත කතාවට බෙත්ලෙහෙම නින්දෙන් වැසී ගිය නිසල රාත්‍රිය සාක්ෂි දරන ලදී. අයුක්තිය, අසාධාරණය රජයන ලොවක් තුළ මිනිස් සිත් සතන් සුවපත් කරන්නට මෙලොවට වැඩම කළ ශ්‍රී වචනයාණෝ අමිල දහමක් රැගෙන මෙලොවට අවතීරණ වූ බවක් කිසිවකු නොදැන සිටියේය.

සමිඳුන් නියම කළ මොහොත එළඹිණ. දෙවියන් වහන්සේ තම දාසයන් සෝදිසි කර අතිශයින් සතුටු වී ඔවුන්ගේ කනස්සළුව කෙළවර කළ සේක. තමන් නිශ්චය කළ තීරණය ඉෂ්ට කිරීමට නියම කරගත් පෙර දින රාත්‍රියේම සිහිනයකින් දේව දූතයෙක් ජුසේ නමැති ධාර්මික මනුපුතුහට දර්ශනය විය. “දාවිත්ගේ පුත් ජෝසෙප්, ඔබේ බිරිඳ වන මරියා පාවාගන්නට බිය නොවන්න.... මන්ද ඇ ගැබ් ගෙන ඇත්තේ ශුද්ධාත්මයාණන් අනුහසිනි. ඇ පුතකු බිහි කරන්නීය. උන්වහන්සේට ජේසුස් යන නාමය තැබිය යුතුය. මන්ද සිය සෙනග පාපවලින් මුදාලන්නේ එතුමාණෝයයි කීය.” මෙසේ අඳුරේ සිටි ජනතාවට සැබෑ ප්‍රීතිය, සාමය අයිති කර දෙමින් ආලෝකයේ පහන් දල්වන්නට ප්‍රේමයේ රජාණන්ගේ මාංශගතවීම මෙලෙස සිදු වූ වගයි.

මේ කාලයේදී බෙත්ලෙහෙමේ සිට දවස් හතරක පමණ ගමනක දුරින් පිහිටි නාසරෙත්හි ජුසේ තුමා හා මරියතුමී වාසය කළෝය. සීත සෘතුව පටන් ගත්තේය. මේ කාලයේදී එවකට බලසම්පන්නව සිටි රෝම අධිරාජයා තම අධිරාජ්‍යයෙහි සම්පූර්ණ ජන ලේඛනයක් ගැනීමට නියමිතව තිබිණි. එක රටක් හා තව රටක් අතර යාම ඊම මේ කාලයෙහි දුෂ්කරව තිබිණ. මෙම වැඩට කොමසාරිස්වරු පත් කර රෝමානු පළාත්වලින් පටන්ගෙන පළාත් කරා පැමිණ එක එක ජාතීන්ගේ ජනලේඛන සම්පූර්ණ කිරීමට අවුරුදු ගණනක් ගතවන්ට ඇත.

ජේසුස් වහන්සේ උපදින අවුරුද්දේම ජුදයාවේ වාරය හරියටම පැමිණීමද සිදුවිය. මරියතුමිය ඇගේ දෙවික දරුවාගේ ඉපදීම බලාපොරොත්තුවන සමයේදී රාජ නියෝගය ප්‍රකාශ කරන ලදහ. මෙම නියෝගය පරිදි සියළු ජනයෝ තමන් ජම්ම භූමියට යා යුතුය. එහිදී තම නමද, ආදායම් මාර්ගද, සන්තක දේපොළ විස්තරද ලියා පදිංචි කිරිමට නියම වූයේය. ජුසේතුමා හා මරියතුමියද මෙම රාජ ආඥාවට යටත්ය. එබැවින් මරියතුමියද කිසිදු තැතිගැන්මක් නොමැතිව ගමන සඳහා පිටත්වූවාය. එහෙත් දේව අභිප්‍රායේ මෙහි අදහස නම් දිවස් වාක්‍ය අනුව ජේසුස් වහන්සේ ජුදයාවේ බෙත්ලෙහෙමේ ඉපදීමය. ඇත්තෙන්ම මෙම ගමන දුර බැහැර බැවින්ද මරියතුමී එකල සිටි තත්ත්වය නිසාද ජෙරුසලෙමෙ සහ බෙත්ලෙහෙම මුහුදු මට්ටමෙන් අඩි 2500 ක් උස බැවින්ද, ශීත සෘතුව බැවින්ද මේ ගමන බොහෝ කරදර සහිතය. ජනලේඛනය සඳහා ගියවුන්ගෙන් තානායම් පිරී තිබිණ. කාන් නැමැති ජෙරුසලමේ මහා තානායම මෙහි පැමිණි විශාල ජනයාගෙන් පිරී ඉතිරී ගොස් තිබිණ. ජුසේ තුමා හා මරියතුමි සවස් භාගයෙහි මෙහි ළඟාවූ විට එහි කොහෙත්ම ඉඩක් නොතිබුනේය.

වෙනත් තානායම් එම නුවර නොතිබෙන්නට ඇත. නැවතුම් ඉල්ලීමෙන් පලක් නොවු ජුසේ තුමා හා මරියතුමිය මෙම අසරණ අවස්ථාව කිසි මැසිවිල්ලක් නැතිව පිළිගත්තේය. තදබල කුණාටු පවතින විට සතුන් ආරක්ෂාවේ ගාල්කර ගැනීමට පාවිච්චි කළ ගැඹුරු ගුහාවක් එහි තිබෙන බවක් ජුසේ තුමා කෙසේ හෝ දැන ගන්නට ඇත. කෙසේ වෙතත් දෙවියන් වහන්සේට ස්තුති කියමින් ඔව්හු ඊට ඇතුල්වුවෝය. එය සීතලවද, අඳුරුවද තිබුණි. සියල්ල දේව කැමැත්තට භාරකොට රාත්‍රිය ගත කිරීමට එහි වාඩි ගත්තෝය.

“ශුද්ධාත්මයාණන් විසින් ගැබ් බැස කන්‍යමරියතුමන්ගෙන් උපන්සේක..... වචන තුමාණෝ මාංසවු සේක. අප සමග වාසය කළ සේක.....”

සීතල බිම වැතිරී සිටින ළදරුවා දෙස මරියතුමිය නෙත් යොමයි. නාසරත්හි නම් කුඩා කාමරයක්ද, තොටිල්ලක්ද, කුඩා ලිපක්ද, අඩු තරමින් කුඩා එළියක්වත් ඇතිවිය හැකි නමුත් මෙම ගුහාව තුළ අන්ධකාරය හා තමන් අවට හිස් වූ බවද මරියතුමියට දැනුනේය. ළදරුවා තැබීමට ස්ථානයක් එහි



නොතිබුනේය. ගුහාවේ ඔබ මොබ පරීක්ෂා කළ ජුසේ තුමාට අඩි ස්වල්පයක් පිටුපස මාර්ගයක් සම්බ වී පහතට බැස්ස විට ගලෙහි හාරන ලද කුඩා වලක්ද එහි සතුන්ට කෑම කෑමට හැකිවෙන තරමට උඩින් තැබූ කුඩා ඔරුවක්ද දුටුවේය. මරිය තුමිය මෙම ඔරුවෙහි රෙදි අතුරා කොට්ටයක් මෙසේ සාදා ළදරුවා එම ඔරුවෙහි තැබුවාය. මාංසගත වචන තුමාණන්ගේ පළමුවන වාසය මෙයාකාර විය.

මේ නිසල රාත්‍රියේ වෙනත් සිද්ධියක් ඇති විය. එඬේර ස්වල්ප දෙනෙක් ඔවුන්ගේ සතුන් රැකවල් කරමින් සිටියෝය. හදිස්සියෙන්ම ආලෝකයක් පැතිරෙයි. ඉන්පසු ගී ශබ්දයක්ද ඇසෙයි. එඬේරුන් නිදා සිටි කුඹුරට ඉහළින් දිලිසෙන ඡායාවන් දර්ශණය වෙයි. නොබා ඉඳිව් සුරදූතයකුගේ ශබ්දය ඇසෙයි. සියළු මනුෂ්‍යයන් සඳහා ප්‍රීතියේ ශුභාරංචිය මම තොපට ගෙනෙමි. නුඹලාගේ ගැලවුම්කාරයාවු ස්වාමි වූ ක්‍රිස්තුස්වහන්සේ දාවිත්ගේ නුවරෙහි අද දින උපන්සේක. මෙය නුඹලාට සළකුණක් වන්නේය. රෙදිවලින් ඔතා ගව ඔරුවක බාවා සිටින ළදරුවෙක් නුඹලාට සම්බවෙයි. එඬේරුන්ගේ අනුමාන කල්පනා වලට පිළිතුරක් වශයෙන් මොක්ෂ සේනාවන්ගේ ගීත නාදයක් පැතිරෙන්නට විය.’ “අති උසස් තැන්හි දෙවිඳුට මහිමයද මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය” ද වේවායි ගැයුහ. දේව දූතයන් ඔවුන් කෙරෙන් නික්ම ගිය පසු එඬේරු ‘අපි වහාම බෙත්ලෙහෙමට ගොස් ස්වාමින් වහන්සේ අපට දන්වා වදාළ මේ සිද්ධිය බලමු’ යි ඔවුනොවුන් අතර කතා කර ගත්හ. ඔව්හු යුහුව ගොස් ඔරුවේ බාවන ලද ළදරවාද සමග මරියතුමිය හා ජුසේ තුමාද සම්බ විය.

“අපට ළදරුවෙක් උපන්නේය. අපට පුත්‍රයෙක් දෙන ලද්දේය. එතුමාණෝ අපේ රජු වන සේක. සාමයේ කුමාරයාණෝයි කියනු ලබන සේක” (යෙසායා 9:6) යෙසායා දිවැසිවරයා විසින් පවසන ලද තවත් අනාවැකියක් ඉෂ්ට විය.

ජුසේ තුමා ප්‍රසිද්ධ නාම ලේඛණයෙහි තමන්ගේ නමද, අලුත ඉපදුන දරුවාගේ නමද ඇතුළත් කළේය. එවිට ඔගස්ටස්ටද තවත් වැසියෙක් වැඩිවිය. එහෙත් මෙම අලුත් වැසියානම් ලොවම මුදාලන මුළු ලොවට අග්‍ර වූ කිතු සමිඳාණෝය. දින අටක් පසු වූ විට මෙම දරුවා චර්මඡේදනය කොට සුරදූතයා දැන් වූ පරිදි ‘ජේසුස්’ යයි නාමය දෙන ලදහ.

‘එතුමන්ගේ රාජ බලය වැඩි වර්ධනය වන්නේය. එම රාජ්‍යයෙහි සාමයට කෙළවරක් නොවන්නේය. එතුමාණෝ යුක්තියෙන්ද ධර්මිෂ්ඨකමින්ද රජකම් කරන සේක. සර්ව බලැති සමිඳුන්ගේ උදයෝගයෙන් මෙය අධිෂ්ඨාන කළ සේක.’ (යෙසායා 9:7)

**අයිරින් පෙරේරා**
තුඩැල්ල

# එදා සමාජගතවූ නත්තල අද.....

කිතු සමිඳුන්ගේ උපත සමරණ මංගල උත්සවය නත්තලයි. ලොව පුරා නත්තල නොහොත් කිතු උපත දෙසැම්බර් 25 දා පවත්වනු ලැබුවත්, උන්වහන්සේගේ උපත එදින සිදු වී ඇති බව කිසිදු ග්‍රන්ථයක සඳහන් වී නැත. උන්වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය හා ඉගැන්වීම් ප්‍රස්තුත කර ලියා ඇති සුවිශේෂ ග්‍රන්ථයන්වල පවා උපන් දිනය සඳහන් කර නැත. එසේ වන්නට ඇත්තේ එම කතුවරුන්ගේ අදහස, කිතු සමිඳුන්ගේ ගමන් මඟ හා ඉගැන්වීම් සමාජයට හඳුන්වා දීම විය හැක. ඒ නිසා එම කාර්ය සඳහා උපන් දිනය එතරම් වැදගත් නොවනු ඇතැයි ඔවුන් සළකන්නට ඇතැයි සිතිය හැක.

කිතු සමිඳුන් උපත ලබන්නටත් පෙර සිට රෝමවරු දෙසැම්බර් 25 දා හිරු මංගල්‍යය නමින් උත්සවයක් පැවැත්වූහ. කල්යත්ම මෙම හිරු මංගල්ලය, අප්‍රසන්න, අසංවර, මධුපානීය, කාමෝත්සවයක් විය. ක්‍රි.ව. තුන්සිය පනහ පමණ වන විට රෝමය කරා කිතු දහම ළඟා වෙමින් තිබුණි. රෝම වැසියන් මෙන්ම පාලකයින් ද කිතු දහම වැළඳ ගන්නට විය. කිතු දහම වැළඳ ගත් රෝම පාලකයන්ට මෙම හිරු උත්සවය මුළුමනින්ම නුරුස්සන දෙයක් විය. මේ ගැන දැඩි සේ කළ කිරීමට පත් මහා කොන්ස්ටන්ටයින් අධිරාජයා, සියලුම රෝමවරුන් කිතු දහම වැළඳ ගත යුතු බවත් හිරු මංගල්ලය පවත්වන දෙසැම්බර් 25 වැනිදා නත්තල නොහොත් කිතු උපත උත්සවශ්‍රීයෙන් පවත්වන ලෙසත්, මෙහිදි ආගමික වතාවත් ප්‍රධාන විය යුතු බවත් ප්‍රකාශයට පත්කරන ලදි. මේ අනුව ලොව ප්‍රථම නත්තල් උත්සවය රෝමයට පමණක් සීමාවිය. මේ අතර ක්‍රි.ව. 354 දී රෝම රදගුරු හිමියන් දෙසැම්බර් 25 දා කිතු හිමි උපත සමරණ නත්තල් මංගල්ලය ප්‍රකාශයට පත් කිරීමත් සමගම සමස්ත ලෝක කිතුනු සමාජය මහත් හරසරින් නත්තල සැමරීමට පටන් ගත්තෝය.

මේ නිසා රෝම හිරු මංගල්ලය මුළුමනින්ම ආගමික ස්වරූපයක් ගන්නට විය. ඒ ඒ දේශයන් තමන්ගේ සංස්කෘතික ගති පැවතුම් එක්කර නත්තල ඉතා ඉහළින් පවත්වන්නට විය. මැදියම් රාත්‍රි දිව්‍ය පූජා මෙහෙයෙන් ආරම්භ වු නත්තල් උත්සවය, අනතුරුව බාහිර අලංකාරයෙන් පිරිපුන් විය. ලෝකයේ අනිකුත් රටවලට නත්තල් උත්සවය පිවිසීමත් සමගම ඒ ඒ රටවල් තමන්ට ආවේනික සංස්කෘතීන්



සමගින් නත්තල් උත්සවය පවත්වන්නට විය. එලෙසම නත්තලේ යථාර්ථය සමාජගත කරන්නට විවිධ බාහිර අංග එක්විය.

මධ්‍යතන යුගයේදී අසීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස් තුමා ගවලෙන හඳුන්වාදීමත් සමගම නිවෙස්වල මෙන්ම දෙව්මැඳුරුවල ගවලෙන් ඉදිකරන්නට විය. මේ හරහා නිර්මාණශීලිත්වය මෙන්ම එකමුතු බව නත්තල් සමයේ සමාජය තුළ ගොඩනැගුණි. නත්තල් දින රාත්‍රියේ රහසේ දුප්පත් දරුවන්ට තෑගි ලබාදී ඔවුන් තුළ නත්තල් ප්‍රීතිය ඇතිකරමින් ශුද්ධවූ නිකුලා මුනිතුමා නත්තල් සීයා හඳුන්වා දුන්නේය. ශුද්ධවූ නිකුලා මුනිතුමා එක්කළ මෙම නත්තල් සීයා නිසා දරුවන් පමණක් නොව අපේ වැඩිහිටියන්ද අමන්දානන්දයට පත්විය. 19 වන සියවසේදී එංගලන්තයෙන් පත් ආරම්භ වූ නත්තල් සුබ පැතුම් යැවීම වේගයෙන් ලෝ පුරා පැතිරෙන්නට විය. මේ නත්තල් සුබ පැතුම් දුරස්ථ නෑදෑ සහෝදර හිතවතුන් අතර සුහදත්වයක් ඇතිවීමට කදිම මාවතක් විය. මේ සමගම නත්තලත් සමගම නත්තල් කැරොල් හා නාට්‍ය එක්වීමෙන් නත්තල ආගමික මෙන්ම සංස්කෘතික උත්සවයක්ද විය. මේ හරහා නත්තල සියලුම ජන කොටස් එකට එක්කරන යාන්ත්‍රනයක් බඳුවිය.

මෙලෙස මානව සංහතියේ ඉදිරි ගමනට සුවිසල් මෙහෙවරක් ඉටුකළ උත්තරීතර නත්තල් ගුණාංග කාලයත් සමගම වානිජකරණය හා බද්ධ වීම නිසා යළිත් පැරණි රෝම හිරු මංගල්ලය කරා පිය නගමින් තිබෙන බවක් පෙනේ. නත්තල ඇතිවූයේ කිතු උපත නිසා බව අමුතුවෙන් කිව යුතු නැත. ඒනිසා කිතු උපත ප්‍රමුඛ විය යුතුය. ඒ අනුව ඒ සඳහා ආගමික වත් පිළිවෙත් ප්‍රධානතම ගුණාංග යයි. ඒ දෙව්මැඳුරුවල පවත්වන මැදියම් රාත්‍රි දිව්‍ය පූජාවයි. අද නත්තල් දිව්‍ය පූජාව විලාසිතා ප්‍රදර්ශනයක් වි ඇත. ප්‍රීතිමත් උත්සව අවස්ථාවක නව විලාසිතාවන්ගෙන් හැඩ වැඩ වීම මරණීය පාපයක් නොවේ. වරද දෙව් මැඳුර විලාසිතා මන්දිරයක් කිරීමයි. ඊටත් වඩා අඩ නිරුවත් ඇඳුමින් සැරසී දේවස්ථානයට පිවිසීම වරදක් වූවත් එය ඊටත් වඩා අශෝභන බව සඳහන් කළ යුතුය.

එදා දෙව් මැඳුරු අබියස මෙන්ම ගම පුරා පැවැති කැරොල් ගායනා අද තරු පහේ සුපරි හෝටල් වලය. දුගී දුප්පත් දරුවන් සොයා ආ නත්තල් සීයාද හෝටල්කරුවෝ තම ග්‍රහණයට ගෙන හමාරය. නත්තල් සීයාගේ තෑගි අද නැති බැරි දරුවන්ට අහිමිය. ඒවා ඇති හැකි දරුවන්ටය. ඒ මදිවාට ව්‍යාපාරිකයෝ නත්තල් සීයා තමන්ගේ තැරැව්කරුවකු බවට පත් කරගෙන ඇත. නත්තල් නාට්‍යයන්ට වඩා අද සමාජගතව ඇත්තේ මඳ අඳුරේ, අඩ නිරුවතින් දඟලන නාඩගම්ය. අද ඇත්තේ නත්තල් සුබ පැතුම් නොව විසිතුරු පත්ය.

මේ අනුව නූතන නත්තල, පැරණි රෝම හිරු මංගල්ලය කරා සමීප වෙමින් පවතින බව පෙනේ. මෙය ගිහි පැවිදි දෙපාර්ශවයම වටහා ගත යුතුය. එය එක් කොටසකට වරද පැවරිය නොහැක. නත්තල පාරිභෝගිකරණයට අසුවීමට ඉඩ නොදිය යුතුය. මෙහි ප්‍රතිඵලය වඩාත් බලපාන්නේ ගිහියන්ට නිසා ගිහි අවධානය වඩාත් අත්‍යවශ්‍ය වේ. එසේවුව හොත් නත්තල නත්තලක් වනු නොඅනුමානය.

**වෝල්ටර් රත්නායක**
වැලිගම්පිටිය

## ගවහලක උපන් ... 1 පිටුවෙන්

බෞද්ධ ආගමික දරුවන්, කතෝලික ආගමික දරුවන් සමඟ එකතු වී ගවලෙන හදනවා. නත්තල් ගස් සරසනවා. කෝ ආගමික භේදයක්? ලෝකයේ කිසිම රාජ්‍ය පාලකයෙක් එක් ආගමකට සීමාවීම නොකළ යුතුයි. අප මානසික පීඩාවකට පත්වී සිටින විට ආගමික සුවය අවැසි වෙනවා. මිනිසා තුළ ශික්ෂණය ඇති වන්නේ ආගම නිසයි. අප සියලු ආගම්වලට ගරු කළ යුතුයි. ගවහලක උපන් ක්‍රිස්තුන් වහන්සේ ලෝක සාමයේ දූතයා වීම අප ලද භාග්‍යයක්" යැයි ප්‍රකාශ කළහ.

ගාල්ල පදවි කරිටාස් සෙඩ්ගෝල් ආයතනයේ පැවති මෙම සුහද හමුවේ පිළිගැනීමේ කථාව ගාලු පදවි අනුනායක අතිගරු නිහාල් නානායක්කාර මාහිමිපාණන් සිදුකළ අතර ගාලු පදවි අපෝස්තලික සේවා පිළිබඳ නාහිමි අතිගරු චාල්ස් හේවාවසම්, පදවි රදගුරු ලේකම් ගරු හැරල්ඩ් මෙරිල් ලියෝ පීරිස් පියතුමන් ඇතුළු පදවි පූජක සංඝය ද කනම්පිටිය භාවනා මධ්‍යස්ථානයේ අධිකරණ සංඝ නායක පූජ්‍ය කැගල්ලේ ප්‍රඥාරාම ගාලු පළාතේ පුඥසාර විහාරයේ හිටපු පරිවේණාධිපති ප්‍රධාන සංඝනායක අති පූජ්‍ය බද්දේගම දේව රක්ඛිත හිමිපාණන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නය ද, දෙවට මුස්ලිම් දේවස්ථානයේ ප්‍රධාන පූජක අතිගරු මෞලවි අවුන් පූජක තුමා ඇතුළු මුස්ලිම් ආගමික පූජක තුමන් ද ගාල්ල කළුවැල්ලේ සිව කෝවිල හා ගාල්ල කතරගම කෝවිල භාර අතිගරු කුරුක්කල් තුමන් ද සහභාගි වූහ.

සුහද හමුව අවසානයේ මහා සංඝරත්නයට දානය සහ භෝජන සංග්‍රහයක් ද පිළිගැන්විය.

## බිළිඳෙක්, ... 8 පිටුවෙන්

නමුත් ඔවුන් පැමිණියේ එක අරමුණක් සඳහා ය. එනම් ක්‍රිස්තුන් වහන්සේව සොයා ගැනීමට ය. තමන් ගේ දුර බැහැර සිට පැමිණි චාරිකාවේ එකම පරමාර්ථය වූයේ එයයි; "තාරකාව දැක ඔව්හු අතිශයින් ප්‍රීති ප්‍රමෝද වූහ. ඔවුහු ගෙට පිවිස, ළදරුවා සිය මව වූ මරිය තුමිය හා සමඟ සිටිනු දැක, පසඟ පිහිටුවා වැඳ, සිය කරඬු ඇර රන් ද, තුවරලා ද. ගන්ධ රසද යන පඬුරු උන්වහන්සේට පිදූහ." (මතෙව් 2:10-11).

**04. රජතුන් කට්ටුව යන සංකල්පය**

"මගොයි" යන පර්සියාන වචනයේ තේරුම ශාස්ත්‍රවන්තයන් හෝ ප්‍රඥාවන්තයන් නම් "රජතුන් කට්ටුව" යන ඉතා ජනප්‍රිය සංකල්පය භාවිතයට පැමිණියේ කෙසේද? ඊට ප්‍රධාන හේතුව, මතෙව් තුමා සඳහන් කරන පෙරදිගින් ජෙරුසලමට පැමිණි ශාස්ත්‍රවන්තයින්ව ගීතාවලියේ සහ යෙසායා දිවැසිවරයාගේ පොතේ එන සමහර පාඨයන් වල ආභාෂයෙන් අර්ථකථනය කිරීමයි.

එවැනි බයිබලීය පාඨයන් කිහිපයක් දැන් අපි සලකා බලමු. "තාර්ෂිස්හි සහ ද්වීපවල රජවරු එතුමාට කප්පම් ගෙවන්නෝ ය. ෂෙබා සහ සේබාහි රජවරු පඬුරු පුදන්නෝ ය. එතුමන් අබිමුව රජවරු වැඳ වැටෙන්නෝ ය. සියලු ජාතිහු එතුමාට මෙහෙ කරන්නෝය" (ගීතාවලිය 72:10-11). "ඉශ්රායෙල්වරුන්ගේ මිදුම්කාරයා ද ඔවුන් ගේ සුවිශුද්ධ තැනැන් වහන්සේ ද වන සමිඳාණෝ මිනිසුන් විසින් සුළු කරනු ලැබූ, ජාතින් විසින් පිළිකුල් කරනු ලැබූ, ආණ්ඩුකාරයන්ගේ සේවකයකු වූ තැනැත්තාට මෙසේ වදාළ සේක. "ඉශ්රායෙල්වරුන්ගේ සුවිශුද්ධ දෙවි සමිඳාණන් සිය සේවකයා වන නුඹ තෝරාගත් බව දකින රජවරුන් නුඹ ගරු කරන්න නැඟිටිනු ඇත; අධිපතින් නුඹට නමදිනු ඇත." (යෙසායා 49:7). "සමිඳාණෝ ජෙරුසලමට මෙසේ වදාරන සේක: "විදේශිහු නුඹේ පවුරු ගොඩනඟන්නෝ ය. ඔවුන්ගේ රජවරු ද නුඹට සේවය කරන්නෝ ය." (යෙසායා 60:10)."ජෙරුසලමෙහි ඇති ඔබේ මන්දිරය නමින් රජවරු පඬුරු ගෙනවුත් ඔබට පුදන්නෝ ය" (ගීතාවලිය 68:29)

ක්‍රි.ව. දෙවන ශත වර්ෂයේ අවසානය වන විට ටර්ටූලියන් තුමා (160 - 220) මෙසේ වාර්තා කොට ඇත. "පෙරදිග රටවල් ශාස්ත්‍රවන්තයන්ව සම්පූර්ණයෙන්ම වාගේ රජවරුන් ලෙස සලකනු ලබයි."

මෙසේ පැමිණි ශාස්ත්‍රවන්තයන්ගේ හෝ "රජවරුන්ගේ" ගණන තුන් දෙනෙක් ලෙස ජනප්‍රිය වීමට හේතුව වූයේ ඔවුන් විසින් රැගෙන ආ තිළිණයන් වල සංඛ්‍යාවයි; එම තිළිණයන් තුන නම් රත්තරන් තුවරලා සහ ගන්ධරසයි. ඒ අනුව ඔවුන් තුන් දෙනෙක් පැමිණෙන්නට ඇතැයි යන මතය ප්‍රචලිත විය. නමුත් ශුද්ධවර මතෙව් තුමාගේ සුවිශේෂය එසේ පැමිණි ශාස්ත්‍රවන්තයන්ගේ නිශ්චිත සංඛ්‍යාව සඳහන් කරන්නේ නැත.

ඔවුන් ගෙනා තිළිණයන් වන රන්, තුවරලා සහ ගන්ධරස යන වර්ග තුනට පරණ ගිවිසුමේ සමහර බයිබලීය පාඨයන් වල ආභාෂය බල පා ඇති බව පෙනේ. අප එයින් එක බයිබලීය පාඨයක් සලකා බලමු; "ඔටුවන් සමූහයකින් යුත් තවලම් මිදියන් හා ඒපා දේශ වලින් නුඹ වෙත රොක් වෙයි. ඔවුන් ෂෙබා දේශයෙන් රන් ද සුවඳ ද්‍රව්‍යය ද රැගෙන අවුත්, සමිඳුන්ගේ ප්‍රශංසාව ප්‍රකාශ කරනු ඇත." (යෙසායා 60:6).

පසුකාලීන සම්ප්‍රදායයකට අනුව රත්තරන් වලින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ රාජකීයත්වයත්, සුවඳලාටු (තුවරලා) වලින් උන්වහන්සේගේ දේවත්වයත්, ගන්ධ රස වලින් උන්වහන්සේගේ ගැලවීමදායක දුක්විඳීමත්, යාච්ඤාමය ජීවිතයත්, සද්ගුණයත් සංකේතවත් වන බවට විශ්වාස කෙරුණි. එමෙන්ම රත්තරන්, සුවඳලාටු යනාදිය රජකුට ("ජුදෙව්වරුන්ට රජ ව උපන් උතුමාණෝ") ඉතා සුදුසු තිළිණයන් වේ.

මෙම ශාස්ත්‍රවන්තයන්ගේ පැමිණීමත් සමඟ දෙවියන් වහන්සේ විසින් තෝරා ගන්නා ලද ජුදෙව්වරුන්ගේ රජතුමාත් (ජේසුස් වහන්සේ) රෝම අධිරාජ්‍යය විසින් තෝරා ගන්නා ලද ජුදෙව්වරුන්ගේ රජතුමාත් (හෙරෝද්) අතර ගැටුම ඉතා කැපී පෙනෙන ලෙස මතෙව් තුමා නිරූපණය කර ඇත. සැබෑ දේව නියෝජිතයන්ට දේශපාලන නියෝජිතයන් සෑම විටම බියක් දක්වති. දේව නියෝජිතයාගේ පැමිණීමත් සමඟ දේශපාලන අධිකාරීන් කැළඹිල්ලකට පත් වෙති.

බෙත්ලෙහෙමේ උපන් ජේසු බිළිඳාට ගරු බුහුමන් දැක්වීම සඳහා පැමිණි මෙම ශාස්ත්‍රවන්තයන්ගේ නම් මොනවාද යන්න ගැන පවතින ආදීතම සම්ප්‍රදාය අපට ලැබෙන්නේ සිරියාවෙන් ය. ක්‍රි.ව. හයවන ශත වර්ෂයේ සිරියානු භාෂාවෙන් ලියැවුනු "සම්පත් ගුහාව" යන කෘතියේ ඔවුන් පැමිණි දේශයන් සහ නාමයන් ගැන අපට දැනගත හැකිය. එනම් පර්සියාවේ රජ වූ හෝර්මිස් දා, සෙබා හි රජ වූ යස්ඩෙගර්ඩ්, ෂෙබා හි රජ වූ පෙරෝසද් යනාදි වශයෙනි.

# පැවිදි වරයේ රජත ජයන්තිය සමරයි



**ගරු මේරි ශිරෝමි බොතේජු පැවිදි සොයුරිය බෝපිටිය මීසමට අයත් තියබෝල්ඩ් බොතේජු සහ කොන්සි මෙරායා යුවළට දාව 1964. 05. 28 වන දින මෙලොව උපත ලැබුවාය.**

වැඩිමහල් සහ බාල සොහොයුරියන් දෙදෙනකු සහිත පවුලෙන් මද්දුම දෝනි වූ එතුමිය 1987.12.22 දින යහපත් එඬේරා නිකායේ ප්‍රථම වේදහාර පොරොන්දුව ද 1992. 12. 22 දින සදාකාලික වේදහාර පොරොන්දුව ද දුන්නාය.

මුන්නක්කරය, වහකෝට්ටේ, ගම්පළ ළදරු පාසල් සේවය ද, දියලගොඩ පැවිදි හවුල භාරවද, නායකකන්ද ළමා නිවාසය භාරව ද, සාන්ත ඇග්නස් කන්‍යාරාමයේ වැඩිහිටි සොයුරියන්ට උදව් වීම ද ඉතාමත් කැපවීමෙන් සහ ආශාවෙන් යුතුව ඉටු කළාය. වැල්ල පල්ලිය මීසම් සේවය හා දේවධර්මාචාර්ය උපාධිය ද ඇය සතුවන්නීය.

වර්තමානයේ මහනුවර කටුගස්තොට ශාන්ත අන්තෝනි බාලිකා විදුහලේ කතෝලික ධර්මය විෂය භාරව කටයුතු කරයි. කටුගස්තොට ශ්‍රී හෘදයේ දේවස්ථානයේ දහම් පාසලේ ඉගැන්වීම් කටයුතු ද කරන අතර වැඩිහිටි අධ්‍යාපනය ලබා දීම ද සිදු කර දෙසැම්බර් 22 වන දින කටුගස්තොට කන්‍යාරාමයේ ද දෙසැම්බර් 27 වන දින කට්ටුව සා. ප්‍රැන්සිස් ද සාලිස් මුනි දෙව්මැඳුරේ ද තුති පිදීමේ දිව්‍ය පූජා යාගය සිදුකළ අතර, නිහඬව මහඟු සේවයක් ඉටු කරන එතුමියට වඩාත් කැප වූ සේවාවකට ප්‍රදීප සුබාසිරි!

## අගරදගුරු පදවි බයිබල් කොමිසම

අගරදගුරු පදවි බයිබල් කොමිසමේ රැස්වීම ජනවාරි 18 ප.ව. 4.30 ට ඇක්වයිනස් සරසවියේ කාදිනල් කුරේ ශ්‍රවණාගාරයේ දී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන බව අගරදගුරු පදවි බයිබල් අපෝස්තලික සේවාවේ අධ්‍යක්ෂ ගරු දොන් ඇන්ටන් සමන් හෙට්ටිආරච්චි පියතුමා නිවේදනය කරයි.

ක්‍රිස්තියානි දහම ගැන ඉතියෝපියානු භාෂාවෙන් ලියැවී ඇති "ආදම් සහ ඒවගේ පොත" යන්නෙහි ඔවුන්ගේ නම් මෙසේ සඳහන් වේ. හෝර්, පර්සියානුන්ගේ රජ, බසනාතර් - සබා හි රජ, කර්සූඩාන් - පෙරදිග හි රජ.

රෝමානු කතෝලික සම්ප්‍රදායට අනුව එම ශාස්ත්‍රවරුන්ගේ නාමයන් ලෙස සැලකෙන්නේ, බල්තසාර්, මෙල්කියෝර් සහ ගැස්පාර් යනාදියයි. (මෙම නාමයන් මම ඉතා කුඩා අවධියේ අපේ ආච්චි අම්මාගෙන් අසා දැන සිටියෙමි) මෙම නාමයන් අපට ලැබී ඇත්තේ ක්‍රි.ව. හයවන ශත වර්ෂය තුළ දී ලතින් භාෂාවට පරිවර්තනය වූ " Excerpta Latina Barbari" නම් වංශාවලියකින් ය. මෙහි සඳහන් ගැස්පාර් නමැත්තා කළු ජාතිකයෙක් ලෙස ද සලකනු ලබයි. එම ශාස්ත්‍රවන්තයන් එක් කෙනෙක් ඉන්දියාවෙන් පැමිණි බවටත් ජනප්‍රවාදයක් පවතී.

මෙම කරුණු කාරණා කෙසේ වුවත් එක දෙයක් පැහැදිලිය. එනම් ඔවුන් ජුදා නොවන ජාතින් නියෝජනය කරන්නන් ලෙසත්, එම ජාතින්ගේ සංස්කෘතික විවිධත්වය නියෝජනය කරන්නන් ලෙසත් අපට අවබෝධ කර ගත හැකිය. එම ශාස්ත්‍රවන්තයන්ගේ සැබෑ ස්වාමියා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. ඔවුන් අසන ප්‍රශ්නය දෙස ඉතා ඉවසීමෙන් බලන්න; "ජුදෙව්වරුන්ට රජ ව උපන් උතුමාණෝ කොතැන්හිද?" (මතෙව් 2: 2)

ශාස්ත්‍රවන්තයන්ගේ හදවත් සැබවින්ම තෘප්තියට පැමිණෙන්නේ ඒවා ක්‍රිස්තුන් වහන්සේ තුළ සැතපෙන විට පමණි. ඔවුන්ගේ හදවත් ද දෙවියන් වහන්සේ මවා ඇත්තේ උන්වහන්සේ සඳහා ය; "අපි එතුමාණන්ගේ තාරකාව පෙරදිග දී දැක, එතුමාණන්ට නමස්කාර කරන පිණිස ආවෙමු." (මතෙව් 2:2)

## කන්‍යාවකට දරුවකු ... 12 පිටුවෙන්

මෙතරම් ශුද්ධවත්වූ උපතක් මේ වන විට හුදු ආටෝපයටත්, බාහිර සැරසිල්ලටත් විකාර ලෙස වානිජකරණයටත් බිළිඳීම නත්තලේ ආධ්‍යාත්මික පැත්තට හානියකි.

ළදරු සභා අවධියේ නත්තලක් පැවැත්වූයේ නැත. මුල් කිතුනු සංඝය ජේසුගේ මහිමාන්විත දෙවැනි ගමන අපේක්ෂාවෙන් සිටියහ. අද සහශ්‍ර දෙකකට පසු ඒ ගමනේ බලාපොරොත්තුව අප තුළ කොතරම් තිබිය යුතු ද? අද නත්තල ජේසුගේ තේජස්බර පුනරාගමනට පෙරහුරුවක් සූදානමක් විය යුතුයි. අපේ යාච්ඤාව විය යුත්තේ "මරනාථා" එනම් "ජේසුනි හනික වැඩිය මැනවි" යන්නයි. ජේසු සමිඳුන්ගේ මහිමාන්විත පුනරාගමනයට නත්තල ප්‍රවේශයක් කරගනිමු.




**පසුගියදා මාරවිල ව්‍යාපාරික සංසදය මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මහවැව වෙළඳ සංගමය එක්ව මාරවිල නගරයේ සිට මහවැව දක්වා නත්තල් කලාපයක් ලෙස නම් කළ අතර ගවලෙන තරගයක් හා නත්තල් කැරොල් ප්‍රසංගයක්ද සංවිධානය කරන ලදී. ගරු පියතුමන්ලා ගරු පැවිදි සොයුරියන් හා ප්‍රදේශයේ විශාල පිරිසක් මේ සඳහා එක්වූ අතර ජීවමාන ගවලෙනහි සහ ඉංග්‍රීසි බසින් ගායනා කරන ලද කැරොල් ප්‍රසංගයේ අවස්ථාවක් මෙහි දැක්වේ. (ශ්‍රියාංගණී ෆිලීෂියා)**

# පැවිදි දිවියේ 50 වසර සමරයි



**කුඩාපයාගල මිසමට අයත් ගරු මේරි මර්සි පෙරේරා පැවිදි සොයුරිය පැවිදිවරයේ ස්වර්ණ ජයන්තිය සැමරුවාය.**

බී. එල්. පෙරේරා හා රෙජිනා පෙරේරා යුවළට දාව 1931 සැප්. 30 වන දින මෙලොව එළිය දුටු එතුමිය දරුවන් තිදෙනකු ගෙන් යුත් පවුලේ එකම දියණිය වූවාය. තම අධ්‍යාපනය කළුතර ශු. පවුලේ කන්‍යාරාමයේ හැදෑරූ එතුමිය දේව හඬට සවන් දෙමින් බෝලවලාන කන්‍යාරාමයට ඇතුළු වී 1952 දෙසැ. 21 වන දින තම පළමු වේදහාර ගත්තාය.

කඳාන සා. සෙබස්තියන් බාලිකා මහ විදුහලේ, මීගමු සාන්ත පීතර විදුහලේ ඉගැන්වීමේ යෙදී පසුව පානදුරේ ශාන්ත අන්තෝනි බාලිකා මහ විදුහලේත්, නායකකන්ද යහපත් එඬේරා බාලිකා විදුහලේත්, විදුහල්පති ධූර දරා 1991 විශ්‍රාම ගත්තාය. ඉන්පසු මාරවිල, වැලිවේරිය, පල්ලියවත්ත කන්‍යාරාමවල සේවය කර දැන් නායකකන්ද යහපත් එඬේරා කන්‍යාරාමයේ සැඳෑ සමය ගත කරන්නීය. දෙසැ. 20 දා නායකකන්දේ සිය ස්වර්ණ ජයන්තිය සැමරූ එතුමියට ප්‍රදීප සුබාසිරි

# තානාපති හිමිපාණන් බැහැදැකී




**එ.ජා.ප. නියෝජ්‍ය මහලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර ජයලත් ජයවර්ධන නොබෝදා කොළඹ 07 වතිකාන තානාපති කාර්යාලයේදී සිය බිරිඳ උජිතා ජයවර්ධන සහ දරුවන් වන මෑතකදී වෛද්‍යවරුන් ලෙස එම්.බී.බී.එස් උපාධි ලබාගත් කවින්ද ජයවර්ධන සහ වින්ද්‍යා ජයවර්ධන මෙනවිය සමග ශ්‍රී ලංකාවේ වතිකාන තානාපති අති උතුම් ජෝශප් ස්පෙටේරි අගරදගුරු හිමිපාණන් බැහැ දැක උන්වහන්සේගේ ආශිර්වාදය ලබාගත් අවස්ථාව.**



**නත්තල නිමිත්තෙන් පේරලන්ද මීසමේ සාන්ත වින්සන් ද පාවුලා කොන්ෆරන්සය මගින් රු. 25000/- ක් පමණ වටිනා වියලි ආහාර මීසමේ තෝරාගත් ආර්ථික අසීරුතා වලින් පෙළෙන පවුල් 12 කට බෙදා දීම මීසම් සේවක ගරු ලියනගේ පැට්රික් පෙරේරා නි.ම.නි. පියතුමාගේ ප්‍රධානත්වයෙන් පේරලන්ද ශු. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ මීසම් ගෘහයේ දී සිදු කෙරිණි. එහිදී ගරු ෆිලීෂියන් ප්‍රදිනාන්දු නි.ම.නි. පියතුමා අතින් කාන්තාවක් වියළි ආහාර අසුරනය ලබා ගත් අයුරු ඡායාරූපයෙන් දිස්වේ. (සී.ආර්. ඩික්සන් ඇන්ටනි)**

# නත්තල් ප්‍රීතිය බෙදා ගැනීමක්



**මොරටු දිසාවට අයත් දිව්‍ය හෘදය සමිති සාමාජිකාවෝ මෙවර නත්තල් ප්‍රීතිය බෙදාගත්තේ "මාර්ක් ශ්‍රී" හි වැඩිහිටියන් සහ ග්‍රේස් කුමරි නිවසේ දරුවන් සමගය. වියළි ආහාර ද්‍රව්‍ය ඔවුන්ට පරිත්‍යාග කළ අතර නැටුමෙන් ගැයුමෙන් ඔවුන්ව සතුටට පත් කළහ. මේ අවස්ථාවට එහි අධ්‍යක්ෂ ගරු ලෙස්ටර් විජේසූරිය පියතුමා ද එක්විය.**

**මොරටු මීසම් සහයක ගරු රන්ජන් ප්‍රනාන්දු පියතුමා සහ සාමාජිකාවන් පනස්දෙනෙක් පමණ මේ ගමනට සහභාගි වූහ. (ඩොරින් පෙරේරා)**